HARTI

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT

2021



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ஹெக்டர் கொப்பேகடுவ கமநல ஆராய்ச்சி, பயிற்சி நிறுவகம்

Hector Kobbekaduwa Agrarian Research and Training Institute

HARTI
වාර්ෂික වාර්තාව 2021



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

	පිටුව
01. අප ගැන, දැක්ම හා මෙහෙවර	iv
02. පාලක මණ්ඩලය	v
03. විගණන හා කළමනාකරණ කමිටුව	viii
04. පර්යේෂණ හා පුහුණු කමිටුව	ix
05. විශේෂ අවස්ථා	xii
06. සභාපතිතුමාගේ පණිවුඩය	xx
07. අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය	xxi
08. ආයතන වශූහය	xxii
09. ජයග්‍රහණ, අභියෝග, ඉදිරි ඉලක්ක	xxiii
10. කාර්යසාධක දර්ශක	xxiv
11. පර්යේෂණ	2
11.1 ග්‍රාමීය සංවර්ධන	4
11.2 පරිසර	16
11.3 ආහාර පද්ධති	23
11.4 කෘෂිකාර්මික අලෙවි තොරතුරු ව්‍යාපෘතිය	48
12. පුහුණු වැඩසටහන්	50
13. ප්‍රකාශන	53
14. බාහිර හවුල්කාරීත්වයන්	
14.1 හවුල්කාරී පර්යේෂණ	57
14.2 හවුල්කාරී පුහුණු වැඩසටහන්	58
14.3 අවබෝධතා ගිවිසුම්	58
15. පුහුණු කිරීම් සහ ධාරිතා සංවර්ධන	
15.1 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්වය	59
15.2 කාර්ය මණ්ඩල පුහුණු කිරීම්	60
16. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	61
17. ඉදිරි වර්ෂ සඳහා සූදානම	
17.1 පර්යේෂන අංශ ප්‍රතිව්‍යූහගතකරණය	66
17.2 නියමුවන් - පර්යේෂණ අංශ ප්‍රධානීන්	67
18. මූල්‍ය වාර්තා	68
19. ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාර විගණකාධිපතිගේ වාර්තා	82
20. ජාතික විගණන පනතේ 12 වගන්ති ප්‍රකාර විගණකාධිපතිගේ පිළිතුරු	89



අප ගැන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. 1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනතින් එය ස්ථාපිත කර ඇත.

ප්‍රතිපත්තිමය කේන්ද්‍රීමය පර්යේෂණ දිරිගැන්වීම, කෘෂිකාර්මික හා ග්‍රාමීය ක්ෂේත්‍රයන්හි පුහුණු අවශ්‍යතා සැපිරීම අප ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු වේ.

මෙරට කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස ආරම්භයේ සිට මේ දක්වා වසර 49ක් තිස්සේ සමාජ ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් සිදු කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සැපයීමෙන් ලද අත්දැකීම්වලින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පොහොසත්ය.

දැක්ම

ගොවිජන හා ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම

මෙහෙවර

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම

පාලක මණ්ඩලය - 2021

සුමේධ පෙරේරා මහතා ඩබ්.ඩබ්.වී ආර්.ඩබ්.පී. ආර්.එස්.පී - යූ.එස්.පී එන්.ඩී.යූ මේජර් ජෙනරාල් (විශ්‍රාමික)	-	ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය පාලක මණ්ඩල සභාපති (2021 පෙබ:)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ.ජයසිංහ	-	ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය පාලක මණ්ඩල සභාපති (2021 මාර්තු)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා	-	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි (2021 ජනවාරි සිට පෙබ:)
මාලින්ද සෙනෙවිරත්න මහතා	-	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි (2021 මාර්තු සිට)
ආචාර්ය ඩබ්.එම්.ඩබ්.වීරකෝන්	-	පාලක මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ ජෙනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (2021 පෙබ: සිට අගෝස්තු)
ආචාර්ය එස්.එච්.ඒ ද සිල්වා	-	පාලක මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ ජෙනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ජී.ඩී.කීර්ති ගමගේ මහතා	-	පාලක මණ්ඩල සාමාජික ඉඩම් කොමසාරිස් ජෙනරාල් ඉඩම් කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුව (2021 පෙබ: සිට)
ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා	-	පාලක මණ්ඩල සාමාජික කොමසාරිස් ජෙනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (2021 පෙබ: සිට)
ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා	-	පාලක මණ්ඩල සාමාජික කොමසාරිස් ජෙනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (2021 මාර්තු සිට)
ඉංජිනේරු නිහාල් සිරිවර්ධන මහතා	-	පාලක මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ ජෙනරාල් වාරිමාර්ග වාරිමාර්ග දෙපාර්තමේන්තුව (2021 පෙබ: සිට)

සුවින්ද එස්. සින්ගප්පුලි මහතා	-	පාලක මණ්ඩල සාමාජික සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සහ සමූපකාර සමිති ලේඛකාධිකාරි සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (2021 පෙබ: සිට ඔක්තෝම්බර්)
ජී. එන්. ලියනාරච්චි මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සහ සමූපකාර සමිති ලේඛකාධිකාරි සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (2021 නොවැම්බර් සිට)
ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න	-	පාලක මණ්ඩල සාමාජික ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ සහකාර නියෝජිත (වැඩසටහන්) ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (2021 පෙබරවාරි සිට)
පී. මාලනී මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික අතිරේක ලේකම් (කෘෂිකාර්මික තාක්ෂණය) කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (2021 මාර්තු සිට)
කේ.පී. කරවිට මහතා	-	පාලක මණ්ඩල සාමාජික අතිරේක ලේකම් (කෘෂිකාර්මික සංවර්ධනය - 01) කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (2021සැප්තැම්බර් සිට)
පුබුදිකා එස්. බණ්ඩාර මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) ඉඩම් අමාත්‍යාංශය (2021 මාර්තු සිට)
ආර්.පී.ආර්. රණසිංහ මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ (ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ) ඉඩම් අමාත්‍යාංශය (2021 අගෝස්තු සිට)
ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙනවිය	-	පාලක මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ (වැඩ බලන) මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය (2021 පෙබරවාරි සිට)
අරුණි එස්. රණසිංහ මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික අතිරේක ලේකම් (පාලන) වැවිලි අමාත්‍යාංශය (2021 පෙබරවාරි සිට)

බී.එල්.ඩී. බාලසූරිය මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂිකර්මය සහ පරිසරය) අධ්‍යාපන අමාත්‍යාංශය (2021 පෙබරවාරි සිට)
ආර්.එම්.සී.එම්. හේරත් මහත්මිය	-	පාලක මණ්ඩල සාමාජික අතිරේක ලේකම් (ඉඩම් සහ නීතිය) වාරිමාර්ග අමාත්‍යාංශය (2021 මාර්තු සිට)
ගිල්මා දහනායක මෙනවිය	-	පාලක මණ්ඩල සාමාජික සහකාර ලේකම්, වෙළඳ අමාත්‍යාංශය (2021 පෙබරවාරි සිට)
ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර	-	පාලක මණ්ඩල සාමාජික අතිරේක ලේකම්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව (2021 පෙබ: සිට 2021 ඔක්:)
මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර	-	පාලක මණ්ඩල සාමාජික පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය (2021 පෙබ: සිට 2021 නොවැ:)

පාලක මණ්ඩල රැස්වීම් - 2021

	රැස්වීම් පැවති දින	සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව
1.	2021 පෙබරවාරි 08	14
2.	2021 මාර්තු 30	17
3.	2021 අගෝස්තු 03	18
4.	2021 සැප්තැම්බර් 14	19
5.	2021 ඔක්තෝම්බර් 12	18
6.	2021 නොවැම්බර් 30	18

විගණන හා කළමනාකරණ කමිටුව

විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙනවිය (සභාපති)	-	**අධ්‍යක්ෂ (වැඩ බලන)** **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව** **මුදල් අමාත්‍යාංශය**
ගිල්මා දහනායක මෙනවිය (සාමාජික)	-	**සහකාර ලේකම්, වෙළඳ අමාත්‍යාංශය**
අරුණි එස්. රණසිංහ මෙනවිය (සාමාජික)	-	**අතිරේක ලේකම්, වැවිලි අමාත්‍යාංශය**
එස්.ඒ.ඩී.එන්. පෙරේරා මෙනවිය (නිරීක්ෂක)	-	**විගණන අධිකාරි** **විගණන ජනරාල් දෙපාර්තමේන්තුව**
යූ.එස්.එල්. කුමාර මහතා (නිරීක්ෂක)	-	**ප්‍රධාන අභ්‍යන්තර විගණක** **කෘෂිකර්ම අමාත්‍යාංශය**
ඊ.ඩබ්.ජී.කේ. ප්‍රියදර්ශන මහතා (නිරීක්ෂක)	-	**ප්‍රධාන අභ්‍යන්තර විගණක** **කෘෂිකර්ම අමාත්‍යාංශය** **(2021 අගෝස්තු සිට)**

විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් - 2021

පැවති රැස්වීම් ගණන	05
රැස්වීම් පැවති දින ගණන	2021 ජනවාරි 22
	2021 පෙබරවාරි 25
	2021 අගෝස්තු 13
	2021 ඔක්තෝම්බර් 29
	2021 දෙසැම්බර් 16

පර්යේෂණ හා පුහුණු කමිටුව

පර්යේෂණ හා පුහුණු කමිටුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කටයුතු නිසි ලෙස නියාමනය කිරීමෙහිලා මුඛ්‍ය කාර්යභාරයක් ඉටුකරයි. ප්‍රවීන ශාස්ත්‍රඥයන්ගෙන් සමන්විත පර්යේෂණ හා පුහුණු කමිටුව විවිධාකාරයෙන් ආයතනයේ ශාස්ත්‍රීය කටයුතුවල හැඩය සකස් කර ගැනීම සඳහා සහයෝගය ලබා දෙයි.

ආයතනයේ පර්යේෂණ හා පුහුණු වැඩසටහන්වලට අදාළ ධාරිතා සංවර්ධනයට සහ වැඩි දියුණු කිරීම්වලට අදාළ සියලුම කටයුතු වලට ඒ ඒ පර්යේෂණ හා පුහුණු කමිටුවේ සාමාජිකයින්ගේ නිරීක්ෂණ ලබා ගැනීමේ හිමිකම අප ආයතනයට හිමිව තිබේ. විශේෂයෙන් ආයතනය විසින් ගොඩනංවනු ලබන සියලුම පර්යේෂණ යෝජනා පර්යේෂණ හා පුහුණු කමිටුව විසින් නම් කරන කණ්ඩායමක් විසින් එක් එක් අධ්‍යයනයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥභාවය හිමි සාමාජිකයින් විසින් විමර්ෂණය කරනු ලැබේ.

පර්යේෂණ හා පුහුණු කමිටුවේ කාර්යභාරය වන්නේ,

1. ආයතනයේ පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ, යෙදවුම් සහ විශේෂඥ දැනුම ලබාදීම.
2. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ පර්යේෂකයින් විසින් ඉදිරිපත් කරන පර්යේෂණ යෝජනාවලි විමර්ෂණය කිරීම සහ අනුමත කිරීම.
3. දැනට සිදුකරමින් පවතින පර්යේෂණ ව්‍යාපෘතීන්හි සහ පුහුණු වැඩසටහන්හි ප්‍රගතිය විමර්ශනය කිරීම.
4. පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට පෙර පර්යේෂණ වාර්තා කෙටුම්පත් අධ්‍යයනය කිරීම, නිරීක්ෂණය කිරීම සහ යෝජනා ඉදිරිපත් කිරීම තුළින් ඒවා වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම.
5. ආයතනයේ පුහුණු ක්‍රියාකාරකම් විමර්ෂණය කිරීම සහ ඇගයීම.

අනු අංකය	නම	තනතුර / ආයතනය
01	ගෞරවනීය මහාචාර්ය විජිතපුර විමලරත්න හිමි	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව කලා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
02	මහාචාර්ය එල්.එම්. අබේවික්‍රම	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කෘෂිකාර්මික ආර්ථික සහ ව්‍යාප්ති දෙපාර්තමේන්තුව කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය
03	එම්.එම්.එම්. අභියර් මහතා	පර්යේෂණ නිලධාරි ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය
04	මහාචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
05	මහාචාර්ය එන්.ඩී.කේ. දයාවංශ	මහාචාර්ය කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව කෘෂිකාර්මික පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
06	ආචාර්ය පී.බී. ධර්මසේන	ප්‍රධාන විද්‍යාඥ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය
07	දිලීපා එම්. ඇදගමගේ මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
08	ආචාර්ය ඒ.පී.එස්. ප්‍රනාන්දු	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කෘෂිකාර්මික පද්ධති දෙපාර්තමේන්තුව කෘෂිකාර්මික පීඨය, රජරට විශ්ව විද්‍යාලය

09	ආචාර්ය ෆ්‍රැන්ක් නිරංජන්	උපදේශක හිටපු අතිරේක අධ්‍යක්ෂ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිත්ති සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය
10	ආචාර්ය ෆ්‍රෙඩ්රික් අබේරත්න	උපදේශක හිටපු කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
11	මහාචාර්ය එච්.එම්. ගුණතිලක	උපදේශක හිටපු අධ්‍යක්ෂ (පරිසරය සහ ආරක්ෂිත ආරක්ෂක
12	මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
13	මහාචාර්ය කේමින්ද හේරත්	මහාචාර්ය කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව කෘෂිකර්ම හා වැවැලි කළමනාකරණ පීඨය වයඹ විශ්ව විද්‍යාලය
14	ආචාර්ය පී.එච්.ඒ.පී.සී. ගිරිහගම	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිත්ති සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය
15	මහාචාර්ය මංජුල පී. සුමිත් මාගමගේ	මහාචාර්ය පශු සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය සබරගමුව විශ්ව විද්‍යාලය
16	ඉංජිනේරු ඩී.ඩී. ප්‍රභාත් විතාරණ	උපදේශක හිටපු ප්‍රධානී - ජල කළමනාකරණ අංශය කෘෂිකාර්මික සංවර්ධන දෙපාර්තමේන්තුව
17	මහාචාර්ය ඩී.වී.පී. ප්‍රසාද	මහාචාර්ය කෘෂිකර්ම ආර්ථික හා ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
18	මහාචාර්ය ප්‍රසාන්ති ගුණවර්ධන	මහාචාර්ය වන හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
19	ආචාර්ය ප්‍රියංග දුණුසිංහ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව කලා පීඨය කොළඹ විශ්ව විද්‍යාලය
20	ආචාර්ය එල්.පී. රූපසේන	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කෘෂිකර්ම පද්ධති දෙපාර්තමේන්තුව කෘෂිකර්ම පීඨය රජරට විශ්ව විද්‍යාලය
21	ආචාර්ය කේ. සූරියකුමාර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කෘෂිකර්ම ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව කෘෂිකර්ම පීඨය, යාපනය විශ්ව විද්‍යාලය
22	ආචාර්ය එම්. සමාඩ්	උපදේශක හිටපු ප්‍රධානී - දකුණු ආසියා කාර්යාලය ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය
23	මහාචාර්ය එච්.එම්. සමන් කේ. හේරත්	මහාචාර්ය පීඨාධිපති සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
24	ආචාර්ය ශාන්ත විජේසිංහ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

25	ආචාර්ය තිවහාරි ගෙරෙතරන්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කෘෂිකාර්මික ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව කෘෂිකර්ම පීඨය නැගෙනහිර විශ්ව විද්‍යාලය
26	මහාචාර්ය ටියුඩර් සිල්වා	සම්මානනීය මහාචාර්ය සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය
27	ආචාර්ය ඩී.බී.ටී.විජේරත්න	සහකාර නියෝජිත (එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය)


විශේෂ අවස්ථා - 2021



2021 ජනවාරී - අලෙවි තොරතුරු ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම



පෙබරවාරී - මාලින්ද සෙනෙවිරත්න මහතා අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ බාර ගැනීම



2021 මාර්තු - ගොවි ජනතා සඟරාවේ 2021 ජනවාරි - මාර්තු කලාපය ප්‍රකාශයට පත් කිරීම



2021 අප්‍රේල් - ඉහළ - 2021 අප්‍රේල් - අවුරුදු උත්සවයට සමගාමීව සියලු කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පැවති ක්‍රීඩා උත්සවය - පහළ - අලෙවි ආහාර හා කෘෂිව්‍යාපාර අංශය විසින් 'කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ දී අලෙවි තොරතුරු භාවිතය පිළිබඳ' බදුල්ලේ දී පැවති පුහුණු වැඩසටහන





2021 මැයි - 'ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය' පිළිබඳ වාර්තාව විමර්ශනය කිරීමෙන් අනතුරුව සකස් කළ විශේෂ වාර්තාව



2021 ජූනි - ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතින් අධ්‍යයනයට අදාළව ඊට සම්බන්ධ විවිධ පාර්ශ්වකරුවන් ඒකරාශි කොට zoom තාක්ෂණය ඔස්සේ පැවැත් වූ විද්වත් සාකච්ඡාව



2021 ජූලි - වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් හමු වීම



2021 අගෝස්තු - ආහාර බෝග වගාවන්ට වන සතුන්ගෙන් සිදුවන හානි සහ පොලිතින්, ප්ලාස්ටික් භාවිතය පිළිබඳ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණ දෙකක වාර්තා පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාට සහ අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා වෙත පිළිගැන්වීම



දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ 38 වැනි ගුණානුස්මරණය



2021 සැප්තැම්බර් - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් වීමෙන් පසු කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා ආයතනයේ කාර්ය මණ්ඩලය සමඟ පැවති සාකච්ඡාව



2021 ඔක්තෝබර් - එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) අතර පෙර සහයෝගීතාවයක් මත 'ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහල් නිෂ්පාදනය කෙරෙහි වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්හි බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම' නමින් අධ්‍යයනයක් ආරම්භ කිරීම



2021 නොවැම්බර් - කෘෂි ව්‍යාපාර සංකල්ප භාවිතය සහ අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ වැඩමුළුව



වර්ල්ඩ් විෂන් ලංකා (World Vision Lanka) ආයතනය විසින් පිරිනැමූ 'ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාවය සහ දේශගුණික-අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය' සඳහා වන රුපියල් මිලියන 11ක පර්යේෂණ මූල්‍ය අරමුදල තරඟකාරී ලෙස දිනාගැනීමට හැකිවීම



2021 නොවැම්බර් - ගොවිමිණ ජාතික පුවත්පත එළිදැක්වීම සහ Govimina.lk වෙබ්අඩවිය එළිදැක්වීම



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ සබරගමුව විශ්ව විද්‍යාලය අතර අධ්‍යයන හා විද්‍යාත්මක වැඩසටහන්/ව්‍යාපෘති සඳහා සහයෝගීතාවය පිණිස අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

සභාපතිතුමාගේ පණිවුඩය

මෙරට කෘෂි කර්මාන්තයේ උන්නතිය උදෙසා සිය මෙහෙවර ඉටුකරන රාජ්‍ය ආයතනයන් අතර හෙක්ටර් කොඩිබෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ මන්දයත්, සමාජ ආර්ථික පර්යේෂණයන් තුළින් එක්රැස් කොට ගන්නා දත්තයන් හා ඒ ඔස්සේ ගොඩනහන පර්යේෂණ වර්තාවන් මෙරට කෘෂිකර්මාන්තය හා සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන නිසාවෙනි.

ජනාධිපතිතුමන්ගේ හරිත කෘෂිකාර්මික වැඩසටහන සාර්ථක කර ගැනීම උදෙසා කොවිඩ් 19 වසංගතය හමුවේ වුව, තම ආයතනයෙන් ඉටුවිය යුතු කාර්යභාරය නිවැරදිව හඳුනාගනිමින් ඒ උදෙසා සිය දායකත්වය මැනවින් සපයා ඇති ආකාරය පිළිබඳව, මෙම වාර්ෂික වාර්තාව අපට සාක්ෂි සාධක සපයයි. ඒ අතර 'කාබනික ගොවිතැන වෙත යොමුවීම: ඉදිරි ගමන සඳහා ගැටලු, අභියෝග සහ යෝජනා' යන මැයෙන් සකස් කොට ඉදිරිපත් කරන ලද වාර්තාව, 'කාබනික කෘෂිකර්මාන්තයට යොමු වීම' සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මාර්ග සිතියම සහ 'ගොවිමිණ' කෘෂිකර්ම ජාතික පුවත්පත ආදිය මෙරට හරිත කෘෂිකර්මාන්තයේ සාර්ථකත්වය උදෙසා මනා දායකත්වයක් සපයන බව නොඅනුමානය.

ගෙවී ගිය වසරේ දී මෙන්ම මේ වසරේදීත්, මෙරට කෘෂි කර්මාන්තයේ වර්ධනය උදෙසා හෙක්ටර් කොඩිබෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ස්වකීය දායකත්වය නොමඳව ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.

ලේකම්

කෘෂිකර්ම අමාත්‍යාංශය

අධ්‍යක්ෂතුමාගේ පෙරවදන



දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව මුළු මහත් ලෝකයටම වඩාත්ම අභියෝගාත්මක වර්ෂය **2021** වීමට ඉඩ ඇත. කොවිඩ් **19** වංසගත තත්ත්වය හේතුවෙන් ව්‍යාප්ත වූ කම්පනයට හා සංරෝධකයන්ට ගොදුරු නොවූ මහද්වීපයක්, රටක්, සමාජයක් හෝ නිවසක් නොවිණි. කෙසේ වුවත් **2021** දීර්ඝ කාලයකට පසුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතිෂයින් ඵලදායී වසරක් වූ බව සඳහන් කළ යුතුය.

රජයේ හෝ පුද්ගලික අංශයේ සියලුම ආයතන මෙන්ම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ද වර්ෂය තුළ දෙවරක් සම්පූර්ණයෙන්ම වසා දැමීමට සිදු වූ මුළු කාලය මාස හතරක් විය. එසේම වරින් වර තවත් සති ගණනාවක් ක්‍රියාත්මක වන්නට සිදු වූයේ ඉතාම සීමිත සේවක සංඛ්‍යාවකගේ දායකත්වයෙනි. එහෙයින්ම මෙම වාර්තාව මගින් සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණයන් වඩාත්ම වැදගත් බවට පත්වේ.

2021 වර්ෂය සඳහා සැලසුම් කරන ලද සියලුම පර්යේෂණ ව්‍යාපෘති වර්ෂය තුළ ම සම්පූර්ණ කරනු ලැබිණි. එසේම පර්යේෂණ කණ්ඩායමේ කැපවීම හා කාර්යක්ෂමතාව හේතුවෙන් පර්යේෂණ වාර්තා **17**ක් සම්පූර්ණ කර ප්‍රකාශයට පත් කිරීමට හැකි විය. ඒ අතරින් ඇතැම් පර්යේෂණ වාර්තා **2015** වර්ෂයේ සිට සම්පූර්ණ කිරීමට නොහැකිව පැවැති ඒවා විය. මේ සියල්ල කරනු ලැබුවේ වෙළඳපාළ මිල ගණන් දෛනිකව රැස්කිරීම, ඒවා සතිමය පදනමක් මත සම්පූර්ණ කර මාසික විශ්ලේෂණයක් ද නිකුත් කිරීමට කටයුතු කරන අතරය. එසේම රජයේ ආයතන හා පුද්ගලයින් විසින් දත්ත, විශ්ලේෂණ සහ සමාලෝචන වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම්වලට විස්තරාත්මක සහ ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට ද අප ක්‍රියාත්මක විය. සැම විටම එය එසේ විය.

වසර ආරම්භයේදී විශේෂඥයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් 'ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පිළිබඳ කෙටුම්පතක් සංවර්ධනය කරනු ලැබිණි. මෙම ලේඛනය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂකයින් විසින් සම්පාදනය කරන ලද අතර එය එම කමිටුව වෙත මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නිලධාරීන් වෙත ද ලබාදීමට කටයුතු කෙරිණි. සැබවින්ම ඉහත කෙටුම්පත තුළ අන්තර්ගතව පැවැති බොහෝ කාරණා එහි අන්තර්ගත සියලුම අංශ සම්බන්ධයෙන් මෙන්ම අප ආයතනය මගින් පසුගිය කාලය පුරා සිදුකර තිබූ පර්යේෂණ නිගමන හා සම්පාත වීම විශේෂයෙන් ම සඳහන් කළ යුතුය.

2021 වර්ෂය තුළ උද්ගත වූ ක්ෂණික අවධානය යොමු විය යුතු ප්‍රධාන ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම උදෙසා පර්යේෂණ හා සහාය කාර්ය මණ්ඩලය කරන ලද කාර්යභාරය ද ඉතා ප්‍රශංසනීය වේ. විශේෂයෙන්ම කෘෂි රසායන තහනම නිවේදනය කිරීමත් සමග මෙම ප්‍රතිපත්ති වෙනසට අදාළ සියලුම අංශ පිළිබඳ සවිස්තරාත්මක සමීක්ෂණ අධ්‍යයනයක් ආයතනය විසින් සිදුකරන ලදි. මෙමගින් ප්‍රධාන පත්‍රිකා දෙකක් සම්පාදනය කරනු ලැබිණි. පළමුවැන්න මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් 'ප්‍රශ්න, අභියෝග සහ උපාය මාර්ග' වශයෙන් සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිකුත් කරන ලද අතර කාබනික පොහොර නිෂ්පාදනය හා සම්බන්ධ සක්‍යතාවයන් හා අභියෝග පිළිබඳ ඉතා වැදගත් තක්සේරුවක් වූ දෙවැන්න **Biomass Inventory** වශයෙන් ප්‍රකාශයට පත්විය. නව ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී මුහුණ පාන්නට සිදුවන පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියක් උදෙසා උත්තර හා තොරතුරු ලබාදීමට ද අප ආයතනය ක්‍රියා කළේය.

එසේම මෙම ප්‍රතිපත්ති වෙනස මගින් අපේක්ෂිත අරමුණු ඵලගැන්වීම උදෙසා ආයතනය විසින් ඉදිරිපත් කරන ලද **'මාස 18ක ඉදිරි මාවත / 18 – month 'Road Map'** ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. ගොවියාගේ ආකල්ප, භාවිතාවන්, ආහාර සංස්කෘතිය සහ චර්යාව, විකල්ප පෝෂක ලබාගත හැකි බව සහ නිෂ්පාදනය කිරීම ඇතුළු කරුණු ගණනාවක් අන්තර්ගත පොළොවේ මුහුණ දෙන යථාර්ථය පෙන්නුම් කරන ප්‍රායෝගික ප්‍රවේශයක් වශයෙන් 'මාස 18ක ඉදිරි මාවත' අත්‍යවශ්‍යයෙන්ම හඳුන්වා දිය හැකිය.

සීමාවේ පවතින වනාන්තර බිම් භාවිතයට ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති තීරණයට අනුව අප ආයතනයේ අධ්‍යයන කණ්ඩායමක් විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ වනාන්තරවල පවත්නා තත්ත්වය පිළිබඳ මූලික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ අතර අප පර්යේෂකයින් විසින් 'ජාතික පරිසර ප්‍රතිපත්තිය' පිළිබඳ කෙටුම්පත ද සමාලෝචනය කරනු ලැබිණ. මෙම ලේඛන නියමිත පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත ඉදිරිපත් කරන ලදි.

ආයතනයේ ප්‍රකාශිත අභිමතාර්ථයන් කාර්යක්ෂමව හා උසස් ම තත්ත්වයෙන් සාධනය කළ හැකි වන පරිදි ආයතනයේ පර්යේෂණ ආකෘති ව්‍යූහය වඩාත් කාර්යාභිමුඛ කිරීම උදෙසා නවීන හා වැදගත් වෙනස්කම් ගණනාවක් ක්‍රියාවට නංවන ලදි. ආයතන අභ්‍යන්තර සාකච්ඡා ගණනාවකට පසුව පර්යේෂණ හා පුහුණු කම්ටුවේ ද අදහස් සැලකිල්ලට ගෙන ආයතනික ක්‍රමෝපායක් සංවර්ධනය කරන ලද අතර පාලක මණ්ඩලය විසින් ද පසුව එය අනුමත කරන ලදි. පර්යේෂණ හා පුහුණු උපකරණ ප්‍රතිව්‍යුහගත කිරීමක් ද එයට ඇතුළත් විය. 'දත්ත කළමනාකරණය' සහ තොරතුරු හා සන්නිවේදනය' වශයෙන් නව ඒකක දෙකක් ස්ථාපිත කරන ලද අතර පළමුවැන්න දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා පර්යේෂකයින්ට වඩාත් ක්‍රමවත් සහයෝගයක් ලබාදීම උදෙසා ද, දෙවැන්න අදාළ වන්නා වූ සියලුම අංශ අතර තොරතුරු සහ දත්ත වේගවත්ව සහ ආකර්ෂණීයව බෙදා හැරීම උදෙසා ද ස්ථාපිත කරන ලදි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් එළිදක්වනු ලබන උසස්, විවිධ විස්තරාත්මක දැනුම ප්‍රතිපත්ති සම්පාදන ක්ෂේත්‍රය වෙත ලබාදීමේ අරමුණ පෙරදැරිව කෘෂිකර්ම පීඨ පවත්නා සියලුම විශ්වවිද්‍යාල සමග සාකච්ඡා මාලාවක් ආරම්භ කරන ලදි. මෙවන් සාමූහික ක්‍රියාකාරීත්වයක වැදගත්කම අවබෝධ කර ගෙන සිටි විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් මෙන්ම පීඨාධිපතිවරුන්ගේ ද ප්‍රශංසාව මෙම වැඩපිළිවෙළට හිමිවිය. ඒ අනුව පේරාදෙණිය, වයඹ, රජරට, නැගෙනහිර, සබරගමුව, රුහුණ, ඌව වෙල්ලස්ස සහ යාපනය යන විශ්වවිද්‍යාල සමග සාකච්ඡා පවත්වන ලදි. සියලුම විශ්වවිද්‍යාල අප ආයතනය සමග අවබෝධතා ගිවිසුම්වලට අත්සන් කිරීමට එකඟත්වය පළ කරන ලදි. ඒ අනුව දීපව්‍යාප්තව පර්යේෂණ සිදු කිරීම සඳහා අප ආයතනය සතු ශක්‍යතාව පුළුල් වන අතර පර්යේෂණ හා පුහුණු සඳහා පුළුල් පරාසයකට අයත් වන්නා වූ ක්ෂේත්‍රයන්හි විද්වතුන්ගේ සේවාව ලබාගැනීමේ හැකියාව ද ලැබිණ. එසේම සමීපව අධීක්ෂණය කරනු ලබන 'අධුනික අධ්‍යයන අවස්ථා / **Internships** ආයතනය විසින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට ලබාදීමට හැකිවන පසුබිමක් ද ස්ථාපිත විය.

කොවිඩ්-19 වසංගත තත්ත්වය විසින් නිර්මාණය කර තිබූ බාධක මධ්‍යයේ පවා පුළුල් පරාසයකට අයත් මාතෘකා ආවරණය වන පරිදි 15කට නොඅඩු පුහුණු වැඩසටහන් පවත්වන්නට හැකිවීම ද මෙම වර්ෂය තුළ අත්කර ගන්නා ලද සුවිශේෂ ජයග්‍රහණයක් වශයෙන් දැක්විය හැකිය.

එසේම කෘෂිකර්මාන්තය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම වෙන් වූ ජාතික පුවත්පතක් ප්‍රථම වරට ප්‍රකාශයට පත්කරනු ලැබීම ද 2021 වර්ෂය තුළ තබන ලද තවත් වැදගත්ම ඓතිහාසික පියවරක් වශයෙන් දැක්විය හැකිය. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද සහයෝගය සහ ආකර්ෂණීය ප්‍රචාරක යාන්ත්‍රණයක් සමග වර්ෂය අගභාගයේදී 'ගොවිමිණ - කෘෂිකර්ම ජාතික පුවත්පත' ප්‍රකාශයට පත්කරන ලදි. 100%ක්ම පෞද්ගලික අංශයේ අනුග්‍රාහක දැන්වීම් මත අවශ්‍ය සියලුම මූල්‍ය ප්‍රතිපාදන ගොවිමිණ පුවත්පත විසින් උපයා ගන්නා ලද හෙයින් එහි පිටපත් 10,000ක් මාසිකව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සෘජුවම ගොවි සංවිධාන වෙත නොමිලේ බෙදා හරිනු ලැබේ.

එසේම ආයතනයේ නිල අන්තර්ජාල අඩවිය, මුහුණුපොත සහ ට්විටර් වැනි සමාජමාධ්‍ය ජාලා රැසක් හරහා දැනුම බෙදා හැරීම උදෙසා ආයතනය මගින් අලුතින් ස්ථාපිත කරනු ලැබූ තොරතුරු හා සන්නිවේදන අංශය සාර්ථකව ක්‍රියාත්මක වී ඇත.

FAO, WFP වැනි ජාත්‍යන්තර සංවිධාන ද **World Vision** වැනි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමග ද සම්බන්ධතා නැවත ගොඩනැංවීමට **2021** වර්ෂය තුළ කටයුතු කරන ලදි. මෙම උත්සාහයන් මගින් ලද ක්ෂණික ප්‍රතිඵල වූයේ එම ආයතනවල පර්යේෂණ, පුහුණු හා සමීක්ෂණ පැවැත්වීම ආයතනය වෙත ලබා ගැනීමට හැකිවීමය. සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ මේ හා සමාන තවත් ආයතන ගණනාවක් සමග අරඹන ලද සාකච්ඡා මාලාවක ප්‍රතිඵලයක් වශයෙන් එම ආයතන සමග සහයෝගීතාවන් ඇතිකර ගනිමින් ඉදිරියේදී ක්‍රියාකාරිත්වය තව දුරටත් පුළුල් කර ගැනීමට හැකිවන අවස්ථා විවෘත වන බවට මට ඇත්තේ දැඩි විශ්වාසයකි.


සියලුම ශ්‍රේණීන්ට අයත් වන්නා වූ සම්පූර්ණ කාර්ය මණ්ඩලයට, ආයතනයට නව ජීවයක් හා ජවයක් ලබාදීම උදෙසා වූ ඔවුන්ගේ කැපවුණු ක්‍රියාකාරිත්වය වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය පුද කිරීමට මෙම අවස්ථාවක් කර ගනිමි. වසර **50**කට පෙර අප ආයතනය ස්ථාපිත කිරීමේ දී පෙරදැරි කරගත් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි ඉදිරියට යා හැකි ශක්තිමත් ආයතනයක් බවට අප ආයතනය පරිවර්තනය කිරීමට ඔවුන්ගේ කැපවීම හේතු වී ඇත.

සංකල්පනයේ සිට වාර්තා එළිදැක්වීම දක්වා පර්යේෂණ කාර්යයන්හි සියලු පියවර අධීක්ෂණය කරන්නා වූ පර්යේෂණ සහ පුහුණු කමිටුව අපගේ ක්‍රියාකාරිත්වය උසස් තත්ත්වයකට පත්කර ගැනීම උදෙසා ඉහළ දායකත්වයක් ලබා දුන්නේය. ආයතනයේ සාධනීය ක්‍රියාකාරිත්වය උදෙසා ලබා දුන් සහයෝගය හා මගපෙන්වීම උදෙසා ආයතනයේ පාලක මණ්ඩලයට ද මාගේ ප්‍රණාමය හිමිවේ.

අවසන් වශයෙන් එළඹෙන අනාගතය තුළ දී ආයතනයේ ඉතිහාසය වෙනස් කළ සන්ධිස්ථානීය වර්ෂයක් ලෙස **2021** සනිටුහන් වනු ඇතැයි යන්න මම විශ්වාස කරමි. අභියෝග පැවතුණ ද ප්‍රගතිය උදෙසා වූ නව වෙනස්කම් හා පර්යේෂණ හා සහාය කාර්ය මණ්ඩලය විසින් විශද කර ඇති නව කැපවුණු ක්‍රියාකාරිත්වය හේතුවෙන් උදාවනු ඇත්තේ දීප්තිමත් අනාගතයක්ය යන්න මාගේ විශ්වාසයයි.

මාලින්ද සෙනෙවිරත්න
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

ආයතන ව්‍යූහය


හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
සංවිධාන ව්‍යූහය
සභාපති සහ පාලක මණ්ඩලය
අධ්‍යක්ෂ
පර්යේෂණ හා පුහුණු කමිටුව
ලේඛකාධිකාරී
අතිරේක අධ්‍යක්ෂ
අංශ ප්‍රධාන කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය
අංශ ප්‍රධාන කෘෂිසම්පත් කළමනාකරණ අංශය
අංශ ප්‍රධාන පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය
අංශ ප්‍රධාන අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය
අංශ ප්‍රධාන මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය
පර්යේෂණ කාර්ය මණ්ඩලය
පරිපාලන කාර්ය මණ්ඩලය
වැඩසටහන් ඒකකය
ප්‍රකාශන ඒකකය
පුස්තකාලයාධිපති
දත්ත සහ තොරතුරු කළමනාකරණ ඒකකය

ජයග්‍රහණ, අභියෝග, ඉදිරි ඉලක්ක

ජයග්‍රහණ

ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකකරණය

ආසියානු කලාපය තුළ ක්‍රියාත්මක වන වඩාත් දියුණු හා විශිෂ්ට තොරතුරු රැස්කිරීමේ ව්‍යාපෘතියක් වන ඩිජිටල් සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය යටතේ අප ආයතනයේ පුස්තකාලය සතු ශාස්ත්‍රීය ග්‍රන්ථ හා විද්‍යුත් ප්‍රකාශන ද සංඛ්‍යාංකකරණය කර තිබේ.

ජාතික විද්‍යා පදනම මඟින් ආරම්භ කරන ලද එම ව්‍යාපෘතිය මඟින් අප ආයතනයේ ප්‍රකාශන ද සංඛ්‍යාංකකරණය කර ඇති අතර http://harti.nsf.ac.lk/ දිගුව මඟින් ඒ සඳහා ප්‍රවේශ විය හැකිය. ඒ තුළින් පර්යේෂණ හා ශාස්ත්‍රීය කටයුතුවල නිරත ආයතනයක් වන අප සතු ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලේඛන විද්‍යුත් ප්‍රකාශන එකතුවක් ලෙස පවත්වාගෙන යාම හා මාර්ගගත ප්‍රවේශය මඟින් ඉක්මනින් ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සලසයි.

'ගොවිමිණ' කෘෂිකාර්මික ජාතික පුවත්පත සහ ගොවිමිණ.lk වෙබ්අඩවිය එළි දැක්වීම

කෘෂිකර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට මග කියන ප්‍රමුඛතම ජාතික ආයතනය වශයෙන් හෙක්ටර් කොඩ්බකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ජනනය කරන දැනුම, දත්ත, තොරතුරු නිසි පරිදි සන්නිවේදනය කර ජනගත කිරීමේ අරමුණින් 'ගොවිමිණ' නමින් කෘෂිකාර්මික ජාතික පුවත්පතක් නිකුත් කිරීමට හැකි වීම පර්යේෂණ තොරතුරු ජනගත කිරීම අතින් අප මෙම වසරේ තැබූ යෝධ ඉදිරි පියවරකි. ඊට 'සාර' නමින් අතිරේකයක් ද ඇතුළත් වෙයි. ගොවිමිණ පුවත්පත ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට සම්බන්ධ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවීන් වෙත නොමිලේ බෙදා දීම සිදු කරනු ලැබීය.

අභියෝග

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවලට වසර පුරාම බාධා එල්ල වුණි. ක්ෂේත්‍ර සමීක්ෂණ පාදක කරගත් අධ්‍යයන බොහොමයක දත්ත එකතු කිරීමට මේ හේතුවෙන් අපහසුතා ඇති වීම මෙම වසරේ අප හමුවේ පැවති ප්‍රධාන අභියෝගයකි.
- පර්යේෂණ කාර්ය මණ්ඩලයට අයත් අනුමත සේවක සංඛ්‍යාවෙන් පර්යේෂණ නිලධාරීන්ගේ පුරප්පාඩු රැසක් තවමත් පවතී. එසේම ඊට අදාළව සංඛ්‍යාන නිලධාරීන්ගේ සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් ද පැවතීම අභියෝගයකි.

ඉදිරි ඉලක්ක

- වසර 10ක කාලයක් ඇතුළත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්වීම්වලට සහ ගෝලීයකරණ අභියෝගයන්ට මුහුණ දීම සඳහා අපගේ ආයතනය සූදානම් කිරීමේ අරමුණින් ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමේ අපේක්ෂාවක් පවතී. ඊට අදාළ මූලික අඩිතාලමක් ලෙස ආයතනයේ පර්යේෂණ අංශ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු දැනට ආරම්භ කර තිබේ.
- ආයතනයේ මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාමට අදාළව පද්ධති සහ කාර්ය පටිපාටි සකස් කිරීම තුළින් විධිමත් හා කාර්යක්ෂම සේවයක් ලබා දීම ද අපගේ ඉදිරි ඉලක්කයකි.
- කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ අප මුහුණ දෙන අභියෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා රජය මෙන් ම රාජ්‍ය නොවන පාර්ශවයන් සමඟ ද එකතු වී කටයුතු කිරීම සඳහා පුළුල් සම්බන්ධතා ඇති කර ගැනීම ද අපගේ ඉදිරි ඉලක්කයකි. ඒ යටතේ කෘෂිකාර්මික පර්යේෂණ හා ශාස්ත්‍රීය කටයුතුවලට අදාළ ආයතන සමඟ පුළුල් මට්ටමේ ශාස්ත්‍රීය හා පුහුණු කටයුතු පාදක කර ගත් ගිවිසුම්වලට එළැඹීමට දැනටමත් අප විසින් පියවර ගෙන ඇත.

කාර්යසාධක දර්ශකය


ප්‍රකාශන



ව්‍යාපෘති




සහයෝගීතා



සමාජ මාධ්‍ය







OFCs IN THE INTERMEDIATE SEASON
Cultivation issues in selected districts



DO WE KNOW WHAT WE SHOULD BE EATING?
Consumption Patterns of Fruit and Vegetables




IMPACT OF HOME GARDEN COCONUT CULTIVATION ON COCONUT KERNEL BASED INDUSTRIES IN SRI LANKA



POLICIES THAT MATTER OR ARE FORGETTABLE
An evaluation of paddy policies in Sri Lanka: 1998 to 2018



THATTUMARU - KATTIMARU AND PRODUCTIVITY
An Assessment of Traditional Tenurial Systems in The Wet Zone



IT IS NOT JUST WATER THAT FLOWS DOWNSTREAM
Water Management in the Eastern Slopes of the Central Highlands




LAND DEVELOPMENT ORDINANCE IN ACTION
Achievements and Prospects of Highland Alienation



MINOR IRRIGATION REHABILITATION
An Assessment of Awarding Rehabilitation Contracts to Farmer Organizations




MOBILE BASED SOLUTION FOR PEST AND DISEASE MANAGEMENT IN PADDY CULTIVATION




FACTORS INFLUENCING VEGETABLE FARMER'S DECISIONS



VALUE CHAIN ANALYSIS OF THE MILK INDUSTRY IN SRI LANKA



TRANSACTION COSTS: POTATO AND RED ONION



OFC CULTIVATION IN THE NORTHERN PROVINCE:
SSUES AND POSSIBLE SOLUTIONS

CROP PRODUCTION PRACTICES IN VILLAGE TANK SYSTEMS IN DRY ZONE SRI LANKA

ශ්‍රී ලංකාවේ කුළුබඩු කර්මාන්තයේ සමීප - ආර්ථික තත්වය සහ වර්තමානයේ එම කර්මාන්තය මුහුණ දී ඇති ගැටලු සහ විභවතා : ගම්මිරිස් වගාව ආශ්‍රිත අධ්‍යයනය

2021 වසරේදී ආයතනය ලැබූ තවත් සුවිශේෂී ජයග්‍රහණයක් නම්, කොවිඩ් 19 තර්ජනය හමුවේ පෙර වසරවල සම්පූර්ණ කළ යුතුව තිබූ නමුත් මග හැරුණු පර්යේෂණ වාර්තා 17ක් නිකුත් කිරීමයි.



පර්යේෂණ

කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, ආයතනික සමස්ත කාර්ය මණ්ඩලයම රාජකාරි ඉටු කිරීමට දායක කර ගත හැකි වූයේ 2021 වර්ෂයේ තෙවැනි කාර්තුවේ දී ය. එනමුත් වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කරමින් පර්යේෂණ, පුහුණු සහ සන්නිවේදන ක්ෂේත්‍රවල ශීඝ්‍ර ප්‍රගතියක් අත් කර ගන්නට ආයතනය සමත් විය.

වර්ෂ 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව කෘෂිකාර්මික අලෙවි තොරතුරු ව්‍යාපෘතිය ද ඇතුළත්ව සමාජ - ආර්ථික පර්යේෂණ ව්‍යාපෘති 22ක් සැලසුම් කළ පරිදි අවසන් කළ අතර රටේ ගොවිජන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා එම පර්යේෂණ ආශ්‍රිත ප්‍රතිපත්තිමය බලපෑම් අදාළ පාර්ශ්වයන් වෙත යොමු කිරීමට කටයුතු සම්පාදනය කෙරේ. ඒ හැරුණු කොට, අනෙකුත් ආයතන හා අංශ වෙත දායකත්වය ලබාදීම සඳහා කාලීන මාතෘකා ඔස්සේ වාර්තා ගණනාවක් සම්පාදනය කරන ලදී. ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති කෙටුම්පත සමාලෝචනය කර ඉදිරිපත් කිරීම, 'කාබනික ගොවිතැන වෙත යොමුවීම: ඉදිරි ගමන සඳහා ගැටලු, අභියෝග සහ යෝජනා' යන මැයෙන් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම, කාබනික ගොවිතැනට යොමුවීම උදෙසා රජය ගත් තීරණය සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යවරයා විසින් නගන ලද ප්‍රශ්න මාලාවට සවිස්තරාත්මක ප්‍රතිපෝෂණයක් ලබාදීම, කාබනික කෘෂිකර්මාන්තයට යොමු වීම සම්බන්ධයෙන් මාර්ග සිතියමක් සකස් කර ඉදිරිපත් කිරීම, ජෛව ස්කන්ධ ඉන්වෙන්ට්‍රිය සකස් කිරීම, ජාතික පාරිසරික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම, ශ්‍රී ලංකාවේ වන විනාශ කරන ස්ථාන පිළිබඳ මූලික සංචාරයක් මත පදනම් වූ තීක්ෂ්ණ බුද්ධි වාර්තාව සකස් කිරීම ආදිය ඒ අතරට අයත් වේ.

2021 වසරේදී ආයතනය ලැබූ තවත් සුවිශේෂී ජයග්‍රහණයක් නම්, කොවිඩ් 19 තර්ජනය හමුවේ පෙර වසරවල සම්පූර්ණ කළ යුතුව තිබූ නමුත් මග හැරුණු පර්යේෂණ වාර්තා 17ක් නිකුත් කිරීමයි.


අන්තර් සම්බන්ධිත සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ නවීකරණය කිරීමට නියමිත විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳ පූර්ව තත්ත්ව විශ්ලේෂණය , ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ක්‍රියාත්මක 'කෘෂි ශක්ති' ණය යෝජනා ක්‍රමය ඇගයීම සහ ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රය සම්පාදනය කිරීම යන අධ්‍යයන සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී නැත.

ආයතනික විෂයපථය යටතට ගැනෙන කාලීන ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා දායකත්වය ලබා ගැනීමට පර්යේෂණ හා පුහුණු කමිටුව ශක්තිමත් කිරීම, සංවිධානය නැවත ස්ථානගත කිරීම ඉලක්ක කරගත් ආයතනික උපාය මාර්ගය සඳහා රාමුව සම්පාදනය කිරීම, ආයතනික විෂයපථය සහ සංවිධානය නැවත ස්ථානගත කිරීම පිළිබඳ යෝජනා සම්බන්ධයෙන් පර්යේෂණ හා පුහුණු කමිටු සාමාජිකත්වය දැනුවත් කර ප්‍රතිපෝෂණය ලබා ගැනීම, ඉහත ප්‍රතිපෝෂණය සහිත ආයතනික උපාය මාර්ග රාවුම සඳහා රාමුව පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ද මෙම වසර තුළ ඉටු කළ කාර්යභාරයන් වේ.

දත්ත කළමනාකරණ අංශය ශක්තිමත් කිරීම එමගින් වර්තමාන වෙළඳ පොළ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා 'වෙළඳපොළ තොරතුරු ව්‍යාපෘතිය' යාවත්කාලීන කිරීම සහ සම්පූර්ණ ස්වයංක්‍රීය පද්ධතියකට පරිවර්තනය කිරීම ආරම්භ කිරීම ද මෙම වසරේ සිදු විය.



ග්‍රාමීය සංවර්ධනය



ග්‍රාමීය සංවර්ධන විෂයපථය යටතේ අවසන් කළ අධ්‍යයන **5**ක් ද, පර්යේෂණ වාර්තා සැකසෙමින් පවතින අධ්‍යයන **6**ක් ද වර්ෂයට අදාළව ගොනු කර දැක්විය හැකිය.

අවසන් කළ අධ්‍යයන

01. ඉඩම් සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක කිරීම: සාර්ථකත්වයන් සහ අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යයනය
ආර්.එම්.ඩී.එච් රත්නායක



අධ්‍යයනයේ අරමුණ වන්නේ ඉඩම් සංවර්ධන අඥා පනත යටතේ බෙදා හරින ලද උස් බිම්වල වත්මන් භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම සහ ඒ හරහා ලබා ගත් සාර්ථකත්වයන් සහ අපේක්ෂාවන් හඳුනා ගැනීමයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. උස් බිම් භාවිතයේ දී කෘෂිකාර්මික කටයුතුවලින් ඔබ්බට නේවාසික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජනතාව වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

2. බහුතර ජනතාව ගුණාත්මකභාවයෙන් යුතු නිවාස, යටිතල පහසුකම් සපයා ගැනීම, වෙනත් අදායම් උපයා ගැනීම වැනි කරුණු සඳහා ඉඩම් උපරිම මට්ටමින් භාවිත කර ඇති අතර කෘෂිකාර්මික කටයුතු සඳහා සැලකිය යුතු අවම භාවිතයක් පෙන්වයි.
3. ඉඩම් සංවර්ධනය සඳහා වන සත්ත්ව හානි පාලනය, ප්‍රමාණවත් ජල සම්පාදනය, මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දීම සහ ප්‍රවේශ මාර්ග සම්බන්ධ ගැටලුවලට විසඳුම් ලබා දීම වැනි කරුණු ජනතාව අපේක්ෂා කිරීම.

නිර්දේශ

1. වඩාත් ඛණ්ඩනයට ලක් වූ උස්බිම් හඳුනා ගනිමින් ඒ සඳහා දැඩි නීති පනවමින් එයට සුදුසු විසඳුම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා ගැනීම.

2. ශ්‍රී ලංකාවේ දැනට ඉඩම් සහ නිවාස සම්බන්ධව ඇති ප්‍රතිපත්තීන් මනාව විමර්ශනය කර ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සඳහා ජාතික මට්ටමින් විකල්ප ක්‍රියාමාර්ග ගැනීම.

3. නිවාස අවශ්‍යතාවය ඇති ග්‍රාමීය තරුණයින් සඳහා සුදුසු නිවාස යෝජනා ක්‍රම (තට්ටු/පොකුරු) හඳුන්වා දීම සහ දියත් කිරීම.


02. ගොවි සංවිධානවලට පුනරුත්ථාපන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිළිබඳ තක්සේරුවක්

එම්.ඒ.සී.එස් බණ්ඩාර

අධ්‍යනයේ අරමුණ වන්නේ තරඟකාරී ලංසු ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර ගොවි සංවිධාන වෙත සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත්තු ලබා දීමේ බලපෑම තක්සේරු කිරීම සහ මෙම ක්‍රියා පටිපාටියට අදාළ මුල් අරමුණු සාක්ෂාත් කර ගත්තේද යන්න පරීක්ෂා කිරීමයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. තෝරාගත් ගොවි සංවිධානවලින් අඩකට ආසන්න ප්‍රමාණයකට කිසිදු ආකාරයක පුනරුත්ථාපන ව්‍යාපෘතියක් භාර ගැනීමේ අත්දැකීමක් නැතත්, ගොවි සංවිධාන කුඩා ප්‍රතිශතයකට විවිධ වර්ගයේ සුළු වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති භාර ගැනීමේ වසර 15කට වැඩි පළපුරුද්ද ඇත.
2. ගොවි සංවිධාන වෙත සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම මූල්‍ය හැකියාවන් ඉහළ නැංවීම සහ ඔවුන්ගේ මෘදුකාංග සහ දෘඪාංග කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු ප්‍රතිලාභ ලබා ඇත.
3. පුනරුත්ථාපන අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දීම සඳහා විවිධ වෘත්තිකයන් විසින් සකස් කරන ලද මනා ලේඛනගත නිර්ණායක පවතින නමුත් පුනරුත්ථාපන අවශ්‍යතා හඳුනාගැනීමේ බරපතළ අඩුපාඩු දක්නට ලැබෙන බවට බහුතර ගොවීන් ප්‍රතිචාර දක්වා ඇත.



නිර්දේශ

1. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම, ජල කළමනාකරණය සහ වාරිමාර්ග පද්ධති සම්බන්ධ මෙහෙයුම් සහ නඩත්තු ක්‍රියාකාරකම් ඇතුළු සියලුම ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම හා වැදගත් උපාය මාර්ගයකි. ඒ සඳහා නිරන්තර පුහුණුවීම් සහ ධාරිතා ගොඩනැගීමේ වැඩමුළු පැවැත්විය යුතුය.

2. පුනරුත්ථාපනය / ප්‍රතිසංස්කරණය සඳහා වැව් තෝරා ගැනීම ප්‍රතිලාභී ගොවීන්ගේ අවශ්‍යතාවය මත පදනම් විය යුතු අතර එහි බලපෑම ආර්ථික වශයෙන් යහපත් විය යුතුය. ප්‍රතිලාභීන්ගේ සැබෑ අවශ්‍යතාවය සහ වැව් ධාරිතාව, ප්‍රතිලාභීන් සංඛ්‍යාව, බහුකාර්ය භාවිතය, ජල පෝෂක ප්‍රදේශය සහ පසුගිය පුනරුත්ථාපනයේ කාලසීමාව වැනි අනෙකුත් සාධක සැලකිල්ලට ගන්නා බරිත සාමාන්‍ය ලකුණු ලබාදීමේ ක්‍රමයක් වැව් තෝරා ගැනීම සඳහා පදනමක් ලෙස භාවිතා කළ හැකිය.

3. තෝරාගත් සුළු වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ පුනරුත්ථාපන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රමුඛත්වය දීමේ සිට සියලුම අදියරයන්හිදී තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට තෝරාගත් සුළු වාරිමාර්ග පුනරුත්ථාපන ප්‍රතිලාභීන්ට උපරිම ප්‍රවේශය තිබිය යුතුය.

03. තම්ටුමාරු - කට්ටිමාරු සහ එලදායිතාව තෙත් කලාපයේ සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ තක්සේරුවක්

ටී. පී. මුණසීරගේ

සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය (තම්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් හිමි ක්‍රමය) තෙත් කලාපීය වී වගාවට කොතෙක් දුරට බලපා ඇත්ද යන්න විමසා බලා ඒ ආශ්‍රිත ගැටලු මහහරවා ගැනීමට හැකි පිළියම් යෝජනා කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි.



ප්‍රමුඛ සොයා ගැනීම්

1. තෙත් කලාපීය කුඹුරු ඉඩම්වල තම්ටුමාරු - කට්ටිමාරු වගා ක්‍රමය තවමත් පැවතිය ද එහි මුල් ලක්ෂණ කාලයත් සමඟ වියැකී යමින් පවතී.

2. අඩු අස්වැන්න සහ නිෂ්පාදන පිරිවැය අධික නිසා වී වගාවේ ශුද්ධ ප්‍රතිලාභ අවම වීම නිසා වී වගාවේ මූල්‍යමය ආකර්ෂණීය බව අඩු වී ඇත.

3. ඉහළ අධ්‍යාපනය, නාගරීකරණය, කුඩා ඉඩම් කොටස්, වෙනත් ලාභදායී ආදායම් මාර්ග තිබීම සහ හිමිකාරිත්වයේ අපැහැදිලි බව මෙන්ම තම්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් හිමි ක්‍රමය හා සබැඳි සමාජ-ආර්ථික හේතූන් මත අනාගතය සඳහා තම්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් හිමි ක්‍රමය දිගටම පවත්වාගෙන යාමට තෙත් කලාපයේ ගොවි ජනතාව අතර දැඩි අප්‍රසාදයක් ඇතිවී ඇත.

නිර්දේශ

1. ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පවත්නා ආයතනික රාමුව ශක්තිමත් කිරීම හෝ උරුමය බෙදීම, කොටස් වාණිජකරණය කිරීම සහ ආරවුල් විසඳීමෙන් තට්ටුමරු සහ කට්ටිමරු ඉඩම්වල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා නව ආයතනික යාන්ත්‍රණ ස්ථාපිත කිරීම නිර්දේශ කෙරේ. මේ සඳහා ගොවිජන සංවර්ධන පනතේ යෝජනා කර ඇති ගොවිජන සංවර්ධන සභාව, ඉඩම් බැංකු සහ ගොවිජන විනිශ්චය සභා ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් ස්ථාපිත කර බලාත්මක කිරීම නිර්දේශ කෙරේ.

2. ඉඩම් ඒකාබද්ධ කිරීම හරහා ඛණ්ඩනය වූ සහ පුළුල් ලෙස විසිරී ඇති ඉඩම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ නැවත බෙදා වෙන් කිරීම.

04. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතින්: හඳුනාගැනීම සහ සංරක්ෂණය

ජෙ.ඒ.යූ.පී ජයසිංහ

ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් වන කෘෂිකාර්මික උරුම පද්ධති ක්‍රමානුකූලව හඳුනා ගැනීම සහ ඒවා සංරක්ෂණය කිරීමේ ක්‍රම යෝජනා කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. තේරීම් නිර්ණායක සහ නිර්වචනය ප්‍රධාන සාධක හතරක් මත පදනම්ව ගොඩනගන ලදී, එනම්,
    a. **ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතින්** හි මෙහෙයුම් ව්‍යුහය, කාර්යයන් සහ පාලන මූලධර්ම හඳුනා ගැනීම;
    b. **ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතින්** හි ආර්ථික යෙදවුම් හඳුනා ගැනීම;
    c. **ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතින්** හි ආහාර සුරක්ෂිතතා යෙදවුම් හඳුනා ගැනීම;
    d. තිරසාර කෘෂිකාර්මික පද්ධති පිළිබඳ සංකල්පය.



2. ප්‍රාදේශීයව සහ කාලයට අනුව අනුවර්තනය වූ මානව වර්ගයා සඳහා අවශ්‍ය සමාජ, සංස්කෘතික, පාරිසරික, අධ්‍යාත්මික සහ ආර්ථික භාණ්ඩ හා සේවා සැපයීම සහතික කරන අතරම ආශ්‍රිත පරිසර පද්ධතිය ද ආරක්ෂා කරනු ලබන විශිෂ්ඨ සහ අද්විතීය භූ දර්ශන, ජල දර්ශන, දැනුම් පද්ධති සහ ව්‍යුහයන් ලෙස ශ්‍රී ලංකාවේ **ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතින්** නිර්වචනය කරන ලදී.

3. ගොඩනගන ලද තේරීම් නිර්ණායක තුළට පොදු නිර්ණායක පහක්, ප්‍රධාන නිශ්චිත නිර්ණායක හතක් සහ උප නිර්ණායක විසි අටක් ඇතුළත් වේ.



නිර්දේශ

1. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ප්‍රතිපත්තිය, ඒවා හඳුනා ගැනීම, ප්‍රතිසංස්කරණය, ඥානවන්ත පරිහරණය සහ අනාගත පරම්පරාවන්හි භාවිතය සඳහා සක්‍රීය සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් ගොඩනැගීමට නිර්දේශ කෙරේ.

2. එම සංරක්ෂණ සහ කළමනාකරණ සැලැස්ම යථාර්ථවාදී, විස්තීර්ණ සහ කාලානුරූපී (කෙටි, මධ්‍යම හා දිගු කාලීන) විය යුතුය.

3. සංරක්ෂණ සහ කළමනාකරණ සැලැස්ම ගොඩනැගීමේ පියවර පහත පරිදි විය යුතුය.

   a. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති සඳහා නිර්වචනයක් සහ තෝරාගැනීමේ නිර්ණායක ගොඩනැගීම
   b. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම ප්‍රකාශයට පත්කිරීම සඳහා බලය ලත් ආයතනයක් පත් කිරීම
   c. ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම
   d. විභවයක් පවතින එවන් පද්ධති හඳුනා ගැනීම
   e. තෝරාගැනීමේ නිර්ණායකයන්ට අනුව ඒවා ඇගයීම
   f. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතීන් ප්‍රකාශයට පත්කිරීම.

05. ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ අභියෝග : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව

අයි.කේ එදිරිසිංහ



ව්‍යාපෘති ක්‍රියායාත්මක කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මුහුණ දී ඇති අභියෝග හඳුනා ගැනීම සහ ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සම්බන්ධව අභියෝග 47 ක් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව අභියෝග16 ක් පහත පරිදි අධ්‍යයනයෙන් අනාවරණය විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළව:

I. ව්‍යාපෘති ආරම්භය සහ සැලසුම් කිරීමේදී අභියෝග -14 ක් ප්‍රධාන මාතෘකා දෙකක් එනම් විෂයපථය සහ ව්‍යාපෘති සැලසුම් කිරීමට අදාළවද,
II. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අභියෝග පහක් එනම් මූල්‍යකරණය, මානව සම්පත්, ක්‍රියාත්මක කිරීම, කාල කළමනාකරණය සහ සම්බන්ධීකරණයට අදාළවද,
III. ව්‍යාපෘති අධීක්ෂණය හා අවසන් කිරීමේදී ප්‍රධාන අභියෝග පහක්, එනම්, අධීක්ෂණය, පසුවිපරම, විගණනය, සහ ස්වභාවික තත්ත්වයන්ට අදාළව ද හඳුනා ගන්නා ලදි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව:

I. ව්‍යාපෘති ආරම්භය සහ සැලසුම් කිරීමේදී -අභියෝග දෙකක් ප්‍රධාන මාතෘකාව වන ව්‍යාපෘති සැලසුම් කිරීමට අදාළවද,
II. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අභියෝග පහක් එනම් මූල්‍යකරණය, මානව සම්පත්, ක්‍රියාත්මක කිරීම, කාල කළමනාකරණය සහ සම්බන්ධීකරණයට අදාළවද,
III. ව්‍යාපෘති අධීක්ෂණය හා අවසන් කිරීමේදී අභියෝග පහක් ද හඳුනා ගන්නා ලදි.

නිර්දේශ

අධ්‍යයනයෙන් හඳුනා ගන්නා ලද අභියෝග සියල්ලටම අදාළව යෝජනා සහ නිර්දේශ ලයිස්තුවක් අධ්‍යයන වාර්තාව තුළ ඉදිරිපත් කළ අතර, ඊට අමතරව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී *log frame analysis, results resource framework, Gantt charts* වැනි ක්‍රම පිළිබඳව වැඩි අවධානයක් ලබා දීමටද යෝජනා කරන ලදී. තවද, අදාළ සෑම විටම, අදාළ පාර්ශව සියල්ලම සහභාගි කරගැනීමෙන් ව්‍යාපෘති සාර්ථකව අවසන් කර ගැනීමට හැකි බවද යෝජනා කරන ලදී.

සිදු කරමින් පවතින අධ්‍යයන

01. ශ්‍රී ලංකාවේ ආහාර බෝග අංශයේ කෘෂිකාර්මික ව්‍යාප්ති හා උපදෙස් සැපයීමේ සේවය: අභියෝග, ගැටලු සහ වැඩි දියුණු කිරීමේ විකල්ප

එම්.ඩී.එස් ලූර්දු

ආහාර බෝග අංශයේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට අදාළ ගැටලු, අභියෝගයන් සහ වැඩිදියුණු කිරීමේ විභවතාවන් හඳුනා ගැනීමත් එමඟින් කාර්යක්ෂම හා ඵලදායී ව්‍යාප්ති සේවාවක් සඳහා උපකාරී වන යෝජනා ඉදිරිපත් කිරීමත් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ශ්‍රී ලංකාවේ ආහාර බෝග අංශයට අදාළ ව්‍යාප්ති පද්ධතිය තුළ එහි ක්‍රියාකාරිත්වය හා ව්‍යුහය සියයට සියයක්ම පැරණි රටාවට අනුගමනය නොකළ ද නව අභියෝගයන්ට මුහුණු දීමට සමත් කමක් නොදක්වන බැවින් ව්‍යාප්ති සේවා ආවරණය, තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය භාවිතය, මානව සම්පත් සංවර්ධනය, ව්‍යාප්ති පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ අධීක්ෂණය, සැලසුම් සකස් කිරීම සහ පරිපාලනය වැනි ව්‍යාප්ති සේවයට අදාළ බොහෝ කරුණු තව දුරටත් දියුණු වීම අත්‍යවශ්‍ය වේ.



2. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා එහි අලුතින් මතුව එන කෘෂිකාර්මික අභියෝගයන් වූ ගෝලීයකරණය, විමධ්‍යගතකරණය බලය බෙදීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය සඳහා මුහුණු දීමට සුදුසු පරිදි වත්මන් ව්‍යාප්ති සේවයට අදාළ ව්‍යුහාත්මක තත්වය මෙන්ම හා ක්‍රියාත්මක තත්ත්වය ද වෙනස් විය යුතු වේ.

3. පවත්නා ව්‍යාප්ති පද්ධතිය තුළ පර්යේෂණ ආයතන, ව්‍යාප්ති නිලධාරින් හා ගොවීන් අතර සිදු වන දැනුම හා තාක්ෂණය ගලා යෑමේ යාන්ත්‍රණය ඵලදායක තත්ත්වයක පවත්වා ගැනීම අවශ්‍යවන බැවින් ඒ සඳහා වත්මන් ව්‍යාප්ති සේවාවේ කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා ව්‍යාප්ති පද්ධතිය සම්බන්ධයෙන් පුළුල් වූ පර්යේෂණයන් සිදු කිරීමේ අවශ්‍යතාවයක් ඇත.

නිර්දේශ

නීතිමය පදනමක් සමඟ පිළිගත හැකි දැක්මක් සහ මෙහෙවරක් සහිතව ගොවීන්ගේ අවශ්‍යතා ඉදිරියට ගෙන යාමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික ව්‍යාප්ති ප්‍රතිපත්තියක් ඇති කිරීම.



02. කාබනික වී වගාව සහ තරුණ සහභාගිත්වය තුළින් ක්‍රියාකාරී කුඹුරු ඉඩම් භාවිතය තීව්‍ර කිරීම

එම්.බී.එෆ් රිෆානා

පහත රට තෙත් කලාපයේ වී වගාව සම්බන්ධයෙන් ඇති දැනුම පරතරය හඳුනා ගැනීම සහ එම ප්‍රදේශයේ ක්‍රියාකාරී කුඹුරු ඉඩම් පුරන් වීම වලක්වා ගැනීම සඳහා අවශ්‍ය තරුණ ජවය සහ කාබනික ප්‍රවේශයන් ගවේෂණය කිරීම

ප්‍රමුඛ සොයා ගැනීම්

1. පෙර අධ්‍යයනවලින් උත්පාදනය කරන ලද විද්‍යාත්මක සොයාගැනීම් සහ නිර්දේශ බෙදා හැරීමේ අකාර්යක්ෂමතාවයක් පවතියි.
2. අධ්‍යයන ප්‍රදේශය තුළ ක්‍රියාකාරී තරුණ ගොවි සමිති සියයට 11ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි .

නිර්දේශ

1. තොරතුරු තාක්ෂණ මෙවලම් යොදාගැනීම මගින් පර්යේෂණ සොයාගැනීම්වල ඵලදායී ව්‍යාප්තිය තහවුරු කිරීම හරහා දැනුම් පරතරය පියවා ගැනීම
2. සම්පත් කේන්ද්‍රස්ථානයක් ලෙස තරුණ ගොවි සමිති ඒකරාශී කිරීම හරහා පවතින තරුණ ගොවි සමිති ශක්තිමත් කිරීම
3. කාබනික වගාව පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම තුළින් එය ප්‍රවර්ධනය කිරීම
4. වෙළඳපොළ තුළ අමුද්‍රව්‍ය සහ ගුණාත්මක කාබනික පොහොර ලබා ගැනීමට ඇති අවස්ථාවන් ඇති කිරීම

03. පහත රට තෙත් කලාපිය පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වයන් සහ අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යනය

ආර්.එම්.සී.එච් රත්නායක

පහතරට තෙත් කලාපිය පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය සහ අපේක්ෂාවන් හඳුනා ගැනීම.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. කුඹුරු පුරන් වීම සඳහා විවිධ සාධක බලපා ඇති අතර සංවර්ධන අවශ්‍යතාවයන්ගෙන් බහුතරය තාක්ෂණික ගැටලු විසඳා ගැනීම (ජල සම්පාදනය, ජල මාර්ග ප්‍රතිසංස්කරණය) සඳහා ප්‍රමුඛ වී ඇත.

2. ගොවීන්ගේ සහ නිලධාරීන්ගේ නොමද උත්සාහය සහ උනන්දුව පුරන් කුඹුරු සාර්ථකව වගා කිරීම සඳහා බලපා ඇත.

3. බහුතරයක් වැඩසටහන් සංවර්ධන අවශ්‍යතාවය සමග අනුරූපී වුවද එහි ගුණාත්මකභාවය, මූල්‍යමය හා ද්‍රව්‍යමය අනුග්‍රහය සම්බන්ධයෙන් ගොවීන් සැහීමකට පත් නොවේ.



නිර්දේශ

1. කුඹුරු පුරන්වීමට හේතු නිවැරදිව හඳුනා ගනිමින් පළමුව ඒවා වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
2. අදාළ ප්‍රදේශයේ තාක්ෂණ නිලධාරීන්ගේ සහාය ඇතිව නිවැරදි පිරිවැයකින් යුතු ක්‍රමවත් ව්‍යාපෘති යෝජනා සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. සංවර්ධනය කළ දෑ මනාව පවත්වා ගෙන යාම සඳහා සුදුසු සැලසුම් සකස් කර එහි වගකිම ගොවි සංවිධාන වෙත පැවරීම.



04. දේශීය කෘෂි ව්‍යවසායකයින් විසින් පවත්වාගෙන යනු ලබන කෘෂිකාර්මික සේවා සපයන මධ්‍යස්ථාන හරහා ගොවිපොළ යාන්ත්‍රිකකරණය ආරම්භ කිරීම: අභියෝග සහ අවස්ථා

එම්.ඒ.සී.එස්. බණ්ඩාර

ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනවල වටිනාකම් දාමය ඔස්සේ විවිධ සේවා සපයන සහ කෘෂිකාර්මික සේවා සපයන මධ්‍යස්ථාන හරහා කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණය ආරම්භ කිරීම සඳහා ශක්‍ය සහ ප්‍රායෝගික ආකෘතියක් ලබා ගැනීමයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. රාජ්‍ය මැදිහත්වීම් හරහා රට තුළ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සැපයීම බොහෝ විට අකාර්යක්ෂමතාවය, දූෂණය සහ වෙනත් අහිතකර සමාජ බලපෑම් හේතුකොටගෙන පුළුල් ලෙස විවේචනයට ලක්ව ඇත.
2. ප්‍රදේශයේ ඉඩම් බහුල නමුත් ශ්‍රමය සීමාකාරී නිෂ්පාදන සාධකයක් වන කෘෂිකාර්මික සේවා සපයන මධ්‍යස්ථාන මඟින් එක් සේවකයෙකු සඳහා නිෂ්පාදනය සහ වගා කරන ප්‍රදේශය වැඩි කළ හැක.
3. ශ්‍රමය සීමා සහිත සහ උපරිම වගා කාලවලදී ඉල්ලුම සපුරාලීම සඳහා යන්ත්‍රෝපකරණ නොමැති විට, එවැනි ස්ථාන කෘෂිකාර්මික සේවා සපයන මධ්‍යස්ථාන සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිය.





නිර්දේශ

1. කුඩා ගොවීන්ට / යැපුම් ගොවීන්ට යාන්ත්‍රික තාක්ෂණය ලබාදීමට වඩාත් සුදුසු වන්නේ පුද්ගලික ව්‍යවසායකයින්ය. දැනට පවතින යන්ත්‍රෝපකරණ සේවා සපයන්නන්ගේ ව්‍යාපාරයට එවැනි නවෝත්පාදන හඳුන්වාදීමට බාධාවක් නොවිය යුතු අතර එය පවත්වාගෙන යාමට කටයුතු සම්පාදනය කළ යුතුය.
2. වෙළඳපළ අසාර්ථකත්වය තුරන් කිරීම සහ සැපයුම් කාර්යක්ෂම හා සතුටුදායක ආකාරයෙන් ඉල්ලුම සපුරාලන බව සහතික කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස රජය කටයුතු කළ යුතුය. මෙම කාර්ය සඳහා රජයට ආයතනික සහාය සහ දිරිගැන්වීම් ලබාදිය හැකිය.

05. තිරසාර ග්‍රාමීය සංවර්ධනයක් උදෙසා ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ඉඩම් ඒකාබද්ධ කිරීම

ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර

ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ඉඩම් ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් විමර්ෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ කුඩා වතු හිමියන්ගේ ගොවි අංශය අතර ඉඩම් ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමෝපායන් හඳුනා ගැනීම අධ්‍යනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. බොහෝ රටවල, බොහෝ ඉඩම් ප්‍රතිසංස්කරණ ආරම්භ වූයේ ස්ථිතික ප්‍රතිපත්ති අරමුණු හරහා වන අතර දිගුකාලීන ප්‍රතිපත්ති රටේ සංවර්ධන අවශ්‍යතා හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී .ඉඩම් ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් එහි දී ප්‍රමුඛ විය .



2. ශ්‍රී ලංකාවට අදාළව කලින් සිදුකරනු ලැබූ ඉඩම් ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් සලකා බැලීමේදී ඒවා දිගුකාලීන රාජ්‍ය ප්‍රතිපත්ති හා සම්බන්ධ වන නොවන අතර තිරසාරබව පිළිබඳ ගැටලුවක් පවතී.

3. එසේම ඒවායේ අරමුණු පුළුල් ග්‍රාමීය සහ කෘෂිකාර්මික අරමුණ සමඟ අඛණඩව සහ ප්‍රමාණවත්ව සම්බන්ධ වී නැත.

නිර්දේශ

1. ඉඩම් කැබලිවීම, සුළු පරිමාණ ගොවි අංශයේ පවතින ප්‍රධානතම ගැටලුවකි. එම ගැටලුව අවම කර ඉඩම් වඩා ඵලදායීව භාවිතා කිරීමට පළමු අදියරක් වශයෙන් සරළව කෘෂි ඉඩම් ඒකාබද්ධ කිරීම (Plot combining) සිදුකළ හැකිය.

2. ගොවිජන ප්‍රජාව, දිගුකාලීන කෘෂි සහ ග්‍රාමීය සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කරන තිරසාර ඉඩම් ප්‍රතිසංස්කරණ/ප්‍රතිපත්ති සමඟ සම්බන්ධ වන ඒකාබද්ධ ප්‍රයත්නයක් ලෙස ඉඩම් ඒකාබද්ධකරණය පිළිබඳ අවධානය යොමුකිරීම හා ක්‍රියාත්මක කිරීම

3. ඉඩම් ඒකාබද්ධකරණය ජාතික මට්ටමේ මැදිහත්වීමක් සමඟ විධිමත් ආයතනයක් තුළින් සිදුකළ යුතුය. එමෙන් ම එය ක්‍රියාත්මක කිරීම සඳහා ගොවි සමාගම් සහ ගොවි සංවිධානවල දායකත්වය ලබා ගැනීම වැදගත් වේ.

06. ශ්‍රී ලංකාවේ ආදායම් උත්පාදනය සහ ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා ගොවිපොළ-ව්‍යවසායකත්වය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය තුළින් බිම්මල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

එස්.ජී. ප්‍රනාන්දු

ශ්‍රී ලංකාවේ බිම්මල් කර්මාන්තය නහා සිටුවීමට සහ එමඟින් ග්‍රාමීය ගොවි ආර්ථිකය සහ ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා ගොවීන්ගේ ව්‍යවසායකත්ව හැසිරීම් සහ නැඟී එන කෘෂි ව්‍යාපාර අවස්ථා තක්සේරු කිරීම අධ්‍යනයේ අරමුණයි.





පරිසර

2021 වර්ෂයට අදාළව මෙම විෂය පථය යටතේ අවසන් කළ අධ්‍යයන තුනකි. පර්යේෂණ වාර්තා සැකසෙමින් පවතින අධ්‍යයන තුනකි.

01. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ග්‍රාමීය වැව් පද්ධතිවල බෝග නිෂ්පාදන පිළිවෙත්

ඩබ්.එච්.ඒ ශාන්ත

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ එල්ලංගා වැව් පද්ධතිවල සමකාලීන භෝග නිෂ්පාදන ක්‍රම සහ ඒ ආශ්‍රිත ජීවනෝපායන් හඳුනා ගැනීම.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ග්‍රාමීය එල්ලංගා වැව් පද්ධතිවලට අයත් ජල පෝෂක ප්‍රදේශ ක්‍රම ක්‍රමයෙන් ක්ෂීණ වෙමින් පවතින අතර, යාබද රක්ෂිත ඉඩම් සහ අනෙකුත් භූමි කුඹුරු ඉඩම් බවට පත්කිරීම හේතුවෙන් වැව යටතේ වන සමස්ත වගා වපසරිය කැපී පෙනෙන මට්ටමකට වර්ධනය වී ඇත.
2. විශේෂයෙන්ම සාමාන්‍ය නඩත්තු හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු මෙන්ම සුළු හා ප්‍රධාන පුනරුත්ථාපන කටයුතු දීර්ඝ කාලීනව නොසලකා හැරීම හේතුවෙන් සහ ගම් වැව් කෙරෙහි ඇති අඩු අවධානය නිසා ඒවායෙහි වාරි ධාරිතාව සීඝ්‍රයෙන් පහත වැටීම නිරීක්ෂණය කළ හැකිය.
3. වැව් පෝෂක ප්‍රදේශයන් ආශ්‍රිතව සිදුවන අයහපත් මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන අධික පාංශු ඛාදනය හේතු කොට ගෙන වැව් පතුලෙහි අවසාදිත තැන්පත්වීම ගම් වැව්වල ධාරිතාව අඩුවීමට බලපානු ලබන ප්‍රධාන සාධකය බව වාර්තා වේ.





නිර්දේශ

ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණයට පෙර එහි අවශ්‍යතා පිළිබඳ තක්සේරුවක් සිදුකළ යුතුය. ප්‍රතිලාභීන් සංඛ්‍යාව, පිරිවැය ඵලදායිතාවය, ප්‍රයෝජනවත් වන අංශ සහ ඒවායේ විභවයතාවයන් එනම් බෝග නිෂ්පාදනය, ජලජීවී වගාව, පශු සම්පත්, ගෘහස්ත භාවිතය සහ ගඩොල් සෑදීම වැනි අනෙකුත් ජීවනෝපායන් සලකා බැලිය යුත්තේ සමස්ත එලාංගා පද්ධතියෙහිම ජල විද්‍යාත්මක තක්සේරුවක් සිදුකිරීමෙන් අනතුරුව විය යුතුය.

එවැනි තක්සේරුවකින් පසුව සිදුකරනු ලබන පුනරුත්ථාපන කටයුතුවලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එල්ලංගා පද්ධතියෙහිම අවම වශයෙන් කුඩා වැව් තුනක් හෝ හතරක් (යම් කඳුරැල්ලක සකස් කර ඇති මුළු වැව් සංඛ්‍යාව අනුව) ප්‍රතිසංස්කරණය කිරීම හෝ ප්‍රශස්ත මට්ටමේ ක්‍රියාකාරිත්වයට ගෙන ඒම කළ යුතුය.

පුනරුත්ථාපන ක්‍රියාවලියේදී වැව ආශ්‍රිත පරිසර පද්ධතිය ආරක්ෂා වීම සහතික කළ යුතුය. වැව් පෝෂක ප්‍රදේශ, අවසාදිත වැවට ඇතුළුවීම වැලැක්වීම සඳහා පාලන ව්‍යුහයන් (ජීව විද්‍යාත්මක) සහ පහළ ඇළ මාර්ග ගැන සැලකිලිමත් විය යුතුය.

02. මධ්‍ය කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය.

ඩබ්.එච්.ඒ ශාන්ත









ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකර ප්‍රදේශයේ දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට ලක්වන නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණ ගැටලු පිළිබඳව විමර්ශනය කිරීම.

ප්‍රමුඛ සොයා ගැනීම්

වන සහ ජල මාර්ග රක්ෂිත සහ ලඳු කැලෑ තුළ අනවසර වාණිජ බෝග සහ එළවළු වගා ව්‍යාප්තිය හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ ඉහළ ජල පෝෂක ප්‍රදේශන්හි ඉඩම් පරිහරණය සහ භූමි ආවරණය සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත

අධ්‍යයන ප්‍රදේශයේ ජල භාවිත සහ ජල භාවිත කණ්ඩායම් සංඛ්‍යාව කාලයත් සමඟ විශාල වශයෙන් වැඩි වී ඇති අතර ඒවා ඉතා විවිධාංගීකරණය ට සහ සංකීර්ණතත්වයට පත්ව වී ඇත. එම හේතූන් නිසා ජලය ඉතාමත් හිඟ සම්පතක් බවට පත්ව ඇති අතර ඒ සඳහා විවිධ ජල භාවිත කණ්ඩායම් අතර ඉහළ තරඟකාරීත්වයක් නිර්මාණය වී ඇත.

විවිධ අවශ්‍යතාවයන් සඳහා වාරි ඇළ මාර්ගවලින් අනවසරයෙන් අසීමාන්තිකව ජලය ලබාගැනීම නිසා පහළ ප්‍රදේශයන්හි ජීවත්වන ගොවි ප්‍රජාවන්ගේ ජීවනෝපායට සහ ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාවයට දැඩි බලපෑම් එල්ලවී ඇත.

නිර්දේශ

ඉහල ජල පෝෂක ප්‍රදේශවල සහ ඇළ මාර්ග රක්ෂිතයන්හි තීව්‍ර ලෙස සිදුකරනු ලබන වාණිජ බෝග වගාව සහ ඒ සඳහා සිදුකරනු ලබන ඉහල ජල භාවිතය විධිමත්ව නියාමනය කිරීම සිදුකළ යුතු අතර අනවසර වගා කටයුතු සිදුකරන පුද්ගලයින් සඳහා වෙනත් සුදුසු ඉඩම් ලබාදී ඔවුන්ගේ ජීවනෝපාය සහතික කළ යුතුය.

ජල කළමනාකරණය සහ සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා වතු පාලනාධිකාරියෙ හි මැදිහත්වීම ලබාගැනීම සඳහා මනා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

කුඩා වැව් සහ ඇළ පද්ධති ඇතුළු වාරිමාර්ග ව්‍යුහයන්හි ජල ප්‍රවාහනය සහ වාරි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා එම පද්ධතීන් නිසි කලට අවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදුකළ යුතුය.





03. අතරමැදි කන්නයේ අතිරේක ආහාර බෝග - තෝරාගත් දිස්ත්‍රික්කවල වගා ගැටලු

එන්.ජී.ජී. සමන්ත

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ අතරමැදි කන්නයේ කුඹුරු ඉඩම්වල අතිරේක ආහාර බෝග වගාවේ ගැටලු සහ බාධාවන් හඳුනා ගැනීමයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. කිසිදු බීජ ප්‍රතිකාරයක් නොමැතිව පරිභෝජනය සඳහා වෙළඳපොළේ ඇති බීජ සිටුවීම, ගුණාත්මක බීජ නොමැතිකම, බීජ සඳහා ඉහළ වෙළඳපළ මිල සහ බීජ රෝග පැතිරීම බීජ ලෙස ගොවීන් විසින් මතු කරන ලද ප්‍රමුඛතම සීමා කිරීම් විය.

2. මැද කන්නයේ මුං වගාවේ යෙදෙන ගොවීන් මුහුණ දුන් තවත් ගැටලුවක් වූයේ සත්ව හානිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ වඩාත්ම විනාශකාරී ගව හානියයි.

3. මැද කන්නයේ මුං වගා කරන්නන් මුහුණ දෙන තවත් සැලකිය යුතු බාධාවන් වන්නේ මිල උච්චාවචනය, පළිබෝධ සහ රෝග හේතුවෙන් අඩු ආදායම, නිසි අලෙවිකරණ යාන්ත්‍රණයක් නොමැතිකම, උපකරණ නොමැතිකම සහ පසු අස්වනු කළමනාකරණය සඳහා අත්දැකීම් නොමැතිකම.

නිර්දේශ

1. කන්නය ආරම්භයේ දී නිර්දේශිත බීජ ලබා ගත හැකි බවට සහතික කිරීම අතරමැදි කන්නයේ වගා කිරීම සඳහා ගොවීන් දිරිමත් කිරීම සහ රඳවා ගැනීම අතිශයින්ම අවශ්‍යතාවයකි. එබැවින් උසස් තත්ත්වයේ බීජ හිඟය සඳහා ක්‍රියාකාරී විසඳුමක් ඇති කිරීම සඳහා අතරමැදි කන්නයේ වගාව සමඟ සහතික කළ බීජ නිෂ්පාදන වැඩසටහන පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ නොමැති නම් අතරමැදි කන්නයේ සිටුවීම සඳහා කිසිදු බීජ සහතික කිරීමේ අධිකාරියක් විසින් නිර්දේශ නොකළ ආනයනික බීජ මත යැපීමට ගොවීන්ට සිදුවනු ඇත. ආනයනය සීමා කෙරෙන අවස්ථා වලදී එවැනි නිර්දේශිත නොවන ආනයනික බීජ පවා ලබා ගැනීම වඩාත් දුෂ්කර වනු ඇත. එබැවින්, අවාරයේ මුං වගාව සඳහා ගුණාත්මක බීජ නියම වේලාවට ලබා දීමේ ගැටලුව විසඳීමට විශේෂ අවධානය යොමු කළ යුතුය.

2. සත්ත්ව හානි හේතුවෙන් සිදුවන වගා හානි සම්බන්ධයෙන් ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. ගව පාලනය සඳහා තෘණ බිම් සාධාරණ ලෙස වෙන් කිරීම හම්බන්තොට දිස්ත්‍රික්කයේ අතරමැදි කන්නයේ වගාව ව්‍යාප්ත කිරීමේ වැදගත් ප්‍රතිපත්තිමය මූලපිරීමකි.

3. අනෙකුත් ක්ෂේත්‍ර භෝග වගා කරන ප්‍රදේශයකට අවම වශයෙන් එකක් බැගින් බීජ වියළන යන්ත්‍ර සහ පිරිසිදු කිරීමේ යන්ත්‍ර ලබා දීමෙන් පසු අස්වනු කළමනාකරණ පිළිවෙත් රාජ්‍ය මැදිහත්වීමෙන් වැඩිදියුණු කළ හැක. අනෙකුත් ක්ෂේත්‍ර බෝග අස්වැන්න සඳහා අගය එකතු කිරීම අලෙවිකරණ ගැටළු විසඳීමේ විකල්පයක් ලෙස.

සිදු කරමින් පවතින අධ්‍යයන

01. ශ්‍රී ලංකාවේ ඉහළ අගයකින් යුත් පලතුරු බෝග නිෂ්පාදනය කිරීමේදී ජල හා බලශක්ති පරිභෝජනය සඳහා ඒකාබද්ධ විසඳුම් පිළිබඳ අධ්‍යයනය

ටී. ජී. මුණසීරගේ





ශ්‍රී ලංකාවේ තෝරාගත් ඉහළ වටිනාකමකින් යුත් පලතුරු බෝග නිෂ්පාදනයේදී ජලය සහ බලශක්ති භාවිතය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික ජල සම්පාදන ක්‍රම වලට සාපේක්ෂව බිංදු සහ විසිරුම් වැනි කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමවල සාපේක්ෂ වැදගත්කම සහ සංසන්දනාත්මක වාසිය පරීක්ෂා කිරීම.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. අධ්‍යයනය කරන ලද සියලුම බෝග සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදනය සඳහා ආයෝජනය කිරීම ආර්ථිකව වාසිදායක වන අතර බෝගයේ ආයු කාලයට සාපේක්ෂව ආයෝජනය කෙටි කාලයක් තුළ ආපසු උපයා ගත හැකිය.

2. බෝගයේ වර්ධන අවධිය, පොම්ප කිරීමේ උපකරණවල ධාරිතාව, ක්‍රියාත්මක වන පැය ගණන අනුව දෛනික බෝග ජල අවශ්‍යතා පිළිබඳ ගොවීන් අතර දැනුවත්භාවය අඩුය.

3. සාම්ප්‍රදායික ක්‍රම යටතේ ජල සම්පාදන පිරිවැය ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමයන්ට වඩා වැඩිය. තවද, බෝග ජල අවශ්‍යතාවය සහ වාරි ජල සම්පාදනය සම්බන්ධ අනෙකුත් තාක්ෂණික තොරතුරු පිළිබඳව ගොවීන් දැනුවත් නොවීම නිසා අතිරික්ත ලෙස ජලය යෙදීම නිසා බලශක්තිය හා ශ්‍රමය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවේ

නිර්දේශ

1. ජල භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සැලසුම් කරනු ලබන ඕනෑම ප්‍රතිපත්තියකදී බෝගයේ ජල අවශ්‍යතාවය හා බලශක්ති පරිභෝජන රටාවේ බලපෑම් ද සලකා බැලිය යුතුය.
2. දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමේ මාධ්‍යයක් ලෙස ක්ෂුද්‍ර ජල සම්පාදනයේ වාසි පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් තිබිය යුතුය.
3. දේශගුණික වෙනස්වීම් හමුවේ ප්‍රථ්‍යස්ථිතාවය වැඩිකර බෝග අස්වැන්න, ජලය සහ බලශක්තිය ඉතිරිය වැඩි කිරීම සඳහා හරිත තාක්ෂණයන් හරහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම ප්‍රවර්ධනය කිරීම නිර්දේශ කෙරේ.





02. වාණිජමය මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය : ගැටලු හා ප්‍රවණතාවයන්

එම්.සී.එන්.එම් ඛයස්

ශ්‍රී ලංකාවේ ගුණාත්මක බවින් ඉහළ කාබනික පොහොර නිශ්පාදනය වැඩිකිරීම සඳහා වාණිජමය මට්ටමින් කාබනික පොහොර නිශ්පාදනයේ දැනට පවත්නා ගැටලු හා විභවතාවයන් හඳුනා ගැනීම.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. දැනට වාණිජමය මට්ටමින් නිෂ්පාදනය කරන ප්‍රධානම කාබනික පොහොර වර්ගය කොම්පොස්ට් වන අතර දියර කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමුවී ඇත්තේ අඩු ප්‍රතිශතයකි. එමෙන්ම කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ප්‍රධාන වශයෙන්ම භාවිතා කරන්නේ සාම්ප්‍රදායික ක්‍රම වන අතර නවීන තාක්ෂණික ක්‍රම සඳහා යොමුවීම ඉතාම අවම මට්ටමක පවතී.
2. පොහොර නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් පරිදි අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම, අමුද්‍රව්‍ය වල මිල අධික ලෙස ඉහළ යෑම, කාබනික පොහොර සඳහා නිසි මිලක් හා වෙළඳ පොළක් නොමැතිකම
3. දැනට වාණිජමය ලෙස නිෂ්පාදනය කර වෙළඳපොලට නිකුත් කරන කාබනික පොහොර වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැතිවීම නිසා නිසි ප්‍රමිතියකින් තොර කාබනික පොහොර නිෂ්පාදන වෙළඳපොළට නිකුත් කෙරෙන අතර එය ශ්‍රී ලංකාව තුළ කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ඇති ප්‍රධාන අභියෝගයක් වේ.

නිර්දේශ

- ශ්‍රී ලංකාවේ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ඉහළ නැංවීම සඳහා ජාතික මට්ටමින් දීර්ඝ කාලීන ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දියත් කිරීම සඳහා රජයේ වැඩි අවධානයක් යොමුවිය යුතුය.

- කාබනික පොහොර නිෂ්පාදන වල ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම.

- වාණිජමය මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම.

- කාබනික පොහොර නිෂ්පාදන සඳහා නිසි වෙළඳපොළක් නිර්මාණය කිරීම.

- කාර්යක්ෂම ලෙස කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම.

03. ශ්‍රී ලංකාවේ උඩරට එළවළු ගොවීන් භාවිතා කරන පාංශු සංරක්ෂණ ක්‍රම කෙරෙහි බලපාන සාධක

ජී.වී.එන් අයෝමී



අරමුණු

1. උඩරට එළවළු ගොවීන් විසින් අනුගමනය කරන පවතින පාංශු සංරක්ෂණ පිළිවෙත් සහ ඒවාට බලපාන සාධක හඳුනා ගැනීම.

2. උඩරට එළවළු ගොවීන් විසින් අනුගමනය කරනු ලබන තිරසාර ඉඩම් කළමනාකරණ භාවිතයන් සඳහා වන වියදම් ඵලදායීතාවය, නිෂ්පාදන ඒකක පිරිවැය සහ ඒකක ලාභය අතර සම්බන්ධය සොයා බැලීම.

3. තිරසාර එළවළු ගොවිතැන සඳහා නිර්දේශිත තිරසාර පාංශු කළමනාකරණ තාක්ෂණයන් යෙදවීම සහ ගොවීන්ගේ දැනුම, පාංශු සංරක්ෂණ පිළිවෙත් හා සම්බන්ධ ගොවීන්ගේ ආකල්ප ඇගයීම සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ගත යුතු උපාය මාර්ග සහ මූලපිරීම් යෝජනා කිරීම සහ නිර්දේශ කිරීම.

ආහාර පද්ධති

මෙම විෂය යටතේ අවසන් කළ අධ්‍යයන **12**ක් සහ සිදුකරමින් පවතින අධ්‍යයන **09**ක් ද පවතී.



01. "අපි කන්න ඕන මොනවද කියලා අපි දන්නවාද?"

එළවළු සහ පලතුරු පරිභෝජන රටා

යු.ඩී.ආර් උදාරි

එළවළු සහ පලතුරු පරිභෝජනය සඳහා බලපාන සාධක සහ පරිභෝජනය ඉහළ නැංවීමට ඇති බාධක සහ විභවතාවයන් හඳුනා ගැනීම

ප්‍රමුඛ සොයා ගැනීම්

- බහුතරයක් ගෘහ ඒකක (නාගරික-69%, වතු-69% සහ ග්‍රාමීය-56%) එළවළු සහ පලතුරු අවශ්‍යතාව සඳහා සම්පූර්ණයෙන් බාහිර වෙළඳපොළ මත යැපෙයි. ග්‍රාමීය සහ වතු අංශයේ ගෘහ ඒකක සිදු කරන වියදම මෙන් දෙගුණයකට වඩා නාගරික ගෘහ ඒකක එළවළු සහ පලතුරු සඳහා මාසිකව වැය කරයි. එළවළු සහ පලතුරු මිලට ගැනීම කෙරෙහි ඒවායේ ගුණාත්මකභාවය, නැවුම් බව, මිල සහ සෞඛ්‍යාරක්ෂිත බව වැදගත් වෙයි.

- නොමේරූ පලතුරු රසායනික ද්‍රව්‍ය යොදා ඉදවීම, රසයෙන් අඩු වීම සහ ඉහළ මිල, පලතුරු පරිභෝජනය ඉහළ නැංවීමට ඇති ප්‍රධාන බාධක අතර වෙයි. එළවළු සහ පලතුරු පරිභෝජනයේ පෝෂණ වටිනාකම පිළිබඳ දැනුවත්භාවය, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ගෙවතුවලින් ලබාගත හැකි වීම සහ සාධාරණ මිල, එළවළු සහ පලතුරු පරිභෝජනය වැඩි කිරීමේ ප්‍රධාන සාධක වෙයි.



- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් (97%) ක් තමන් මිල දී ගන්නා එළවළු සහ පලතුරු ආරක්ෂිත නොවන බව සහ පළිබෝධනාශක අවශේෂ ද්‍රව්‍ය වලින් ඒවා දූෂණය වී ඇති බව විශ්වාස කරයි. මෙම විශ්වාසය බහුතරයක් ගෘහ ඒකක (74%) වල එළවළු සහ පලතුරු මිල දී ගැනීම සහ පරිභෝජනය කෙරෙහි ඍණාත්මකව බලපායි.

නිර්දේශ

- ගෘහ ඒකකවල එළවළු සහ පලතුරු පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් අඛණ්ඩව සිදුකළ යුතුය. අවම පරිභෝජන මට්ටම සහ අවම විවිධත්වය සලකා වතු අංශය ප්‍රධාන වශයෙන් ඉලක්කගත කළ යුතුය. විවිධත්වයකින් යුතු එළවළු සහ පලතුරු පරිභෝජනය සහ ඒවායෙන් ලැබෙන සෞඛ්‍යමය වාසි සහ සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් පිළිබඳ නිවැරදි තොරතුරු ජනතාවට ලබාදීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- බහුතරයක් ගෘහ ඒකක කාබනික එළවළු සහ පලතුරු පිළිබඳ දැනුවත් අතර, නිෂ්පාදන ධාරිතාව වැඩි කළ හැකි නම් සෞඛ්‍යාරක්ෂිත එළවළු සහ පලතුරු සඳහා ශක්‍ය වෙළඳපොළක් තිබේ. ඒ සඳහා නිෂ්පාදන ප්‍රවර්ධනය, සහතික කිරීම සහ විකිණීම ප්‍රවර්ධනය කිරීම සඳහා සියලුම අංශ එකට කටයුතු කළ යුතුය. තව ද කාබනිකව නිෂ්පාදන කළ එළවළු සහ පලතුරු දේශීය වෙළඳපොළට නිකුත්කිරීමේ දී පිළිගත් කාබනික සහතිකයක් නිකුත් කිරීම සඳහා ජාතික නීති සම්පාදනයේ වැදගත්කම අවධාරණය කරයි.

- ග්‍රාමීය ජනතාවගේ එළවළු සහ පලතුරු පරිභෝජනය ඉහළ නැංවීමේ එක් ක්‍රමයක් වන්නේ ගෙවතු වගාව ප්‍රවර්ධනය යි. කෙසේ වෙතත් එළවළු සහ පලතුරු ඉල්ලුම සැපිරීමේ දී ගෙවතුවල පවත්නා සීමාවන් හඳුනාගත යුතු අතර ගෘහ ඒකක බහුතරයක් බාහිර වෙළඳපොළ මත රඳා පවතින බැවින් සාධාරණ මිලකට අවශ්‍ය එළවළු සහ පලතුරු ලබා ගැනීම සහ ප්‍රවේශ වීමේ හැකියාව සහතික කළ යුතුය.

- ප්‍රතිචාර දැක්වූවන්ගේ බහුතරය (97%) තමන් මිල දී ගන්නා එළවළු සහ පලතුරු සෞඛ්‍යාරක්ෂිත නොවන බවත්, ඒවායේ පළිබෝධනාශක අවශේෂ අන්තර්ගත බවත්, විශ්වාස කරන අතර මෙම ඍණාත්මක විශ්වාසය බහුතරයක් ගෘහ ඒකකවල එළවළු සහ පලතුරු පර්භෝජනය සහ මිල දී ගැනීම අඩු කිරීම කෙරෙහි බලපායි. එම නිසා අවශ්‍ය පර්යේෂණ සහ විමර්ශන සිදු කර එහි සත්‍ය අසත්‍යභාවය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ.

02. ආහාර බෝග අංශයේ පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා පරිශීලක කේන්ද්‍රීය ජංගම දුරකථන පාදක විසඳුමක්

එම්.බී.එෆ් රිෆානා

රෝගජාව කාලීන තොරතුරු ගොවි ප්‍රබඳ තත්‍යළිපලිබෝධ පාලනය පි-න් කෘෂිළිවෙත ලබාදීම තුව්‍යාප්ති සේවාව ශක්තිමත් කිරීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම

1. ගොවීන්ගෙන් **90%** ක් පළිබෝධ සහ රෝග හඳුනා ගැනීම සඳහා "ලේඩ්බර්ඩ්" ජංගම යෙදවුම භාවිතා කරන ලදී.
2. ඔවුන්ගෙන් **45%** ක් ජංගම යෙදවුම හරහා පළිබෝධ සහ රෝග පිළිබඳ වාර්තා කර විසඳුම් බලාපොරොත්තු වූහ; වයස අවුරුදු **40**ට අඩු ගොවීන් වැඩිහිටි ගොවීන්ට වඩා ජංගම යෙදවුම මගින් පළිබෝධ සහ රෝග සිදුවීම් වාර්තා කරන ලදී.
3. වී ගොවීන් බහුතරයක් තාක්ෂණයෙන් ඉහළ ජංගම යෙදවුම්වලට නොගැළපෙන මූලික අනුවාදවල ජංගම දුරකථන භාවිතා කල අතර ගොවිතැන් කරන ප්‍රදේශවල දුර්වල සංඥා ශක්තියක් පැවතීම සහ අන්තර්ජාල පහසුකම් නොමැතිකම ඔවුන් මුහුණපාන ප්‍රධාන ගැටලු වේ.



නිර්දේශ

- කෘෂිකර්මාන්තය ඩිජිටල්කරණය පිලිබඳ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා ගොවිතැන් කරන ප්‍රදේශ හා ගොවීන් සමඟ සම්බන්ධතා වැඩි දියුණු කිරීම මූලික අවශ්‍යතාවයකි. එබැවින්, ගොවිබිම් ආවරණය කරමින් ගොවීන් වෙත සමීප වීම සඳහා ඒකාබද්ධව හෝ සාමූහිකව සියලු ආකාරයේ සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් දිරිමත් කළ යුතුය.
- තවද, ජංගම යෙදවුම් හරහා ගොවිපළ කුටුම්භයන්ට සාධාරණ වටිනාකමක් එක් කිරීමට හිතකර පරිසරයක් ගොවිජන සේවා මධ්‍යස්ථානවල නොපවතී. එබැවින්, ගොවීන්ගේ තොරතුරු අවශ්‍යතා තත්‍ය කාලීනව සපුරාලීම සඳහා ව්‍යාප්ති හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ හැකියාවන්ගෙන් යුත් නිලධාරීන් නිරන්තරයෙන් සම්බන්ධ වන සම්පත්වලින් පරිපූර්ණ ඒවා බවට ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිවර්තනය කළ යුතුය.
- මෙවැනි ජංගම විසඳුම් වලින් ප්‍රයෝජන ගැනීම සඳහා ගොවීන් ද ප්‍රමාණවත් තරම් තාක්ෂණික වශයෙන් බලගැන්වී නොමැත. එබැවින්, ගොවි ප්‍රජාව ඊ-විසඳුම් භාවිතා කිරීමට හුරු කරවීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවට දායක විය හැකි ය.



03. එළවළු ගොවින්ගේ තීරණ කෙරෙහි බලපාන සාධක

අයි.පී.පී.එම් විජේසිංහ



එළවළු නිෂ්පාදකයන්ගේ තීරණ වලට බලපාන තොරතුරුවල සුලබතාවය හා ඒවාට ප්‍රවේශ වීමේ හැකියාව අධ්‍යනය කිරීම, ගොවීන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපාන සාධක හඳුනාගැනීම හා එළවළු නිෂ්පාදන අංශයේ පවතින තොරතුරු අසමමිතිකභාවය අඩුකිරීම සඳහා අවශ්‍ය උපායමාර්ග යෝජනා කිරීම ප්‍රධාන අරමුණු වේ.

ප්‍රමුඛ සොයා ගැනීම්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක “1920 ගොවි උපකාරක සේවාව” ගොවීන්ගෙන් 33% ක් ද 12% ක් හෙක්ටර් කොඩිබෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ ආයතනයෙන් ක්‍රියාත්මක “6666 මිල තොරතුරු බෙදා හරින සේවාව” පිළිබඳව දැනුවත්ව සිටින ලදි. “ගොවි මිතුරු ඇප්”, “කෘෂි එෆ් එම් වෙබ් රේඩියෝ” සහ “ගොවිප< ඇප්” පිළිබඳව 3% ක් 4% පමණ ප්‍රමාණයක් දැනුවත් වූ අතර අනෙකුත් කිසිම යෙදවුමක දැනුවත් මට්ටම 1% ක ඉක්මවූයේ නැත. බොහොමයක් එළවළු ගොවීන්ට (65%) මෙම තොරතුරු හුවමාරු වන මූලාශ්‍ර වලට ප්‍රවේශ වීමට අඩු විභවතාවයක් පවතින අතර එයට හේතුව වන්නේ ඔවුන්ට සාමාන්‍ය ජංගම දුරකථන (ස්මාට් නොවන) හා ස්ථාවර දුරකථන පැවතීමයි.

- එළවළු වගාකරුවන් දැනට තොරතුරු ලබා ගැනීමට විවිධ මූලාශ්‍ර භාවිතා කරනු ලබන අතර ඒවා නම් ව්‍යාප්ති සේවාව 3/1)ක් පමණ, කෘෂි රසායන අලෙවි මධ්‍යස්ථාන, අසල්වාසී ගොවීන් මගින් 25%) ආදිය වේ.

- එළවළු නිෂ්පාදකයන්ගෙන් 48 %ක් පමණ ලාභදායී ප්‍රතිලාභ ලබා ගෙන ඇත. අනෙක් අතට එළවළු නිෂ්පාදකයින්ගෙන් 86%කට පමණක් ලැබූ ආදායමෙන් තම මූල්‍ය පිරිවැය ආවරණය කර ගත හැකි වෙද්දී 14%කට තම මූල්‍ය පිරිවැයවත් ආවරණය කරගැනීමට නොහැකි විය.

නිර්දේශ

- ගොවින්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකි ක්‍රමවේදයන් පිළිබඳ ගොවින්ගේ දැනුවත්භාවය ඉහල නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ.

- තෙවන පාර්ශවයක් හරහා ඉහළ සිට පහලට තොරතුරු හුවමාරු වන පද්ධතින් වල ඵලදායිතාවය වඩා වැඩි වන නිසා තීරණ ගැනීම සඳහා අවශ්‍ය යාවත්කාලීන තොරතුරු ව්‍යාප්ති නිලධාරීන් හරහා ගොවින්ට ලබා ගත හැකි ක්‍රමවේදයක් සැකසීමට නිර්දේශ කරමි .

- එළවළු නිෂ්පාදකයන්ගෙන් සියයට 52කට පිරිවැයට සරිලන ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වීම නිසා නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට ආනයනික එළවළු බීජ සඳහා බදු සහන බීජ වල මිල අඩු කිරීමේ එකඟතාවය මත ලබා දීම හා පොහොර සහනාධාරයක් එළවළු ගොවින්ට ද ලබා දීමට නිර්දේශ කරනු ලැබේ.

- දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තොරතුරු හුවමාරු වන ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වෙළඳපොල තොරතුරු බෙදාහරින මධ්‍යස්ථානයක් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍රගතව ස්ථාපනය කිරීමට නිර්දේශ කරනු ලැබේ .

- එළවළු වෙළඳපොල මිල උච්චාවචනය පාලනය කිරීමට ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීම සිදු කල යුතු අතර ඒ සඳහා කලාප මට්ටමෙන් නිෂ්පාදන සැලැස්මක් සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ .
- සාමූහික අලෙවිකරණ උපාය මාර්ගයක් භාවිතා කිරීම තුලින් ගොවිපලේ අලෙවි කරන මිල ස්ථාවර මට්ටමක පවත්වා ගත හැකි අතර ඒ සඳහා ගොවින් අභිප්‍රේරණය කිරීමට ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කෙරේ .





04. වී / සහල් අගය දාමය පිළිබඳ අධ්‍යයනය,
පොළොන්නරුව දිස්ත්‍රික්කය
ඩබ්.ඒ.එන්. වීජේසූරිය

මෙරට ප්‍රධානතම සහල් නිෂ්පාදන කලාපය වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී/සහල් අගය දාමය පිළිබඳව විශ්ලේෂණය කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

- අධ්‍යයන ප්‍රදේශය තුළ වී වගාවේ ඒකක අස්වැන්න අක්කරයකට බුසල් **89-138** අතර පරාසයක පැවතුණු අතර **2019** යල් කන්නයේදී ගොවිපල මිල කිලෝග්‍රෑමයට රු.**48.00-52.00** (සුදු දිග වී) අතර පැවතුණි. එම මිල **2018** වසරට වඩා **25%**ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.
- වී/සහල් අගයදාමය තුළ අගය එකතු කිරීම අවස්ථා දෙකකදී පමණක් සිදුවන අතර එනම්, ගොවිපල මට්ටමේදී ගොවියා විසින් ද **(14%)** සහල් මෝල් හිමියා විසින් ද **(24%)** සිදු කරනු ලබයි. අධ්‍යයන කාල සීමාව තුළ දී නිෂ්පාදන ප්‍රදේශවල වී ගොවියාට ලැබුණු මිල සහ කොළඹ සහල් සිල්ලර මිල අතර අනුපාතය **1-97-2.2** අතර පැවතුණි.
- පොළොන්නරුවෙහි ප්‍රධාන සහල් මෝල් හතර සතු සහල් වෙළඳපොළ කොටස (Concentration Ratio) **2011** වසරේ **30%**ක් ව පැවති අතර එය **2019** වන විට **50%** දක්වා තවදුරටත් වර්ධනය වී තිබුණු අතර එය කතිපයාධිකාරී (Oligopsony) තත්වයක් විය. මධ්‍යම මට්ටමේ සහල් මෝල් හිමියන් විශාල පරිමාණ තත්වය දක්වා වර්ධනය වී තිබූ අතර විශාල සහල් මෝල් හිමියන් බිත්තර වී, පොහොර, ඇසුරුම් වැනි යෙදවුම් කර්මාන්ත වලට ව්‍යාපාරය විවිධාංගීකරණය කර තිබුණි.

- සහල් මොල් මඟින් සහල් නිවුඩු (Rice bran), සහල් පොලිෂ් (Rice Polish) දහයියා සහ පිළිස්සුණු දහයියා (Rice Husk Ash)අතුරු නිෂ්පාදන ලෙස නිපදවෙන අතර මෙයින් තැම්බූ ,Parboiled Rice bran මඟින් Rice Oil නිපදවීම කරනු ලබයි. එය බෙහෙවින් පෝෂණ ගුණයෙන් ඉහළ වන අතර එම කර්මාන්තය ප්‍රාථමික මට්ටමේ පවතී.

නිර්දේශ

- ඉහළ වී අස්වනු ලබන ගොවීන්ගේ ශශ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් අධ්‍යයනය කර ඒවා අනෙක් ගොවීන් අතරට හඳුන්වා දීම)Replication) මඟින් ඵලදායීතාවය ඉහළ නැංවීම.

- සතුටුදායක ප්‍රගතියක් දක්වන මධ්‍ය පරිමාණ සහල් මෝල් වලට සහ ප්‍රධාන ආහාර වෙළඳ සමාගම් වලට විශාල පරිමාණ සහල් මෝල් කිහිපයක් විශේෂයෙන් නැගෙනහිර පළාතේ අනුරාධපුරය, මන්නාරම ආශ්‍රිත ග්‍රාමීය නිෂ්පාදන ප්‍රදේශවල ඉදිකිරීමට ආයෝජන දිරිමත් කිරීම. කුඩා පරිමාණ සහල් මෝල් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් හඳුන්වා දීම.

- Rice bran oil, Rice husk ash කර්මාන්ත සඳහා ආයෝජකයින් දිරිමත් කිරීම මඟින් අගය දාමය සංවර්ධනය කිරීම. සහල් ආශ්‍රිත වෙනත් අගය වැඩි දියුණු කළ කර්මාන්ත සඳහා දිරිගැන්වීම් සිදු කිරීම.

05. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයට රජයේ ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම

එම්.ඩී.ඩී පෙරේරා



සෑම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයක්ම ආර්ථිකය සහ ජනගහනයේ ලක්ෂණ අනුව සමාජයට ධනාත්මක බලපෑමක් මෙන්ම අහිතකර බලපෑමක් ඇති කරනු ඇත. ශ්‍රී ලංකාවේ සහල්වල ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පසුගිය දශක දෙක තුළ ක්‍රියාත්මක කරන ලද රජයේ ප්‍රතිපත්ති ඇගයීමට මෙම අධ්‍යයනය උත්සාහ කරයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. වී නිෂ්පාදනයට අදාළ ප්‍රතිපත්ති සියල්ල වාර්මාර්ග, වී ගොවිතැන සහ විවිධාංගීකරණය, ඉඩම්, පොහොර සහනාධාර, වාර්මාර්ග සහනාධාර, අනුවර්තනය, පර්යේෂණ හා සංවර්ධන, වී අලෙවිකරණය සහ වෙළෙඳ ප්‍රතිපත්ති ලෙස වර්ගීකරණය කළ හැකිය.

2. සිල්ලර මිල සහ සහතික කළ මිල අතර ආන්තිකය පිළිවෙළින් නාඩු සහල් සහ සම්බා සහල් සඳහා පිළිවෙළින් 1.26 සහ 1.52ක් වේ.

3. එක පාරිභෝගික උපයෝගීතා මට්ටම් පවත්වා ගනිමින් නිෂ්පාදන ප්‍රමාණය දිරිගැන්වීම සඳහා ගොවිපොළ ගේට්ටු මිල ඉහළ නැංවීමේ හැකියාව පවතී.

4. නිෂ්පාදක මිල ඇස්තමේන්තුව සහ වෙළෙඳපොළ මිල සහාය ඇස්තමේන්තුවල සෘණාත්මක අගයක් ඇති අතර එයින් ඇඟවෙන්නේ ශ්‍රී ලංකාවේ පවතින රජයේ ප්‍රතිපත්තිමය මෙවලම් අඩුම ගොවිපොළ දොරටුවක් සහ දේශීය වෙළෙඳපොළ මිලක් ඇති කරන අතර එමගින් භාණ්ඩ නිෂ්පාදනය අධෛර්යමත් කරන බවයි.

5. තොරතුරු සඳහා වැඩි ප්‍රවේශය අස්වැන්න සඳහා ධනාත්මක බලපෑමක් ඇති කරන අතර දේශගුණික විචල්‍යයන් විශේෂ විර්ෂාපතනය වී අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

නිර්දේශ

වෙළඳපළ විකෘති කිරීමේ පියවරයන්ගෙන් සහ බිලැන්කට් ආදායම් හුවමාරුවලින් ඉවතට යන කෘෂිකාර්මික ප්‍රතිපත්ති නිර්දේශ කරනුයේ තිරසාර ඵලදායිතා වර්ධනයක් සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ලබා දීමට උපකාරී වන උපායමාර්ගික ආයෝජන කෙරෙහි අවධානය යොමු කරමිනි. එමඟින් ගොවි පවුල් සඳහා ආදායම් අවස්ථා වැඩි කිරීම සහ ගොවි සංක්‍රමණය අඩු කිරීම සිදු වේ. තවද, දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමට ගොවීන්ගේ ධාරිතාව ඉහළ නැංවීමට සහ විශේෂයෙන් වර්ෂාපතන විචල්‍යතාවයට සහාය වන ප්‍රතිපත්තිමය උපකරණ නිර්දේශ කෙරේ.

06. කිරි කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය

එච්.එම්.එස්.ජේ.එම් හිටිහාමු

කිරි කර්මාන්තයේ පවතින අගය දාමයේ ක්‍රියාකාරින් හඳුනා ගැනීම සහ පවතින එක් එක් අගය දාමයේ ක්‍රියාකාරින් විසින් සම්පත් උපයෝජනයේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. කිරි කර්මාන්තයට අදාළව ශ්‍රී ලංකාවේ ප්‍රධාන අගය දාමයන් **05**ක් හඳුනා ගෙන ඇති අතර වඩාත්ම ප්‍රචලිත අගය දාමය ලෙස කිරි ගොවීන් කිරි නිෂ්පාදනය කර කිරි විධිමත් එකතු කරන්නන් සඳහා ලබාදෙනු ලබයි. විධිමත් කිරි එකතු කරන්නන් එම කිරි ප්‍රවාහනය කර සකසා අවශ්‍ය පරිදි පාරිභෝගිකයා වෙත ලබාදේ. එමෙන්ම කිරි නිෂ්පදකයින් (තෘණ ආහාර, ජලය) යෙදවුම් කාර්යක්ෂමව යොදා නොගන්නා බව පෙනී ගියේය.
2. කිරි නිපදවන්නන්ගෙන් **6%** පමණ අතුරු නිෂ්පාදන සිදු කිරීම සඳහා යොමු වී ඇති අතර කිරි ටොෆි සහ සාම්ප්‍රදායික මී කිරි නිෂ්පාදකයන් ඉතා හොඳ ව්‍යවසායකයින් ලෙස හඳුනා ගත හැක.
3. ආර්ථික විශ්ලේෂණයට අනුව ශ්‍රම පිරිවැය සමස්ත නිෂ්පාදන පිරිවැයෙන් අඩක් සහ සාන්ද්‍ර ආහාර පිරිවැය මුළු පිරිවැයෙන් **46%** වේ. කිරි නිෂ්පාදන ගොවිපලක කිරි දෙනුන් **3-6** ක් අතර ඇති විට නිෂ්පාදන පිරිවැය රු.**53.40** ක් වන අතර කුඩා පරිමාණයේ ගොවිපළක නිෂ්පාදන ලාභදායිත්වය ඉහළ නැංවීමට සුදුසුම සතුන් සංඛ්‍යාව ලෙස කිරි දෙනුන් **3-6** ක් අතර ප්‍රමාණයක් සිටිය යුතු බව විශ්ලේෂණය මඟින් ඔප්පු විය.



නිර්දේශ

1. කිරි ගොවීන් කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමට දිරි ගැන්වීම.

2. කිරි නිෂ්පාදකයින්ගේ යෙදවුම් භාවිතය පිළිබඳ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අදාළ දැනුම පුහුණු හා ප්‍රායෝගික වැඩමුළු මඟින් ඉහළ නැංවීම.

3. කුඩා පරිමාණයේ කිරි ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගව පට්ටියක සිටිය යුතු කිරි දෙනුන් සංඛ්‍යාව හා නිෂ්පාදන පිරිවැය පාලනය කිරීම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම, එමෙන්ම සම්පත් උපයෝගිතාවය ඉහළ නැංවීම සඳහා කිරි නිෂ්පාදනය තිරසර ආර්ථික ඒකකයක් ලෙස දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා සහයෝගය ලබාදීම.

07. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා (පොල් මද ආශ්‍රිත නිෂ්පාදන) ගෙවතු තුළ පොල් වගාවේ බලපෑම සොයා බැලීම

- ජී.වී.එන් අයෝමී

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි ගෙවත්තේ විභවතාවය සොයා බැලීමයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රධාන බාධාව, සාපේක්ෂ වශයෙන් අස්ථායී වෙළඳපල තත්ත්වයන් බහුල වීම.

2. කෘමි හානි නිසා වාර්ෂිකව පොල් ගස්වලට හානි සිදුවේ. අස්වැන්න පාඩුව ජාතික නිෂ්පාදනයෙන් 15%ක් ලෙස වාර්තා වේ.



3. අනෙකුත් ආසියාතික රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයේ ඵලදායිතාව අඩු බව ද අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. මෙම ගැටලුව මඟහරවා ගැනීම සඳහා හොඳ කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම අවශ්‍ය වේ.

4. ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා සැකසුම් අංශයේ නවීන තාක්ෂණික දැනුමේ අවශ්‍යතාවය නිෂ්පාදකයින් අවධාරණය කළේය.

නිර්දේශ

පවතින ඉඩ ප්‍රමාණය අනුව නාගරික හා අර්ධ නාගරික ගෙවතුවල පොල් සිටුවීමෙන් ගෙවතුවල හිඩැස් පිරවීම ප්‍රවර්ධනය කිරීම. පවතින ඉඩ ප්‍රමාණයේ ගස් එකකින්, දෙකකින් සහ තුනකින් හිඩැස් පිරවීමේ හැකියාව, කෘමි හානි නිසා වාර්ෂිකව පොල් ගස්වලට හානි සිදුවේ. අස්වැන්න පාඩුව ජාතික නිෂ්පාදනයෙන් 15%ක් ලෙස වාර්තා වේ.

අනෙකුත් ආසියාතික රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයේ ඵලදායිතාව අඩු බව ද අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. මෙම ගැටලුව මඟහරවා ගැනීම සඳහා හොඳ කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම අවශ්‍ය වේ.

ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා සැකසුම් අංශයේ නවීන තාක්ෂණික දැනුමේ අවශ්‍යතාවය නිෂ්පාදකයෝ අවධාරණය කළහ.

08. ශ්‍රී ලංකාවේ බීජ අංශයේ සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා බීජ අංශයේ පවතින ගැටලු සහ විභවතාවයන් පරීක්ෂා කිරීම

යූ.ඩී.ආර් උදාරි

ශ්‍රී ලංකාවේ බීජ අංශයේ සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා බීජ අංශයේ පවතින ගැටලු සහ විභවතාවයන් පරීක්ෂා කිරීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ප්‍රමිතියෙන් තොර බීජ භාවිතය නිසා ඵලදායිතාව අඩුවීම, පළිබෝධ සහ රෝග, අස්වැන්නේ ප්‍රමිතිය අඩුවීම, ඒ සඳහා ගොවීන්ට වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් නොමැති වීම ආදී විවිධ ගැටලු මතුවී තිබේ.

2. ශ්‍රී ලංකාවේ වාර්ෂික බීජ ආනයන වියදම සහ ආනයනික බීජ ප්‍රමාණය ඉහළ යමින් පවතී. එය රටේ විදේශ විනිමය සංචිතවලට අහිතකර ලෙස බලපාන අතර ඉහළ විදේශ යැපීම හේතුවෙන් සැලකිය යුතු අවදානමක් ඇත. විදේශීය රෝපණ ද්‍රව්‍ය සැලකිය යුතු ලෙස අඛණ්ඩව ආනයනය කිරීම රටේ දේශීය ජාන සම්පත් පදනම ක්ෂය වීමට හේතු විය හැකිය.

3. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ අන්තර් ක්‍රියාකාරිත්වය නව ප්‍රවනතාවයක් නොවුණත්, තවමත් එය ඉතා පහළ මට්ටමක පවතී. බීජ ගුණනය කිරීමේ ක්‍රියාවලිය සඳහා බොහෝ දුරට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් තිබුණ ද, බීජ නිෂ්පාදනයේ මුල් අවධියේ ආයෝජනය කිරීමට පුද්ගලික අංශය උනන්දු නොවෙයි. එබැවින් හොඳ තත්ත්වයේ බීජ නියමිත වේලාවට ලබා ගැනීම සහතික කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.



නිර්දේශ

1. බීජ කේෂ්ත්‍රයේ වත්මන් ගැටලු විසඳීමට, 2003 අංක 22 දරන බීජ පනතේ දැනට පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. එම නිසා වර්තමාන නීති අවශ්‍යතාවයන්ට සහ විද්‍යාත්මක සහ කෘෂිකාර්මික සංවර්ධනයේ නව ප්‍රවණතාවලට අනුකූලව වන ලෙස එහි සංශෝධන ඇති කිරීම හෝ නව පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීම කළ යුතුය.

2. රටේ බීජ අවශ්‍යතාවය සපුරාලීම සඳහා රාජ්‍ය අංශයේ බීජ සැපයුම ප්‍රමාණවත් නොවෙයි. රට තුළ ශක්තිමත් බීජ අංශයක් සංවර්ධනය කිරීම සඳහා අදාළ සහ ඵලදායී රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (Public Private Partnerships) හරහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතර සහයෝගී ප්‍රයත්නයක් අවශ්‍ය වේ. මේ සඳහා රජය විසින් පෞද්ගලික අංශයේ මැදිහත්වීම දිරිමත් කළ යුතුය.

3. විධිමත් අංශයේ බීජ (Formal Seeds) නිෂ්පාදනය මගින් රටේ සම්පූර්ණ බීජ අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකිය. එබැවින් ගොවිජන සේවා මධ්‍යස්ථානවල ප්‍රධාන මැදිහත්වීම ඇතිව බීජ ව්‍යාප්ති සේවය හරහා අවිධිමත් බීජ (Informal Seeds) නිෂ්පාදන ක්‍රම වැඩිදියුණු කළ යුතුය. බීජ නිෂ්පාදනයේ විවිධ අංශ පිළිබඳව ගොවීන් පුහුණු කිරීම සහ බීජ නිෂ්පාදනය සඳහා ඔවුන් පෙළඹවීම ගුණාත්මක බීජ ලබා ගැනීම සහතික කරනු ඇත.

09. ගනුදෙනු පිරිවැය : අර්තාපල් සහ රතුළූණු

ඩබ්.එච්.ඩී ප්‍රියදර්ශන

අර්තාපල් සහ රතුළූණු අස්වැන්න පාරිභෝගිකයා දක්වා බෙදා හැරීමේ දී ඊට වැය වන මුළු පිරිවැය තුළ අඩංගු වන සැගවුණු පිරිවැය කොටසක් ලෙස ගනුදෙනු පිරිවැය ඇතුළත් වීමෙන් පාරිභෝගික මිල උච්චාවචනය වීමේ ප්‍රවණතා පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය ආරම්භ කර තිබේ.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. අර්තාපල් සහ රතුළූණු විශාල ප්‍රමාණයක් සම්ප්‍රදායික සැපයුම් දාම ඔස්සේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සහ කොළඹ මැනිං වෙළඳපළ වෙත සැපයේ.

2. සාමාන්‍යයෙන් ගොවීන් තම නිෂ්පාදන එකතුකරන්නන් වෙත විකුණා හෝ ප්‍රවාහන නියෝජිතයන් හරහා තොග වෙළෙඳ පොළේ කොමිස් නියෝජිතයන් වෙත යවයි.

3. පෞද්ගලික අංශයේ කොමිස් නියෝජිතයන් සහ මහා පරිමාණ වෙළෙඳුන් අර්තාපල් සහ රතු ලූනු අලෙවි කිරීමේදී විශාල කාර්යභාරයක් ඉටු කරයි.

4. වඩාත් පොදු අලෙවිකරණ නාලිකාව වනුයේ ගොවියා- එකතු කරන්නා-තොග වෙළෙන්දා-සිල්ලර වෙළෙන්දා-පාරිභෝගිකයා යන්නයි.

5. ප්‍රධානම ගැටලුවක් වන්නේ දැනුවත් තීරණ ගැනීමට නිෂ්පාදනය සහ අලෙවිකරණය යන දෙක සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු හිඟ වීමයි.

නිර්දේශ

I. ගොවීන් සංවිධානගත කොට ඔවුන්ව සුපිරි වෙළඳසැල්, හෝටල්, ආපනශාලා, රෝහල් සහ සිල්ලර වෙළෙන්දන් වැනි ගැනුම්කරුවන් සමඟ සෘජුවම සම්බන්ධ කිරීමෙන් සැපයුම් දාමයේ අතරමැදියන් සංඛ්‍යාව අඩු කිරීම, ගබඩා පහසුකම්, ශීතාගාර, පැටවීමේ සහ බර කිරන පහසුකම් හරහා වෙළඳපළ යටිතල පහසුකම් වැඩිදියුණු කළ යුතුය.

10. ශ්‍රී ලංකාවේ කුළුබඩු කර්මාන්තයේ සමාජ - ආර්ථික තත්ත්වය සහ වර්තමානයේ එම කර්මාන්තය මුහුණ දී ඇති ගැටලු සහ විභවතා (ගම්මිරිස් වගාව ආශ්‍රිත අධ්‍යයනය)

ආර්.එල්.එන් ජයතිස්ස

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රධානතම කුළුබඩු බෝගයක් වන ගම්මිරිස් බෝගය සම්බන්ධයෙන් වන අතර ගම්මිරිස් වගාවේ ඵලදායීතාවය පහළ මට්ටමක පැවතීමට හේතු හා පොදුවේ ගම්මිරිස් වගාවේ දියුණුව කෙරෙහි ඇති බාධක ඇතුළත් විෂය පථය පිළිබඳව පර්යේෂණය කිරීම

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ගම්මිරිස් වගාකරතිබූ ඉඩම්වල විශාලත්වය කාණ්ඩ හයක් යටතේ විග්‍රහ කළ හැකි අතර එයින් කුඩාම කාණ්ඩය වූ අක්කර **0.25-0.5** අතර ඉඩම් කැබලි **13%**ක් ද වැඩිම ඉඩම් කැබලි ප්‍රමාණය වූ අක්කර **0.5-1.0** අතර ඉඩම් **33%**කි. ඊළඟට වැඩිම ඉඩම් කැබලි ප්‍රමාණයක් එනම් **29%** අක්කර **1.1-2.0** අතර විශාලත්වය සහිත ඒවා විය. අක්කර හතරට වැඩි ඉඩම් කැබලි මුළු ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් **8%**ක් විය.

2. ආදායම් මාර්ගයක් වශයෙන් ගම්මිරිස් වගාවට හිමිවී ඇති ස්ථානය සැලකුවිට ගම්මිරිස් ගොවීන්ගෙන් **63%**ක ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබුණේ ගම්මිරිස් වගාව වූ අතර **37%** ක් වෙනත් ආදායම් මාර්ගයක් ප්‍රධාන රැකියාව වශයෙන් නියැලෙමින් ගම්මිරිස් වගාවද කරගෙන ගිය ගොවීන් විය.

නිර්දේශ

1. ගම්මිරිස් වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීමට පුළුල් ජාතික වැඩපිළිවෙළක් හඳුන්වා දීම තුළින් වගාවේ ඵලදායීතාවය නැංවීමට ගොවීන් උනන්දු කිරීම.
2. අපනයන කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටම් ව්‍යාප්ති සේවා තවදුරටත් ශක්තිමත් කර නව තාක්ෂණය ගොවීන් වෙත ගලා යාම පුළුල් කිරීම.
3. ගම්මිරිස් සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය වර්තමානයට වඩා ශක්තිමත් කිරීම හා ගම්මිරිස් සැකසුම් කලාප ගම් මට්ටමින් ඇරඹීම.
4. ගම්මිරිස් අලෙවිකරණය පිළිබඳ ගොවින්ට හොඳ අවබෝධයක් නොමැති නිසා පුළුල් අවබෝධයක් ලබා දීම.
5. නව තාක්ෂණය ගොවි ප්‍රජාවට ලබා දීම යටතේ නව තාක්ෂණික පුහුණුව සහ ශ්‍රේණි ගත කිරීම.
6. වියළීම තෙල් නිස්සාරණය/ කුඩු සැකසීම යනාදිය සඳහා නිපදවා ඇති යන්ත්‍රෝපකරණ ගොවීන්ට ලබා ගැනීමේ හැකියාව තව තවත් වැඩි කිරීම

11. උතුරු පළාතේ අතිරේක බෝග වගාව ගැටලු සහ විසඳුම්

ආර්.එල්.එන් ජයතිස්ස

උතුරු පළාතේ අතිරේක බෝග අංශයේ පවතින ගැටලු අධ්‍යයනය කිරීම සහ එම ගැටලුවලට ප්‍රතිපත්තිමය යෙදවුම් සහිත යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයාගැනීම්

ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවල දී සුළු වාරිමාර්ග පද්ධති බිඳ වැටීම් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු විය. වගා ළිං දිගු කලක් අබලන් තත්ත්වයක පැවතීම හේතුවෙන් අතිරේක බෝග වගාවන්ට ජලය හිඟ වී තිබේ. ගුණාත්මක බීජ හිඟය, වගා පිරිවැය, කන්නයේ නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගැනීමට නොහැකි වීම සහ වගා කළ හැකි ඉඩම් සඳහා ප්‍රවේශවීමේ දුෂ්කරතා වැනි ගැටලු ද අතිරේක බෝග අංශයේ ගැටලු ලෙස අනාවරණය කර ගෙන තිබේ.

3. ආහාර ආනයනය සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති , ව්‍යාප්ති සේවා සඳහා කෘෂිකර්ම නිලධාරීන්ගේ හිඟතා, යටිතල පහසුකම් නොමැතිකම සහ ශ්‍රම, පළිබෝධ, රෝග සහ සත්ව හානි සඳහා වූ රජයේ ප්‍රතිපත්ති ද අඩු ඵලදායීතාවයට සහ අඩු නිෂ්පාදනයට හේතු වී තිබේ.

නිර්දේශ

1. මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමය යටතේ පළාතේ වැව්වල ජල ධාරිතාව වැඩි කිරීම.

2. මධ්‍යම හා කුඩා වැව්වල රොන්මඩ දැමීම සහ ජල ධාරිතාව පුළුල් කිරීම හා ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම පිළිබඳව ගොවීන්ට පුහුණුවක් ලබාදීම.

3. ඉඩම් අයිතිය නිරාකරණය කිරීම සහ දැනටමත් වගා කර ඇති හේන් ඉඩම් සහ ආරක්ෂක හමුදාවන් විසින් පාලනය කරනු ලබන අනෙකුත් ඉඩම් නිදහස් කිරීම.

4. ගුණාත්මක බීජ ලබාදීමෙන් විභව අස්වැන්න සහ ගොවි අස්වැන්න අතර පවතින විශාල පරතරය අවම කර ගත හැක.

12. නිෂ්පාදකයින්, විකුණුම්කරුවන් සහ පාරිභෝගිකයින් අතර වෙළඳපළ සබැඳියක් නිර්මාණය කිරීම සඳහා ජංගම දුරකථන යෙදුමක් ප්‍රවර්ධනය කිරීම

එච්.එම්.ජේ.කේ හේරත්

අලෙවිකරණ ගැටලු සහ පසු අස්වනු අලාභය යන දෙකම අවම කර ගැනීම සඳහා කෘෂිකාර්මික වෙළඳපොලේ ගොවීන්, විකුණුම්කරුවන් සහ පාරිභෝගිකයින් අතර සම්බන්ධයක් ඇති කිරීම අරමුණින් හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ භූගෝල විද්‍යා තාක්ෂණික ඒකකය විසින් මෙම ජංගම දුරකතන යෙදුම හඳුන්වා දී තිබේ. ස්මාර්ට් දුරකතන හිමියෙකුට තම නිවසේ සිට ඇසිල්ලකින් පවුලට අවශ්‍ය නැවුම් එළවළු, පලතුරු, මස්, මාළු බිත්තර වැනි ආහාර ද්‍රව්‍ය ඇනවුම් කර නිවසට ම ගෙන්වා ගැනීමේ හැකියාව මෙමඟින් ලැබේ.

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය සමඟ එක් ව මෙම යෙදවුම වැඩි දියුණු කර තිබේ. සුපිරි පොළ මෘදුකාංගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම භාවිතා කළ හැකිය. මෙම යෙදුම භාවිතයෙන් වෙළඳපොළ කටයුතු සිදු කරගන්නා පරිශීලකයන්ට තමා ලබා ගන්නා සේවය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට ද හැකියාව සපයා තිබේ.

මෙය නිරන්තරයෙන් යාවත්කාලීන වන අතර එය අඛණ්ඩව ක්‍රියාත්මක වන්නකි. විශේෂයෙන් හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුහුණු අංශය විසින් පවත්වන පුහුණු වැඩසටහන් අතර තුර පුහුණුලාභීන්ව මෙම යෙදුම පිළිබඳව දැනුවත් කිරීම සිදු කරයි.

අවසන් නොකළ අධ්‍යයන

01. කිරි කර්මාන්තයේ සංවර්ධනයට අදාළව 2006 ප්‍රතිපත්තිය විශ්ලේෂණය කිරීම

එච්.එම්.එස්.ජේ.එම් හිටිහාමු

2006 කිරි නිෂ්පාදන සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගවල බලපෑම අවබෝධ කර ගැනීම. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතිවල අදාළත්වය, සඵලතාවය සහ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම



ප්‍රමුඛ සොයා ගැනීම්

1. **2006** කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට සකස් කරන ලද ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් අංශ කිහිපයකම අවධානයට යොමු කොට තිබුණි. මෙහිදී ප්‍රධාන වශයෙන් දියර කිරි වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීම, දේශීය එල ගවයන් හා මී ගවයන් පට්ටි වැඩි දියුනු කිරීම, පවතින යැපුම් ගොවිපලවල් වානිජ ගොවිපල බවට පත් කිරීම, කිරි නිෂ්පාදනයේ ආනයන හා මූල්‍ය ප්‍රතිපත්තිය නියාමනය කිරීම, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ ගොවිපල ප්‍රවර්ධනය කිරීම, කිරි ගොවියන් සවිබල නැංවීම යන අංශ කෙරෙහි අවධානය යොමු කර තිබුණි. මෙම ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා පශු සම්පත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඒ තුළින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට පියවර ගෙන ඇත.

2. ගව පට්ටි සංවර්ධනයට අදාලව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් කෘතිම සිංචන ක්‍රියාවලිය මඟින් දේශීය කිරි දෙනුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට අදාල ජාන සංයුතිය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදු කෙරෙන අතර **2006** ප්‍රතිපත්තියට අනුකූලව ජර්සි සහ ෆ්‍රීෂියන් ශුක්‍රාණු නිෂ්පාදනය දේශීයව වැඩිදියුනු කිරීම සඳහා කුණ්ඩසාලේ සහ පොලොන්නරුව කෘතිම සිංචන මධ්‍යස්ථාන දියුනු කර ඇත. කෙසේ වෙතත් කෘතිම සිංචන කාර්ය සාධනය පහත් මට්ටමක පවතින අතර ගැබ් ගැනීම සඳහා කෘතිම සිංචන වාර **2-3**ක් අවශ්‍ය බව අනාවරණය විය.
3. සත්ව ආහාර ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්තියට අනුකූලව විවිධ වැඩසටහන් සත්ව නිෂ්පාදන හා සෞඛය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර ඇතත්, කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ශාඛමය ආහාර සකස් කර ගැනීම, ඒවා කල් තබා ගැනීම සහ නියමිත ලෙස සතුන්ට ලබාදීම පිළිබඳව ගැටලු පැවතීම.

නිර්දේශ

1. 2006 වර්ෂයේ ක්‍රියාත්මක කිරි සංවර්ධන ප්‍රතිපත්තියේ අරමුණු වලට අදාලව කිරි නිෂ්පාදනය වැඩි දියුනු කිරීමේ අරමුණින් විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර තවදුරටත් ප්‍රතිපත්තියේ අරමුණු ඉහළ නංවාලීම සඳහා පෝෂණය, අභිජනනය, තාක්ෂණය හා සත්ව පාලනය කළමනාකරණය පිළිබඳව දැනුම වැඩි දියුණු කිරීම සඳහා අවධානය යොමු කල යුතුය.

2. කෘතිම සිංචන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා හා සතුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම.

3. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට අදාලව යෙදවුම් භාවිතයේදී ශාකමය ආහාර සැපයීම සම්බන්ධව ගොවීන්ගේ අවධානය වැඩි කළ යුතු අතර, තෘණ වගාව සඳහා ගොවීන් යොමු කිරීමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, තෘණ කල්තබා ගැනීම සහ සතුන්ට තෘණ ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම.

02. දේශීය දෙමුහුන් මිරිස් වගාව සහ වියළි මිරිස් නිෂ්පාදනය: වත්මන් තත්ත්වය සහ විභවය

ඩබ්.එච්.ඒ ශාන්ත



දේශීය දෙමුහුන් මිරිස් වගාව සහ ඒවා භාවිතා කර වියළි මිරිස් නිෂ්පාදනයෙහි වත්මන් තත්ත්වය සහ විභවතාව තහවුරු කර ගැනීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ඉහළ අස්වැන්නක් සහිතවීම, කොළ කොඩවීමේ රෝගය සඳහා සාපේක්ෂව ඉහළ ප්‍රතිරෝධයක් දැක්වීම, බෝගයේ දිගු ආයු කාලය, ශාකය සාපේක්ෂව උසින් වැඩිවීම නිසා අස්වැන්න නෙලීමේ පහසුව ආදී වාසිදායක තත්වයන් හේතුවෙන් ආනයනික දෙමුහුම ප්‍රභේදවලට වඩා දේශීය දෙමුහුම් මිරිස් ප්‍රභේදය (MICH HY 1) ගොවින් අතර ඉහළ ජනප්‍රියත්වයක් ලබමින් පවතී.

2. දේශීය දෙමුහුම් මිරිස් බීජවල (MICH HY1) ඉහළ වෙළෙඳපොළ මිල කුඩා පරිමාණ ගොවීන්ට වාණිජ මට්ටමේ වගාවක් සඳහා යොමුවීමට බාධාවක් ලෙස හඳුනාගත හැක.
3. අස්වැන්න නෙළන කාලය තුළ පවතින අයහපත් දේශගුණික තත්ත්වයන්, ඉහළ ශ්‍රම ඉල්ලුම සහ අඩු වෙළෙඳපොළ මිල හේතුවෙන් ඇතිවන අඩු ලාභදායී තත්වය නිසා මිරිස් ගොවීන් වියළි මිරිස් නිෂ්පාදනය සඳහා යොමුවීමට මැලිකමක් දක්වයි.

නිර්දේශ

1. දේශීය දෙමුහුම් මිරිස් ප්‍රභේදවල බීජ නිෂ්පාදනය ඉහළ මට්ටමකට පත්කිරීම සඳහා බීජ නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් පවත්වනුලබන පුහුණු සහ අනෙකුත් සහායක වැඩසටහන් මෙන්ම දිරිගැන්වීමේ වැඩසටහන් තීව්‍ර කළ යුතුය.

2. දේශීය දෙමුහුම් මිරිස් බීජ සඳහා උපරිම මිලක් පැනවීමත් පෞද්ගලික අංශයේ බීජ සඳහා වන වෙළෙඳපොළ මිල නියාමනය කිරීම මෙන්ම බීජවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය රෙගුලාසි සහ නියාමනයන් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.

3. දේශීය වියළි මිරිස් සඳහා වඩා හොඳ මිලක් ලබා ගැනීම සඳහා වියළි මිරිස් සඳහා වන ආනයනික බද්ද පාරිභෝගික අභිලාශයන්ද සැලකිල්ලට ගෙන සුදුසු පරිදි සංශෝධනය කළ යුතු අතර එවැනි ක්‍රියාමාර්ග දේශීය වියළි මිරිස් නිෂ්පාදනය දිරිමත් කරනු ඇත.

03. ශ්‍රී ලංකාවේ ලොකුළූණු සම්බන්ධ අගයදාම විශ්ලේෂණය

එම්.ආර්.එන්.කේ රණුක්වැල්ල



ශ්‍රී ලංකාවේ ලොකුළූණු නිෂ්පාදනය හා අලෙවිකරණය සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටලු, බාධක හා විභවයන් හඳුනාගැනීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ලොකුළූණු බීජ නිෂ්පාදනය සඳහා ගොවීන්ගේ හා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් පහළ ගොස් තිබීම හා බීජ නිෂ්පාදනය හා ආනයනය සම්බන්ධ දත්ත හා තොරතුරු නිවැරදිව සටහන් නොවීම.

2. ලොකුළූණු දේශීය බීජ පිරිවැය ඉතා ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.

3. ලොකුළූණු වාර්ෂික හා මාසික අවශ්‍යතාවයට වඩා ඉහළ ආනයනික සැපයුමක් පැවතීම හා අස්වනු කාලයට විශේෂ භාණ්ඩ බදු පැනවීම නිසි ආකාරයට සිදු නොවීම.

නිර්දේශ

1. බීජ නිෂ්පාදනය කිරීම කෙරෙහි ගොවීන් හා පුද්ගලික අංශය දිරිමත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු අතර බීජ නිෂ්පාදනය හා ආනයනය සම්බන්ධයෙන් ක්‍රමවත් දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක විය යුතුය.
2. බීජ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා යෙදවුම් සඳහා රජයේ සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
3. ලොකුළූණු ආනයනය බලපත්‍ර ක්‍රමයකට යටත්ව සිදු කළ යුතු අතර එහිදී මාසික හා වාර්ෂික අවශ්‍යතා පිළිබඳව ගණනය කිරීමක් සිදු කළ යුතුය. එසේම විශේෂ භාණ්ඩ බදු පැනවීම නිසි වේලාවට නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය.

04. බඩ ඉරිඟු සඳහා අගය දාම විශ්ලේෂණය: ගොවිපොළ සිට කර්මාන්ත දක්වා

ආර්.පී විදානපතිරණ



බඩ ඉරිඟු, සත්ත්ව ආහාර හා විවිධ ආහාර කර්මාන්ත සඳහා උපයෝගී කර ගැනීමේදී ඒවායෙහි අගයදාම වල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ සැපයීම සඳහා බඩ ඉරිඟු පිළිබඳ පුළුල් වටිනාකම් දාම විශ්ලේෂණයක් පැවැත්වීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. නව වගාවන් ආරම්භ කිරීමට රසායනික පොහොර සහ කෘෂිරසායන ද්‍රව්‍ය නොමැති වීම, පළිබෝධකයන්ගෙන් සිදුවන වගා හානි (සේනා දළඹුවා), බඩඉරිඟු ධාන්‍ය සඳහා ආනයන සීමා වීම හේතුවෙන් ඇති අධික ඉල්ලුම නිසා කන්නය තුළ නිෂ්පාදන මිලෙහි ඉහළ මිල උච්ඡාවචනය, වන සතුන්ගෙන් සිදුවන හානි, ඉඩම් නොමැතිකම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ වසරේ සිට ගොවීන්ගේ ඉඩම් අත්පත් කර ගැනීම (හේන් වගාබිම්) නිසා වගා කිරීමට ඇති අයිතිය පිළිබඳ ගැටලු, ආනයනික බීජවල ඉහළ මිල සහ අධික යෙදවුම් පිරිවැය ගොවීන් මුහුණ දුන් ප්‍රධාන ගැටලු විය.
2. බඩඉරිඟු සඳහා ඉහළ මිල ගණන් වාර්තාවීම, මූල්‍ය බාධාවන්, ආනයන සීමා කිරීම් (බොහෝ තොග වෙළඳුන් බඩඉරිඟු සඳහා ආනයනකරුවන් ලෙස ද ක්‍රියා කරයි) සහ හොඳ ගබඩා ව්‍යුහයක් නොමැතිකම සහ ගබඩාකිරීමේදී වන හානි පිළිබඳ ගැටළු වෙළඳුන් විසින් මතු කරන ලද ප්‍රධාන ගැටලු විය. ආහාර සහ ආහාර නිෂ්පාදකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළු වූයේ බඩඉරිඟු වල ඉහළ මිල, බඩඉරිඟු සඳහා ස්ථාවර සැපයුමක් නොමැතිකම, මිල අස්ථාවරත්වය, බලශක්ති පිරිවැය සහ ආනයනික යෙදවුම්වල ඉහළ මිලයි.
3. ගොවීන්ගේ ශුද්ධ ආන්තිකය සියයට 30 සිට 36 දක්වා වාර්තා වූ අතර මෙය 2019/20 මහ කන්නයේ (14-24%) වාර්තාවූ ශුද්ධ ආන්තිකයට වඩා වැඩි අගයකි. එකතුකරන්නාගේ ශුද්ධ ආන්තිකය සියයට 1-2ක් ලෙස සටහන් වූ අතර එය 2019/20 මහ කන්නයේ (4%) ලබාගත් ශුද්ධ ආන්තිකය හා සසඳන විට අඩු වී ඇත. තොග වෙළෙන්දන්ගේ ශුද්ධ ආන්තිකය සියයට 6-12ක් ලෙස සටහන් වූ අතර එය 2019/20 කාලපරිච්ඡේදයේ (3%) නිරීක්ෂණය කළ ශුද්ධ ආන්තිකයට වඩා වැඩි විය. එබැවින් බඩඉරිඟු අගය එකතු කිරීමේදී වැඩිම ආන්තිකය රඳවා ගනු ලැබුවේ ගොවීන් විසින් වන අතර ඒය බඩඉරිඟු වගාව ව්‍යාප්ත කිරීමට දිරිගැන්වීමක් වනු ඇත.

නිර්දේශ

1. සත්ත්ව ආහාර නිෂ්පාදනයට බඩඉරිඟු සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා, අගය දාමයේ වැඩි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව උත්ප්‍රේරණය කිරීම අවශ්‍ය වේ. බඩඉරිඟු නිෂ්පාදනය ලාභදායී බැවින් මහ කන්නයේ සහ යල කන්නයේ දී වානිජ බෝගයක් ලෙස ව්‍යාප්ත කිරීමට විශාල හැකියාවක් ඇත. බඩ ඉරිඟු අගය දාමය සංවර්ධනය සඳහා අගය දාමයේ විවිධ අවධිවලදී මැදිහත්වීම් වැදගත් වේ. බඩඉරිඟු සඳහා අගය දාම ශක්තිමත් කිරීම සඳහා අගය දාමය තුළ සිටින විවිධ පාර්ශ්වකරුවන් අතර විශ්වාසය ගොඩනැංවීම අවශ්‍ය වේ.

2. බඩඉරිඟු ආනයනය තහනම් කිරීමත් සමඟ දේශීය නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවිය යුතුය. ගොවීපොළ මට්ටමින් නිෂ්පාදනය සහ අලෙවිය ඉහළ නැංවීම සඳහා යල කන්නයේ වගා ප්‍රමාණය වැඩිකිරීම සහ මහ කන්නයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම වැදගත් වේ. ගුණාත්මක යෙදවුම් (දෙමුහුන් බීජ, පොහොර) සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම; ගොවීන්ට ණය පහසුකම් ලබාදීම; කොන්ත්‍රාත් පදනම මත ගොවිතැන් කිරීම දිරිමත් කිරීම; දේශීය බඩඉරිඟු අභිජනනයය සඳහා කෘෂි පර්යේෂණ සඳහා වැඩි ආයෝජනයක් ඇති කිරීම; විශේෂයෙන්ම පුරන්ව ඇති ඉඩම් ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම; “යාය” වගාව ප්‍රවර්ධනය කිරීම නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා හොඳ ප්‍රවේශයකි.

3. කුකුළු ආහාර නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය ගුණාත්මක බඩඉරිඟු නිෂ්පාදනය සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම සහ අනෙකුත් සේවාවන් සැපයීම අත්‍යවශ්‍ය වේ. ඒම කර්මාන්ත සහ කුකුළු ගොවීන් සඳහා බඩඉරිඟු සැපයීමේ සුරක්ෂිතභාවය තහවරු කළ යුතුය. මුළු බඩඉරිඟු අවශ්‍යතාව දේශීයව නිෂ්පාදනය කළ නොහැකි බැවින් එම නිෂ්පාදකයින්ට බඩඉරිඟු ආනයනය කිරීමට අවසර දීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතුව ඇත.

4. බඩඉරිඟු වෙළෙඳාමෙහි නිරත තොග වෙළෙන්දන් සඳහා මූල්‍යමය ආධාර ලබාදීම මඟින් වසර පුරා මිලදී ගැනීමට සහ විකිණීමට අවශ්‍ය ප්‍රාග්ධනය හැකියාව ඇතිකිරීම වැදගත්වේ. බඩ ඉරිඟු සත්ත්ව ආහාර සහ ආහාර කර්මාන්ත අංශයේ දිගුකාලීන පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන විභව භෝගයකි.



05. එළවළු අලෙවිකරණය සඳහා e-විකිණුම් ක්‍රම භාවිතය : වත්මන් තත්ත්වය, විභවයන් හා සීමාවන්

ජී.ජී.ද.එල්. ඩබ්. සමරසිංහ

ලංකාවේ එළවළු අලෙවිකරණය කටයුතු සඳහා e-විකිණුම් ක්‍රම භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. මේ වන විටත් එළවළු මිලට ගැනීම සඳහා e-විකිණුම් ක්‍රම භාවිතය ඉතා පහළ මට්ටමක පවතී.

2. ප්‍රාදේශීයව මිල දී ගැනීමට නොහැකි විශේෂිත තත්වයන් යටතේ නිපදවූ එළවළු මිල දී ගැනීමට e-විකිණුම් ක්‍රම අඛන්ඩව භාවිතා වේ.

3. e-විකිණුම් ක්‍රම භාවිතයේ දී වඩා වැඩි මිලක් නිෂ්පාදකයින් වෙත ලැබී ඇත.

නිර්දේශ

1. පාරිභෝගික අවශ්‍යතා වඩා හොඳින් ඉටුවන පරිදි, එනම් ඇණවුම් කළ ද්‍රව්‍ය නිවැරදිව, නියමිත ප්‍රමාණයන්ගෙන් ප්‍රමාදයෙන් තොරව ලබා දීමෙන් හා සාම්ප්‍රදායික වෙළඳපොළෙන් ලබා ගන්නා එළවළුවලට සාපේක්ෂව ගුණාත්මයෙන් වැඩි හා මිලෙන් අඩු ලෙස ලබා දීමෙන් e-විකිණුම් ක්‍රම මඟින් එළවළු මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයින් නැඹුරු තර ගැනීමේ යම් හැකියාවක් පවතී.



06. අර්තාපල් අගය දාමය: වර්තමාන තත්වය, අභියෝග සහ සංවර්ධන අවස්ථා

අගයදාම විශ්ලේෂණ ප්‍රවේශය භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ අර්තාපල් බෝග වගා අංශයේ සංවර්ධනයට පවතින බාධාකාරී සාධක හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීම තුළින් එම බාධක මඟහරවා ගැනීමට අදාළ පිළියම් යෝජනා කිරීම අධ්‍යයනයේ අරමුණයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. නිෂ්පාදන ක්‍රියාවලිය සැලකිල්ලට ගැනීමේදී අර්තාපල් ගොවීන් මුහුණ දෙන ප්‍රධානම ගැටලුව වන්නේ ඉහළ ගුණාත්මයෙන් යුතු බීජ අර්තාපල් සාධාරණ/දැරිය හැකි මිලකට ලබා ගැනීමට නොහැකි වීමයි (දේශීය බීජ ප්‍රමාණවත් තරම් නොමැති වීම සහ ආනයනික බීජ මිල අධික වීම)

2. අර්තාපල් අලෙවි ක්‍රියාවලියේ ප්‍රධාන මිල තීරකයන් ලෙස ක්‍රියා කරනුයේ ආර්ථික මධ්‍යස්ථාන වල සිටින අතරමැදියන් (Commission agents) වේ. ගොවීන් සතු වෙළඳපොල පිළිබඳ දැනුම අල්ප වීම සහ ඔවුන් තනි පුද්ගලයන් වශයෙන් ක්‍රියා කිරීම හේතුවෙන් ඔවුන්ගේ කේවල් කිරීමේ හැකියාව අවම වීම මෙයට මූලික හේතුවයි.

3. අර්තාපල් ගොවීන් මුහුණ දෙන අනෙකුත් ගැටළු ලෙස රසායනික පොහොර තහනම් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සමග අවශ්‍ය පොහොර නොලැබී යාම, ඉහළ ශ්‍රම වියදම, ව්‍යාප්ති සේවයේ පවතින දුර්වලතා, විධිමත් ණය පහසුකම් ලබා ගැනීමේ අපහසුතා, ආනයනික අර්තාපල් සමග පවතින වෙළඳපොල තරඟය (ආනයනික අර්තාපල් මිල සාපේක්ෂව අඩු වීම නිසා) හඳුනා ගත හැකි විය.





නිර්දේශ

1. ගොවීන්ට ගුණාත්මක බීජ සාධාරණ මිලකට ලබා ගත හැකි වන පරිදි රජයේ බීජ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

2. නිෂ්පාදන ක්‍රියාවලිය පමණක් නොව අලෙවි ක්‍රියාවලිය පිළිබඳව ගොවීන්ව දැනුවත් කිරීම සඳහා සුදුසු පරිදි ව්‍යාප්ති සේවය වැඩි දියුණු කිරීම.

3. ගොවීන් සාමූහිකව ක්‍රියා කිරීමට පෙළඹවීම **(promote cooperative activities)** තුළින් ණය පහසුකම් ලබා ගැනීම, පිරිවැය අවම කර ගැනීම මෙන්ම සාමූහිකව කටයුතු කිරීම තුළින් කේවල් කිරීමේ හැකියාව වැඩි වීම හේතුවෙන් මිල තීරණය කිරීමේදී වැඩි බලපෑමක් කළ හැකි වීම

4. අර්තාපල් ගොවීන්ටද වරප්‍රසාද හිමිවන ලෙස පවතින වගා රක්ෂණ වැඩසහන පුළුල් කිරීම

5. පර්යේෂණ සහ සංවර්ධන අංශය වැඩිදියුණු කිරීම සහ ඒවායෙහි ප්‍රතිලාභ පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම තුලින් වඩාත් ගුණාත්මක නිෂ්පාදනයක් ලබා ගැනීම

6. දේශීය අර්තාපල් ගොවීන් ආරක්ෂා වන පරිදි දීර්ඝ කාලීන සහ ස්ථායී ආනයන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම

07. සෝයා බෝංචි සඳහා අගය දාම විශ්ලේෂණය

එන්.ජී.ජී. සමන්ත



මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සෝයා බෝංචි සඳහා වටිනාකම් දාමය ඔස්සේ වෙළඳපල අවස්ථා අවබෝධ කර ගැනීම සඳහා පුළුල් අගය දාම විශ්ලේෂණයක් සිදු කිරීමයි.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, සෝයා බෝංචි අලෙවිකරණ ක්‍රමය මුං හෝ කව්පි වැනි අනෙකුත් ක්ෂේත්‍ර බෝගවලට වඩා වෙනස් ය. බොහෝ අවස්ථාවලදී තිරස් මට්ටමින් ස්වාධීනව ක්‍රියා කළද අගය දාම ක්‍රියාකාරීන් අතර ශක්තිමත් සිරස් සම්බන්ධතාවක් පවතී.

2. ඉදිරි වෙළෙඳ ගිවිසුම් ගොඩනැඟ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සෝයා බෝංචි වගා කිරීමේ ජනප්‍රියම ක්‍රමයයි. බීජ, පොහොර, කෘෂි රසායන ආදී සියලුම යෙදවුම් සපයනු ලබන්නේ සැකසුම් සමාගම් විසිනි.
3. විවෘත වෙළඳපොලේ හොඳ තත්ත්වයේ බීජ නොලැබීම, අස්වනු නෙළීමේ සහ රෝපණ මට්ටමේ තාක්ෂණික සහය නොමැතිකම, සුදුසු යන්ත්‍රෝපකරණ නොමැතිකම හේතුවෙන් අධික ශ්‍රම පිරිවැය වැනි ගැටලුවලට සෝයා බෝංචි වගාවේදී ගොවීන් මුහුණ දී සිටිති.

නිර්දේශ

1. බිම් සැකසීමේදී සහ සිටුවීමේදී යන්ත්‍රෝපකරණ හඳුන්වා දීමෙන් සෝයා බෝංචි නිෂ්පාදනයේ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කර ගත හැකිය.

2. දේශීය නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා බීජ, පොහොර වැනි ගුණාත්මක යෙදවුම් නියමිත කාලයට ලබාදීම අත්‍යවශ්‍ය වේ.

3. අනෙකුත් කලාපීය රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය මට්ටමේ විවිධ සෝයා ආහාර සහ නිෂ්පාදනය සාපේක්ෂව අඩුය. සෝයා ආහාර පුළුල් කිරීමේ හැකියාව සහ අවස්ථාව ඉහළ ය. එබැවින් සෝයා ආහාර පරිභෝජනය පුළුල් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම වඩා වැදගත් වේ.

08. ශ්‍රී ලංකාවේ පළතුරු අපනයනය සඳහා සාපේක්ෂ වාසි පිළිබඳ අධ්‍යයනය



ඊ.ඒ.සී.ප්‍රියංකර

වෙළඳපොළ වෙත පලතුරු අපනයනය කිරීමේදී ශ්‍රී ලංකාවට වාසි පවතින පලතුරු වර්ග, ප්‍රධාන තරඟකරුවන් සහ සාපේක්ෂ වාසි සඳහා බලපාන ප්‍රධාන සාධක හඳුනා ගැනීම.

ප්‍රමුඛ සොයා ගැනීම්

1. පැපොල් සහ අන්නාසි අපනයනය සඳහා ශ්‍රී ලංකාවට ලෝක වෙළඳ පොළ තුළ වාසි පවතී.

2. වර්ෂ 2000-2019 කාලපරිච්ඡේදය තුළ පැපොල් අපනයනය සඳහා සාපේක්ෂ වාසි දර්ශකයේ වර්ධනයක් දක්නට ලැබුණද අන්නාසි සඳහා එය පහළ ගොස් ඇත.

3. ශ්‍රම ප්‍රාග්ධන අනුපාතයත් සෘජු විදේශ ආයෝජනයත් අන්නාසි සහ පැපොල් අපනයනය තුළ සාපේක්ෂ වාසි වර්ධනය වීම සඳහා බලපා ඇත.

නිර්දේශ

1. පැපොල් සහ අන්නාසි වගාව සඳහා ඉඩම් සහ ප්‍රාග්ධනය වැඩි වැඩියෙන් ලබාදීමෙන් ඒවා අපනයනය මගින් ශ්‍රී ලංකාවට වාසි ලබා ගත හැකිය. මේ සඳහා රාජ්‍ය අයවැය ප්‍රතිපත්තියත් මූල්‍ය ප්‍රතිපත්තියත් දායක කර ගත හැකිය.
2. අන්නාසි සඳහා පහළ යමින් පවතින සාපේක්ෂ වාසි ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් විකල්ප වෙළඳ පොළ වෙත යොමුවීමට අවශ්‍යය.
3. අන්නාසි සහ පැපොල් වගාවන් සඳහා සෘජු විදේශ ආයෝජන ධෛර්යමත් කළ යුතුය.




09. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පලතුරු අපනයන විභවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය

ඒ.කේ.ඒ දිසානායක



ශ්‍රී ලංකාවේ පලතුරු අපනයන කර්මාන්තය නංවාලීම සඳහා වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා වර්තමාන අපනයන තත්ත්වය කාර්යසාධනය, අපනයන විභවය විශ්ලේෂණය කිරීම සහ අපනයනය සඳහා බලපාන බාධක හඳුනා ගැනීම අධ්‍යයනයේ අරමුණයි.

මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර කටයුතු අවසන් වී පර්යේෂණ වාර්තාව පිළියෙළ කරමින් පවතී.



කෘෂිකාර්මික අලෙවි තොරතුරු ව්‍යාපෘතිය **(Agriculture Marketing Information System - AMIS)**

කෘෂිකාර්මික වෙළෙඳපොළ තොරතුරු සේවාව (AMIS) යනු මිල තොරතුරු (තොග, සිල්ලර සහ ගොවිපළ මිල) එකතු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි. ආහාර ද්‍රව්‍ය පිළිබඳ දෛනිකව තොරතුරු රැස් කිරීමේ හා බෙදා හැරීමේ කාර්යය මූලික කරගත් මේ යටතේ ප්‍රතිපත්ති සම්පාදකයින්, නිෂ්පාදකයින්, වෙළඳුන් හා පාරිභෝගිකයන්ටද මහත් ප්‍රතිඵල ලබා ගැනීමට ඇති අවස්ථාව උදා වේ. ජීවන වියදම් මෙන්ම ආහාර සුරක්ෂිතතාව පිළිබඳව සමාලෝචනය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ සතිපතා පැවැත්වෙන රැස්වීම් සඳහා ආයතනය විසින් රැස් කරනු ලබන තොරතුරු ලබා දීම අඛණ්ඩව සිදු වේ.

මෙම ව්‍යාපෘතියේ දී ආහාර ද්‍රව්‍ය පිළිබඳ මිල තොරතුරු සහ වෙළෙඳපොළ තොරතුරු සිල්ලර වෙළෙඳපොළවල් 09 කින්ද කොළඹ පිටකොටුව තොග වෙළෙඳපොළ මිල ගණන් ද ඊට අමතරව, දිවයිනේ ප්‍රධාන ආහාර නිෂ්පාදනය කරන සහ ආහාර පරිභෝජනය සිදු කරන දිස්ත්‍රික්කයන්හි පිහිටි වෙළෙඳපොළ 30 කින්ද තොග සහ සිල්ලර මිල ගණන් පිළිබඳ තොරතුරු රැස් කර ගනු ලැබේ.

මෙසේ ලබාගත් තොරතුරු අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය විසින් සකස් කරනු ලබන ප්‍රධාන වාර ප්‍රකාශන වන සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව (සිංහල , ඉංග්‍රීසි සහ දෙමළ) සහ මාසික ආහාර තොරතුරු විවරණිකාවෙහි (සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ) පළ කරනු ලැබේ.

මීට අමතරව මොබිටෙල් ‘6666‘කෘෂි මිල තොරතුරු දර්ශකය මගින් ප්‍රධාන වෙළෙඳපොළවලින් එක් රැස් කර ගත් දිනපතා ආහාර ද්‍රව්‍යවල තොග මිල තොරතුරු බෙදා හැරේ. එම තොරතුරු අප ආයතනය විසින් තහවුරු කර වලංගුභාවයට පත් කර තොරතුරු පද්ධතියට එකතු කරනු ලැබේ. මෙහිදී පාරිභෝගිකයින්ට මොබිටෙල් ජංගම දුරකථනයකින් 6666 ඇමතීමෙන් සිංහල සහ දමිළ භාෂාවන්ගෙන් සමන්විත අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරයට (IVR) සම්බන්ධ විය හැකිය.

ප්‍රතිපත්ති සම්පාදකයින්ට අලෙවි තොරතුරු සැපයීම, ප්‍රධාන වාර සඟරා දෙකක් සැපයීම, වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය තුළින් සවිබල ගැන්වීම හරහා ප්‍රතිලාභී ගොවීන්ගේ ආදායම් ඉහළ දැමීම සහ කෘෂිකාර්මික අලෙවිකරණයේ නිරතව සිටින පාර්ශ්වකරුවන් අතර අලෙවි තොරතුරු බෙදා හැරීම අවශ්‍ය වන්නේ නම් වර්තමාන කෘෂිකාර්මික අලෙවි තොරතුරු සේවයට අවශ්‍ය වන වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ සැපයීම මෙහි අරමුණයි. 1979 ආරම්භ කළ මෙය අඛණ්ඩව පවත්වා ගෙනයන ව්‍යාපෘතියකි. ප්‍රතිපත්ති සම්පාදකයින්, වෙළෙන්දන්, පාරිභෝගිකයින්, පෞද්ගලික ව්‍යාපාරකයින් මෙහි ප්‍රතිලාභීන් වන අතර මේ සඳහා භාණ්ඩාගාරය අරමුදල් සපයයි.

2020 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු අවසානය දක්වා සෑම වෙළඳපොළකින්ම පාහේ මිල දත්ත රැස් කිරීමට අප ආයතනයට හැකි වී තිබේ. ස්ථාන 28ක ක්ෂේත්‍ර නිලධාරීන් 28 දෙනෙකු සහ කොළඹ වෙළෙඳපොළෙන් තොරතුරු රැස් කිරීම සඳහා අනියම් පරීක්ෂකවරුන් 11 දෙනෙකු යොදවන ලදී.

කෙසේ වෙතත්, සැප්තැම්බර් 24 වන දින උපාධිධාරීන් බඳවා ගැනීමේ රජයේ වැඩසටහන යටතේ සංවර්ධන නිලධාරීන් ලෙස රජයේ සේවයට බැඳීම සඳහා අනියම් විමර්ශකයින් 28 දෙනෙකුගෙන් 24 දෙනෙකු ඉල්ලා අස් වූහ. COVID වසංගතය හේතුවෙන් රට වසා දැමීම හේතුවෙන් බාධා ඇති වුවද, 2020 ඔක්තෝම්බර් මාසයේදී අප ආයතනය විසින් අනියම් විමර්ශකයින් 12 දෙනෙකු බඳවා ගන්නා ලදී. මීට අමතරව, 6666 නමින් මොබිටෙල් දුරකථන ඇමතුම් සේවාව ද අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර ඒ මඟින් දෛනිකව ආර්ථික මධ්‍යස්ථාන 7ක සිට දෛනික තොග මිල තොරතුරු සපයනු ලැබේ.

පුහුණු වැඩසටහන්

පුළුල් විෂය ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන ආකාරයේ පුහුණු වැඩසටහන්

01. කෘෂි ව්‍යාපාර සංකල්ප භාවිතය සහ අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ නේවාසික වැඩමුළුව

ඩබ්.එච්.ඒ ශාන්ත



අධ්‍යයනයේ අරමුණ කෘෂිකාර්මික උපාධි අපේක්ෂකයින්ට යැපුම් කෘෂිකාර්මික අංශයේ, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කෘෂි සැපයුම් දාමයේ සහ අලෙවිකරණ අංශයේ කෘෂි ව්‍යාපාර සංකල්පවල භාවිතාවන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා අවස්ථාවක් ලබා දීමයි.

මෙය සිවිදින පුහුණු වැඩසටහනකි. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හදාරනු ලබන අවසන් වසර සිසුන් තිස් දෙනෙකු පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූහ.

2021 නොවැම්බර් 28 දින සිට දෙසැම්බර් 01 දින දක්වා හෙක්ටර් කොඩිබැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ නාරායනසාමී ශාලාවේ දී පුහුණු වැඩසටහන පැවැත්වුණි.

අපේක්ෂිත ප්‍රතිඵල

1. හෙක්ටර් කොඩිබැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය හි 'කෘෂිකාර්මික අලෙවිකරණ තොරතුරු පද්ධතිය' පිළිබඳ ප්‍රායෝගික දැනුම සහ අත්දැකීම් සහභාගිවන්නන්ට ලබා දීම.

2. හෙක්ටර් කොඩිබැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයහි පර්යේෂණ අධ්‍යයන සහ අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු වලදී විශේෂයෙන් ම ආහාර බෝග නිෂ්පාදනය සහ අලෙවිකරණය සහ කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍ර ආශ්‍රිතව උගත් පාඩම් පුහුණුලාභීන් සමඟ බෙදා ගැනීම.

3. තෝරාගත් කෘෂිකාර්මික නිෂ්පාදනින්හි අගයදාම පද්ධතිවල ප්‍රධාන පාර්ශවකරුවන් සහ ඒ ආශ්‍රිත අතරමැදියන් සමඟ අදහස් හුවමාරුකර ගැනීමට සහ ප්‍රායෝගික ගැටළු සාකච්ඡා කිරීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීම.

පුහුණු කණ්ඩායම

ශාන්ත හේවගේ, සිදත් බණ්ඩාර, මාලින්ද සෙනෙවිරත්න, ආචාර්ය සමන්ත පල්ලියගුරු, ගීතානි සමරසිංහ, ආචාර්ය චමිත් ප්‍රියංකර, තිලනි පද්මජානි, නාලක විජේසුරිය, ආචාර්ය අසංග විජේසිංහ, සුභාෂිනි අබේසිංහ, ලාල් හෙට්ටිගේ, ගාමිණී හඳුන්ගේ.

02. සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

එස්.එම්.ඒ.සමරකෝන්

සමාජ සජීවීකරණයේ මූලික සංකල්ප හා ක්‍රම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම මෙම පුහුණු වැඩටහනෙහි මූලික අරමුණ විය.

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සඳහා කෑගල්ල, සණස විශ්වවිද්‍යාලයේ දී 2021.10.26 සිට 2021.10.29 දින දක්වා සිව්දින පුහුණු වැඩසටහනක් ලෙස පැවැත්වුණි. පුහුණුලාභීහු 35 දෙනෙකු මීට සහභාගී වූහ.

අපේක්ෂිත ප්‍රතිඵල

1. ප්‍රජා සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම දක්වා ප්‍රජාව සහභාගී කරවාගැනීමේ වැදගත්කම පිළිබඳ අවබෝධය පුළුල් වීම.

2. ප්‍රජාව සතු සම්පත්, සංවර්ධන වැඩසටහන් සඳහා ඵලදායීව සහ කාර්යක්ෂමව භාවිතා කිරීමේ කුසලතාවය වර්ධනය වීම.

3. ප්‍රජා සහභාගීත්ව සැලසුම් සහ ක්‍රියාකාරකම් පදනම් වූ ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.

පුහුණු කණ්ඩායම

එස්.එම්.ඒ.සමරකෝන්,එම්.ඩී.එස්.ලූර්දු,
බී.ඒ.ඩී.එස්.බමුණුආරච්චි, එච්.ජේ.සි.ජයසූරිය, රිෆානා බුහාරි,
සංගීත් ප්‍රනාන්දු

03. ග්‍රාම සංවර්ධන වැඩසටහනක් සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන

එච්.ජේ.සී.ජයසූරිය



ප්‍රජා සහභාගීත්වය තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ මූලික සංකල්ප හා ක්‍රමවේදයන් සම්බන්ධව න්‍යායාත්මක ප්‍රායෝගික දැනුම හා හැකියාව වර්ධනය කිරීම මෙම පුහුණු වැඩසටහනෙහි අරමුණයි.

නුවරඑළිය, පුත්තලම සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයට අනුයුක්ත සහකාර සැලසුම් අධ්‍යක්ෂවරුන් සහ සංවර්ධන නිලධාරීන් ඉලක්ක කර ගෙන පුහුණු වැඩසහන් තුනක් පවත්වා ඇත. නුවරඑළිය පුහුණු වැඩසටහන 2021.10.10 දින සිට 2021.10.15 දින දක්වා ද, පුත්තලම දිස්ත්‍රික් වැඩසටහන 2021.11.08 දින සිට 2021.11.12 දින දක්වා ද බදුල්ල දිස්ත්‍රික් වැඩසටහන 2021.11.29 දින සිට 2021.12.03 දින දක්වා ද පස් දින පුහුණු වැඩසටහන් වශයෙන් පැවැත්වුණි. මෙම වැඩසටහන් තුළින් පුහුණුව ලැබූ සමස්ත නිලධාරීන් සංඛ්‍යාව 103කි.

අපේක්ෂිත ප්‍රතිඵල

1. ග්‍රාමීය හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් සැලසුම්කරණය හා කළමනාකරණය වඩාත් ඵලදායීව සිදු කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම සඳහා වන හැකියාව වර්ධනය වූ, සංවර්ධන නිලධාරීන් හා සහකාර සැලසුම් අධ්‍යක්ෂවරුන්ගෙන් යුතු නියමු කණ්ඩායමක් අදාළ දිස්ත්‍රික්ක තුළ බිහිවීම.

පුහුණු කණ්ඩායම

එස්.එම්.ඒ.සමරකෝන්, පී.සී.ජේ ද සිල්වා, එච්.ජේ.සී.ජයසූරිය, සංගිත් ප්‍රනාන්දු, ආර්.එල්.එන්.ජයතිස්ස

04. ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම සඳහා ගොවි කාන්තා ව්‍යවසායිකාවන් ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහන

එස්.එම්.ඒ.සමරකෝන්



කාන්තාවගේ ප්‍රශස්ත හැකියාවන් උපයෝගී කර ගනිමින් ගෘහස්ත මට්ටමෙන් ආදායම ඉපයීමේ ක්‍රියාවලියට යොමු කිරීම තුළින් දිළිඳුකම පිටු දැකීම සඳහා කාන්තාවන් බල ගැන්වීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප,කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

රත්නපුර දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් තෝරා ගනු ලැබූ කාන්තා ගොවි සංවිධානවල කෘෂි ව්‍යවසායිකාවන් 518 දෙනෙකු පුහුණුව ලැබූහ. එක් දින පුහුණු වැඩසටහන් 10ක දී මෙම පිරිස පුහුණු කරනු ලැබීය.

අපේක්ෂිත ප්‍රතිඵල

1. කාන්තාවක් ලෙස තමන් බල ගැන්වෙන්නේ කෙසේ ද ? ඒ සඳහා තමන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග කවරේද යන්න අවබෝධ කර ගැනීමට
2. පවුලේ පෝෂණය, සෞඛ්‍ය හා ආහාර සුරක්ෂිතතාවය සඳහා කාන්තාවගේ කාර්යභාරය හඳුනා ගැනීම.
3. පෝෂණීය ගෙවත්ත සහිත ගෘහ ඒකකය තුළ සම්පත් ව්‍යවසායකයින් බවට කෙසේ ක්‍රියා කළ යුතු ද යන්න අවබෝධ කර ගැනීම


පුහුණු කණ්ඩායම

එස්.එම්.ඒ.සමරකෝන්, එච්.ජේ.සි.ජයසූරිය, චතුර ජයම්පති ද සිල්වා, එච්.පී.මුණසිංහ, යූ.ඩබ්.පී.ආර්.රණතුංග

ප්‍රකාශන අංශය

ප්‍රකාශන අංශය සංඛ්‍යාන හා දත්ත සැකසුම් / ප්‍රකාශන / පුස්තකාල අංශවලින් සමන්විත වේ. පර්යේෂණ වාර්තා, කාලීන වාර්තා, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, අත් පත්‍රිකා සහ අනෙකුත් ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ම සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීම සිදු කෙරෙන්නේ මෙම ඒකකයෙනි. එමෙන් ම, විද්‍යුත් වැඩසටහන් සැකසීම හා සම්බන්ධීකරණය සිදු වේ.

2021 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා




OFCs IN THE INTERMEDIATE SEASON
Cultivation issues in selected districts



DO WE KNOW WHAT WE SHOULD BE EATING?
Consumption Patterns of Fruit and Vegetables



IMPACT OF HOME GARDEN COCONUT CULTIVATION ON COCONUT KERNEL BASED INDUSTRIES IN SRI LANKA



POLICIES THAT MATTER OR ARE FORGETTABLE
An evaluation of paddy policies in Sri Lanka: 1998 to 2018



THATTUMARU - KATTIMARU AND PRODUCTIVITY
An Assessment of Traditional Tenurial Systems in The Wet Zone



IT IS NOT JUST WATER THAT FLOWS DOWNSTREAM
Water Management in the Eastern Slopes of the Central Highlands



LAND DEVELOPMENT ORDINANCE IN ACTION
Achievements and Prospects of Highland Alienation



MINOR IRRIGATION REHABILITATION
An Assessment of Awarding Rehabilitation Contracts to Farmer Organizations




MOBILE BASED SOLUTION FOR PEST AND DISEASE MANAGEMENT IN PADDY CULTIVATION




FACTORS INFLUENCING VEGETABLE FARMER'S DECISIONS



VALUE CHAIN ANALYSIS OF THE MILK INDUSTRY IN SRI LANKA



TRANSACTION COSTS: POTATO AND RED ONION



OFC CULTIVATION IN THE NORTHERN PROVINCE:
SSUES AND POSSIBLE SOLUTIONS

CROP PRODUCTION PRACTICES IN VILLAGE TANK SYSTEMS IN DRY ZONE SRI LANKA


කාලීන ප්‍රකාශන


කාලීන මාතෘකා පිළිබඳව සම්පාදනය කළ වාර්තා සහ අනුග්‍රාහකභවතුන්ගේ ඉල්ලීම්වලට අනුව සකස් කළ වාර්තා















වර්ෂය	අස්වනෙන් ලබා ගත් පොල්ගෙඩි ප්‍රමාණය (මි.මි.මට.)
2010	1,032,485
2011	859,660
2012	744,018
2013	587,139
2014	759,897
2015	884,317
2016	498,041
2017	400,116
2018	832,123
2019	706,616
2020	891,325

වර්ෂය	අස්වනෙන් පොල්ගෙඩි (මි. මට.)	පිටි පොල්ගෙඩි (ලීටර්)	N.P.K මිශ්‍රණ පොල්ගෙඩි (මි. මට.)
2010	1,032,485	187,425	6,146
2011	859,660	213,075	6,852
2012	744,018	245,742	4,889
2013	587,140	348,838	17,934
2014	759,897	296,286	7,618
2015	884,317	357,937	9,560
2016	498,041	412,738	14,605
2017	400,117	258,833	12,045
2018	832,124	366,697	18,708
2019	706,617	154,458	15,355
2020	891,326	324,472	50,045



ගොවිමිණ පුවත්පත සහ ගොවිමිණ වෙබ් අඩවිය



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන අංශය විසින් ගොවිමිණ නමින් කෘෂිකාර්මික ජාතික පුවත්පතක් නිකුත් කිරීමට කටයුතු කර තිබේ. එහි පළමු කලාපය දෙසැම්බර් මාසයේ නිකුත් කරනු ලැබිණි. පිටු 40කින් යුත් සිව්වර්ණ පුවත්පතක් වන මෙය ගොවිජනතාව අතර නොමිලයේ බෙදා හැරේ.

මෙරට කෘෂිකර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට මග කියන ප්‍රමුඛතම ජාතික ආයතනය වශයෙන් හෙක්ටර් කොබ්බකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ජනනය කරන දැනුම, දත්ත, තොරතුරු නිසි පරිදි සන්නිවේදනය කර ජනගත කිරීම මෙහි ප්‍රමුඛතම කාර්යභාරයක් වෙයි. ඊට 'සාර' නමින් අතිරේකයක් ද ඇතුළත් විය. ගොවිමිණ පුවත්පත ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට සම්බන්ධ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවීන් වෙත බෙදා දීම සිදු කරනු ලැබීය.

සමාජ මාධ්‍ය




සමාජ මාධ්‍ය වේදිකා අපගේ ආයතනය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට සහ වැඩි පරිශීලකයින් පිරිසකට සන්නිවේදනය කිරීමට හැකි පරිදි අවකාශය සලසයි. එය අවබෝධ කරගනිමින් 2021 වර්ෂය තුළ අපගේ සමාජ මාධ්‍ය අවකාශය පුළුල් කරගැනීමට ප්‍රකාශන ඒකකය විසින් කටයුතු යොදන ලදී.

ඒ අනුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය නමින් ෆේස්බුක්,ට්විටර්, ඉන්ස්ටග්‍රෑම් ගිණුම් සහ යූ ටියුබ් නාලිකාවක් ද ආරම්භ කර තිබේ. ඒ ඔස්සේ අපගේ පර්යේෂණ පිළිබඳ තොරතුරු, විෂය සමගාමී සමුළු, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් සහ අපගේ සේවාවන් පිළිබඳ තොරතුරු පුළුල් ග්‍රාහක පිරිසක් වෙත ක්ෂණිකව සමීප කරවීමට හැකි වී තිබේ.

පුස්තකාලය

පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ගේ සහ සංවිධානවල ප්‍රයෝජනය සඳහා කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ.

ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකගතකරණය (Digitization of Institute Publication)



ජාතික විද්‍යා පදනම මඟින් ආරම්භ කරන ලද ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකකරණය ව්‍යාපෘතිය මඟින් අප ආයතනයේ ප්‍රකාශන සංඛ්‍යාංකකරණය කර ඇති අතර (http://harti.nsf.ac.lk/) මඟින් ඒ සඳහා ප්‍රවේශ විය හැකිය.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ආයතනික විද්‍යුත් ප්‍රකාශන එකතුවක් පවත්වාගෙන යාම හා මාර්ගගත ප්‍රවේශය මඟින් ඉක්මනින් ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සැලසීමයි.

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය දායකත්වයන්


දේශීය කෘෂිකර්මයේ සුරක්ෂිතභාවය උදෙසා කාලගුණ විගා රක්ෂණයේ කාර්යභාරය


කොස්


කොස් බොගය


කොස් බොගය


එනසාල් වගාව නකල්ස් සංරක්ෂිනයට විනාශද?


දැනගෙන වගා කරමු
සල්ලි මවනවාද?


මොණරාගල දිස්ත්‍රික්කයේ රනිලුනු නිෂ්පාදනයේ ගැටලු සහ වැඩි දියුණු කිරීම්


නිල්ගල ඖෂධ උද්‍යානය අනතුරේ


රූපවාහිනී වැඩසටහන්







ශාස්ත්‍රීය සඟරා




The changing role of traditional farmers from environmental defenders to wildlife offenders in the context of agro-industrial development and conservation activities in the Moneragala District, Sri Lanka

Amal Dissanayaka,[a] Elizabeth Oriel,[b] Virajith Kuruppu,[c] Renuka Weerakkody,[a] Upul Sanjaya[a]

Abstract

Many practices and policies, whether traditional or modern, have allowed the coexistence of humans and wildlife. In Sri Lanka, farmers have long grown crops for wildlife, in order to reduce damaging Human-Elephant Conflicts (HEC) that are part of the culture of agrarian communities. HEC, however, have intensified and currently prevail over coexistence, with higher numbers of human and elephant deaths, as well as agricultural and property damages. The Moneragala District is one of the most severely affected areas by HEC and is seeing an increase in protection measures, such as electric fences, translocations and thunder flares. Most remedies have failed, however, as controversial mega-projects implemented in the area, such as export-oriented commercial cultivation of sugarcane, mango and banana, have converted residual forest areas, while the use of stronger protection measures around plantations has led to the demise of habitats and food sources for elephants, pulling them away from forests and towards the comparatively poorly protected cultivations and properties of local farmers. As a result, traditional ideologies of environmental conservation have declined among many agrarian communities, with antagonism growing against environmental defenders pursuing a coexistence perspective with elephants. A restructuring of commercial projects is necessary to protect wildlife habitats and minimise aggressiveness against environmental defenders.

Key words: Human-Elephant Conflict (HEC), environmental defenders, environmental offenders, conservation policy, mega-development projects





sustainability

Digitally-Enabled Crop Disorder Management Process Based on Farmer Empowerment for Improved Outcomes: A Case Study from Sri Lanka

Janagan Sivagnanasundaram, Jeevani Goonetillake, Rifana Buhary, Thushara Dharmawardhana, Renuka Weerakkody, Ruknali Gunapala and Athula Ginige

Abstract: We have developed a system facilitated by a mobile artefact to effectively identify crop disorder incidents and manage them using recommended control measures. This work overcomes the limitations of the existing attempts by using digital technology to empower farmers to identify crop disorders rather than replace them with automated techniques. Our approach empowers farmers by providing the information in context for them to identify crop disorders. The developed solution can identify most of the crop disorders instantaneously, irrespective of the crop or other factors that make crop disorder identification complicated. For the rest, it provides a mechanism to carry out a manual identification with the help of subject experts. The solution was deployed among paddy farmers in Sri Lanka to understand how well this could assist them in identifying and managing crop disorders. The system was able to identify 70.8% of the crop disorder incidents reported by the farmers and provided them with the relevant control measures. Farmers' perceptions of various usability aspects of the solution revealed that the application of agrochemicals and expenses associated with agrochemicals were significantly reduced. It was also observed that the yield quality and quantity and overall revenue have increased compared to the previous seasons.

Keywords: pest and disease incidents; agriculture sustainability; smart farming; farmer empowerment; ICTs for sustainability

1. Introduction

The agricultural sector has always been an influential economic force in Sri Lanka, making notable contributions to the nation's economy, food security, and workforce [1]. According to World Bank, 23.7% of the total workforce in Sri Lanka was employed in the agricultural sector in 2020 [2]. Moreover, in 2019, the sector contributed to 7.4% of the country's gross domestic product (GDP). However, in recent times, there has been a substantial reduction in the contribution of agricultural production to Sri Lanka's national GDP, which accounted for 20% of GDP in 2003 and declined to 7.4% in 2019 [1,3]. Overall, such negative outcomes have resulted due to many reasons. One major reason was due to the reduced interest of farmers in farming concerning the unstable situation in the context of Sri Lankan agriculture. This includes unstable and lack of support available for farmers to access needful information (e.g., recommended farming practices, cultivation techniques, management aspect of crop losses, etc.), frequent changes in agricultural policies concerning imports and exports, lower profits, and fluctuations in market prices and production quantities [4–6].

In the Sri Lankan agriculture context, farmers often get assistance from an agricultural extension service to support their day-to-day farming activities. An agricultural extension

බාහිර හවුල්කාරිත්වයන්

හවුල්කාරී පර්යේෂණ

ආහාර හා කෘෂිකර්ම සංවිධානය (Food and Agriculture Organization)

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතය අතර පෙර සහයෝගීතාවයක් මත 'ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහල් නිෂ්පාදනය කෙරෙහි වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්හි බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම නමින් අධ්‍යයනයක් සිදු කරනු ලබයි.

මෙම අධ්‍යයනය 'සම්පත් සුරකිමින් වගා කිරීම' ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කර තිබේ. 'සම්පත් සුරකිමින් වගා කිරීම ව්‍යාපෘතිය' ගොවි සංවිධාන 110කින් වී ගොවීන් 1100 කගේ ගෘහස්ථ සමීක්ෂණයක් 2018 ඔක්තෝබර් සහ 2019 පෙබරවාරි මාසවල දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදු කරන ලදි. මෙම දත්ත කට්ටලය වත්මන් ව්‍යාපෘතිය සඳහා පදනම ලෙස භාවිතා කරයි. විශේෂයෙන්ම 2019 ක්‍රියාත්මක අධ්‍යයනයේ දෙවන අදියර, 2021 ඔක්තෝබර් මස සිට මාස 03 ක කාලයක් තුළ නිවාස 1100ක් සඳහා විවිධ පොහොර සහනාධාර ක්‍රම වල බලපෑම පිළිබඳ විශ්ලේෂණයට කිරීමට යොදාගැනීමට බලාපොරොත්තුවේ. එයට අමතරව අධ්‍යානය මගින් ගොවි සුභසාධනය සහ ඵලදායිතාව මෙන්ම පොහොර සඳහා ගොවි මනාපයන්, අදාළ අමතර තොරතුරු එකතු කරන අතරම, සමීක්ෂණය පෙර පැවති 'සම්පත් සුරකිමින් වගා කිරීම ව්‍යාපෘතිය' සමීක්ෂණය ප්‍රතිනිර්මාණය කෙරේ. සමීක්ෂණ දත්ත වල පළමු වටය සහ දෙවන වටය අතර, රජය පොහොර සහනාධාරය, මුදල් ලෙස හා සහනාධාර ලෙස ප්‍රතිස්ථාපනය සිදු කර ඇත. එම නිසා දෙවන වටයේ සමීක්ෂණ දත්ත එකතු කිරීම මගින් පොහොර සහනාධාර ක්‍රියාත්මක කිරීමේ ආකාර දෙක සංසන්දනය කිරීමටත්, බලපෑම් විශ්ලේෂණය සහ හේතු අනුමාන වැඩිදියුණු කළ හැකි පැනල දත්ත ආර්ථිකමිතික ශිල්පීය ක්‍රම භාවිතා කිරීමටත් බලාපොරොත්තු වේ.

වර්ල්ඩ් විෂන් ලංකා Worldvision ආයතනය

වර්ල්ඩ් විෂන් ලංකා (World Vision Lanka) ආයතනය විසින් පිරිනැමූ 'ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාවය සහ දේශගුණික-අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය' සඳහා වන රුපියල් මිලියන 11ක පර්යේෂණ මූල්‍ය අරමුදල තරඟකාරී ලෙස දිනාගැනීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සමත්විය. දේශගුණික අවදානමට ලක්වීමේ හැකියාව ඉතාමත් ඉහළ වියළි කලාපීය ගොවි ප්‍රජාවන්ගේ දේශගුණික-අනුහුරු ගොවිතැන් පිළිවෙත් සහ ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීමත් එම දේශගුණික-අනුහුරු වගා පිළිවෙත් කෙතරම් දුරකට කාන්තාවන්ගේ සහ ළමුන්ගේ දේශගුණික **විපර්යාස හමුවේ දරාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ඉවහල් වී ඇතිද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වේ.**

වසර 2ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර කටයුතු 2023 වර්ෂයේ සැප්තැම්බර් දක්වා සැලසුම් කොට ඇත.

මෙම අධ්‍යයනයට අදාළ විෂය පථය තුළ සිදුකරන ලද සාහිත්‍ය විමර්ශනයක් හරහා දේශගුණික විපර්යාස හමුවේ කාන්තාවන්ට සහ ළමුන්ට සිදුවන ඍජු සහ වක්‍ර බලපෑම පිලිබඳ මූලික වාර්තාවක් පිළියෙළ කිරීම 2021 වර්ෂය තුල සිදුකරන ලදී.

හවුල්කාරී පුහුණු වැඩසටහන්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතයේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය විසින් කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ දී අලෙවි තොරතුරු භාවිතා කිරීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය.

බදුල්ල කැපිටල් සිටි හෝටලයේ දී පසුගිය මාර්තු මස 29 සහ 30 යන දෙදින තුළ පැවැත් වූ පුහුණු වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වූයේ බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කන්හි කෘෂිකාර්මික ව්‍යවසායකයින්ය. කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ දී අලෙවි තොරතුරු භාවිතා කිරීම පිළිබඳ පුහුණුකරුවන්ට දැනුමක් ලබා දීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කළ අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය ඊ.ඒ.සී ප්‍රියංකර සහ පර්යේෂණ නිලධාරීන් වන ප්‍රසන්න විජේසිංහ, සහ විරාජිත් කුරුප්පු යන මහත්වරු සම්පත් දායකත්වය දැක්වූහ. ආහාර හා ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නාලධාරී ආචාර්ය එන්.පී.ජී සමන්ත මහතා විසින් පුහුණු වැඩසටහන සම්බන්ධීකරණය කළේය.

අවබෝධතා ගිවිසුම

ගොවිජන හා කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු වශයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්යභාරය පුළුල් කිරීමේ අරමුණින් කෘෂිකර්ම පීඨ පිහිටා ඇති දිවයිනේ සියලුම විශ්වවිද්‍යාල සමඟ ශාස්ත්‍රීය හා පර්යේෂණ සහයෝගීතාවයන්ට එළඹීම සඳහා මූලික පියවර මෙම වසරේ ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අටක් සහ සෞඛ්‍ය විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමට පාලක මණ්ඩලයේ ද අනුමැතිය ලැබුණු අතර ඒ අනුව දෙසැම්බර් මාසයේ සබරගමුව විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබුණි.

සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ රත්නායක සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී මාලින්ද සෙනෙවිරත්න යන මහත්වරු ගිවිසුමට අත්සන් තැබූහ.

කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ ධාරිතා සංවර්ධනය

2021 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල තත්ත්වය

	31.12.2020 දිනට තත්ත්වය	වර්ෂය තුළ සේවය අත් හිටුවීම, සේවයෙන් ඉවත් වීම	පත් කිරීම්	**2021.12.31** දිනට තත්ත්වය
අධ්‍යක්ෂ	1	-	-	1
අතිරේක අධ්‍යක්ෂ	-	-	-	-
අංශ ප්‍රධානීන්	6	-	-	6
පර්යේෂණ කාර්ය මණ්ඩලය	30	1	-	28
පරිපාලන කාර්ය මණ්ඩලය	9	-	-	9
පුස්තකාල ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය	2	-	-	2
දත්ත සංවර්ධන බැංකුව	2	1	-	1
පරිගණක ඒකකය	1	-	-	
ප්‍රකාශන ඒකකය	5	-	-	4
සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	21	6	-	15
තාක්ෂණික කාර්යමණ්ඩලය	2	-	4	6
ලිපිකාර, ලේකම් සහ සමාන්තර ශ්‍රේණි	45	1	-	44
මෙහෙයුම් හා සමාන්තර ශ්‍රේණි	45	2	-	43
එකතුව	**169**	**11**	**4**	**159**

කාර්ය මණ්ඩල පුහුණු කිරීම්

වර්ෂය තුළ කාර්ය මණ්ඩලය සහභාගී වූ පුහුණු වැඩසටහන් බොහොමයක් මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවතුණි. බාහිර ආයතන විසින් සංවිධානය කළ පුහුණු වැඩසටහන් සඳහා මෙන් ම ආයතනය විසින් ආයතනයේ කාර්ය කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කළ පුහුණු වැඩසටහන් ද කාර්ය මණ්ඩල පුහුණු කිරීම් තුළට ඇතුළත් වේ.

බාහිර ආයතන මඟින් සිදු කරන ලද පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන	සහභාගී වූ පිරිස	කාලය
1. ග්‍රාම පාලන සන්දර්භය තුළ ගම සංවර්ධනය සහ ආර්ථික සවිබල ගැන්වීම ප්‍රවර්ධනය සඳහා උපකරණයක් ලෙස ගම ඩිජිටල්කරණය	පර්යේෂණ නිලධාරීන් (01)	දින 01
2. පර්යේෂණ අදහස් උත්පාදනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව	පර්යේෂණ නිලධාරීන් (05)	දින 01
3. කාබනික පිය සටහන පිළිබඳ සුදුසුකම් සඳහා උපදේශාත්මක සංවර්ධනය	පර්යේෂණ නිලධාරීන් (01)	දින 05
4.කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණය	පර්යේෂණ නිලධාරීන් (05)	මාස 01
5. පසු අස්වනු කළමනාකරණය සහ පලතුරු සහ එළවළුවල අගය එකතු කිරීම පිළිබඳ මෑත කාලීන වර්ධනයන්	පර්යේෂණ නිලධාරීන් (04)	දින 01
6. ඔබගේ වෘත්තීය සාර්ථක කර ගන්නේ කෙසේද? පිළිබඳ මාර්ගගත වැඩමුළුව	පර්යේෂණ නිලධාරීන් (05)	දින 01
7.වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	ගණකාධිකාරිනි (01)	දින 03
8. ධාරිතා සංවර්ධනය	පරිපාලන නිලධාරිනි (01)	දින 03
9.කාර්යාල කළමනාකරණය සහ මූදල් රෙගුලාසි	කළමනාකරණ සහකාර (01)	දින 02

ආයතනය විසින් කාර්යමණ්ඩලය වෙනුවෙන් ආයතනය තුළ පැවැත්වූ පුහුණු වැඩසටහන්

01. කළමනාකරණ සහකාර කාර්යමණ්ඩලයට සූම් තාක්ෂණය ඔස්සේ පහත සඳහන් පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබුණි.

1.1 බැංකු සැසඳුම්පත පිළිබඳ පුහුණු වැඩසටහන	දින 02
1.2 ගිණුම්කරණ ද්විත්වසටහන් හඳුන්වා දීම	දින 01
1.3 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික හැඳින්වීම	දින 01

02. සංඛ්‍යාන කාර්යමණ්ඩලය සඳහා ‘STATA’ පැකේජය පිළිබඳ පුහුණු වැඩසටහන.

තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
01. දරිද්‍රතාව තුරන් කිරීම, සෑම අතින්ම පවතින කුසගින්න තුරන් කිරීම	තට්ටුමාරු - කට්ටිමාරු සහ එලදායිතාව , තෙත් කලාපයේ සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ තක්සේරුවක්	පර්යේෂණ වාර්තා			✓
	දේශීය කෘෂි ව්‍යවසායකයින් විසින් පවත්වාගෙන යනු ලබන කෘෂිකාර්මික සේවා සපයන මධ්‍යස්ථාන හරහා ගොවිපොළ යාන්ත්‍රිකරණය ආරම්භ කිරීම: අභියෝග සහ අවස්ථා	පර්යේෂණ වාර්තා			✓
	ශ්‍රී ලංකාවේ ඉහළ අගයකින් යුත් පලතුරු බෝග නිෂ්පාදනය කිරීමේදී ජල හා බලශක්ති පරිභෝජනය සඳහා ඒකාබද්ධ විසඳුම් පිළිබඳ අධ්‍යයනය	පර්යේෂණ වාර්තා			✓
	ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයට රජයේ ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම	පර්යේෂණ වාර්තා			✓
	කිරි කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය	පර්යේෂණ වාර්තා			✓
	ශ්‍රී ලංකාවේ කුළුබඩු කර්මාන්තයේ සමාජ,ආර්ථික තත්ත්වය හා වර්තමානයේ එම කර්මාන්ත මුහුණ දී ඇති ගැටළු හා විභවය	පර්යේෂණ වාර්තා			✓
	ගණුදෙනු පිරිවැය (අර්තාපල් හා රතුළූණු)	පර්යේෂණ වාර්තා			✓
	උතුරු පළාතේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා බලපාන ගැටළු (ගැටළු,බාධක හා විභවයන්)	පර්යේෂණ වාර්තා			✓
	කිරි කර්මාන්තයේ සංවර්ධනයට අදාළව 2006 ප්‍රතිපත්තිය විශ්ලේෂණය කිරීම	කාලීන වාර්තා		✓	
	අර්තාපල් අගය දාමය: වර්තමාන තත්ත්වය, අභියෝග සහ සංවර්ධන අවස්ථා	පර්යේෂණ වාර්තා		✓	

	ඉඩම් සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක කිරීම: සාර්ථකත්වයන් සහ අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යයනය	පර්යේෂණ වාර්තා			✓
	ගොවි සංවිධානවලට පුනරුත්ථාපන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිළිබඳ තක්සේරුවක්	පර්යේෂණ වාර්තා			✓
	ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතීන්: හඳුනාගැනීම සහ සංරක්ෂණය	පර්යේෂණ වාර්තා			✓
	ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ අභියෝග: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව	පර්යේෂණ වාර්තා			✓
02.ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	ශ්‍රී ලංකාවේ ආහාර බෝග අංශයේ කෘෂිකාර්මික ව්‍යාප්ති හා උපදෙස් සැපයීමේ සේවය: අභියෝග, ගැටලු සහ වැඩිදියුණු කිරීමේ විකල්ප	කාර්ය පත්‍රිකා		✓	
	කාබනික වී වගාව සහ තරුණ සහභාගීත්වය තුළින් ක්‍රියාශාරී කුඹුරු ඉඩම් භාවිතය තීව්‍ර කිරීම	කාර්ය පත්‍රිකා		✓	
	පහතරට තෙත් කලාපීය පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වයන් සහ අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යනය	කාලීන වාර්තා		✓	
	දේශීය කෘෂි ව්‍යවසායකයින් විසින් පවත්වාගෙන යනු ලබන කෘෂිකාර්මික සේවා සපයන මධ්‍යස්ථාන හරහා ගොවිපොළ යාන්ත්‍රිකරණය ආරම්භ කිරීම: අභියෝග සහ අවස්ථා	කාලීන වාර්තා		✓	
	තිරසාර ග්‍රාමීය සංවර්ධනයක් උදෙසා ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ඉඩම් ඒකාබද්ධ කිරීම	කාලීන වාර්තා		✓	
	ශ්‍රී ලංකාවේ ආදායම් උත්පාදනය සහ ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා ගොවිපොළ - ව්‍යවසායකත්වය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය තුළින් බිම්මල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	පර්යේෂණ වාර්තා		✓	
	මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය	කාර්ය පත්‍රිකා			✓

02.ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	අතරමැදි කන්නයේ අතිරේක ආහාර බෝග - තෝරාගත් දිස්ත්‍රික්කවල වගා ගැටලු	කාර්ය පත්‍රිකා			✓
	ශ්‍රී ලංකාවේ ඉහළ අගයකින් යුත් පලතුරු බෝග නිෂ්පාදනය කිරීමේදී ජල හා බලශක්ති පරිභෝජනය සඳහා ඒකාබද්ධ විසඳුම් පිළිබඳ අධ්‍යයනය	කාලීන වාර්තා		✓	
	වාණිජමය මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය: ගැටලු හා ප්‍රවණතාවයන්	පර්යේෂණ වාර්තා		✓	
	අපි කන්න ඕන මොනවද කියලා අපි දන්නවද?" එළවළු සහ පලතුරු පරිභෝජන රටා	පර්යේෂණ වාර්තා			✓
	ආහාර බෝග අංශයේ පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා පරිශීලක කේන්ද්‍රීය ජංගම දුරකතන පාදක විසඳුමක්	පර්යේෂණ වාර්තා			✓
	එළවළු ගොවීන්ගේ තීරණ කෙරෙහි බලපාන සාධක	පර්යේෂණ වාර්තා			✓
	වී / සහල් අගය දාමය පිළිබඳ අධ්‍යයනය - පොළොන්නරුව දිස්ත්‍රික්කය	පර්යේෂණ වාර්තා			✓
	ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා (පොල් මඳ ආශ්‍රිත නිෂ්පාදන) ගෙවතු තුළ පොල් වගාවේ බලපෑම සොයා බැලීම	පර්යේෂණ වාර්තා			✓
	ශ්‍රී ලංකාවේ කුළුබඩු කර්මාන්තයේ සමාජ,ආර්ථික තත්ත්වය හා වර්තමානයේ එම කර්මාන්ත මුහුණ දී ඇති ගැටළු හා විභවය	පර්යේෂණ වාර්තා			✓
	අර්තාපල් අගය දාමය: වර්තමාන තත්ත්වය, අභියෝග සහ සංවර්ධන අවස්ථා	පර්යේෂණ වාර්තා		✓	
	දේශීය දෙමුහුන් මිරිස් වගාව සහ වියළි මිරිස් නිෂ්පාදනය: වත්මන් තත්ත්වය සහ විභවය	කාලීන වාර්තා		✓	
	ශ්‍රී ලංකාවේ ලොකු ඵෑණු සම්බන්ධ අගයදාම විශ්ලේෂණය	කාර්ය පත්‍රිකා		✓	
	බඩ ඉරිභූ සඳහා අගය දාම විශ්ලේෂණය: ගොවිපොළ සිට කර්මාන්ත දක්වා	කාර්ය පත්‍රිකා		✓	
	එළවළු අලෙවිකරණය සඳහා e - විකුණුම් ක්‍රම භාවිතය : වත්මන් තත්ත්වය, විභවයන් හා සීමාවන්	කාර්ය පත්‍රිකා		✓	
	සෝයා බෝංචි සඳහා අගයදාම විශ්ලේෂණය	කාර්ය පත්‍රිකා		✓	

	ශ්‍රී ලංකාවේ පලතුරු අපනයනය සඳහා සාපේක්ෂ වාසි පිළිබඳ අධ්‍යයනය	පර්යේෂණ වාර්තා		✓	
	ශ්‍රී ලංකාවේ ප්‍රධාන පලතුරු අපනයන විභවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය				
සියලු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂක කළමනාකරණය සුරක්ෂිත කිරීම	මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය	කාර්ය පත්‍රිකා			✓
නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්ත්වයට පත් කිරීම	ඉඩම් සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක කිරීම: සාර්ථකත්වයන් සහ අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යයනය	පර්යේෂණ වාර්තා			✓
තිරසාර පරිභෝජනය හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම	ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ග්‍රාමීය වැව් පද්ධතිවල බෝග නිෂ්පාදන පිළිවෙත්	පර්යේෂණ වාර්තා			✓
	මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය	කාර්ය පත්‍රිකා			✓
දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාර්ග ගැනීම	ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ග්‍රාමීය වැව් පද්ධතිවල බෝග නිෂ්පාදන පිළිවෙත්	පර්යේෂණ වාර්තා			✓
	මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය	කාර්ය පත්‍රිකා			✓
	ශ්‍රී ලංකාවේ උඩරට එළවළු ගොවීන් භාවිතා කරන පාංශු සංරක්ෂණ ක්‍රම කෙරෙහි බලපාන සාධක	පර්යේෂණ වාර්තා		✓	
	ශ්‍රී ලංකාවේ ප්‍රධාන පලතුරු අපනයන විභවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය	පර්යේෂණ වාර්තා		✓	

තිරසර සංවර්ධන අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසාර පරිභෝජනය හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම	කෘෂි ව්‍යාපාර සංකල්ප භාවිතය සහ අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ නේවාසික වැඩමුළුව	පුහුණු වැඩසටහන්			✓
	ග්‍රාම සංවර්ධන වැඩසටහනක් සැලසුම් කිරීම සහ කළමනාරකණය සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	පුහුණු වැඩසටහන්			✓
	.ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම සඳහා ගොවි කාන්තා ව්‍යවසායිකාවන් ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහන	පුහුණු වැඩසටහන්			✓
	සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	පුහුණු වැඩසටහන්			✓

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

2021 වර්ෂය ආරම්භයේ දී ක්‍රියාකාරී සැලැස්ම තුළින් මුල් මාස දෙක තුළ සියලු පර්යේෂණ කටයුතු සැලසුම් සකස් කර තිබූ නමුත් කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අපහසු බව අවබෝධ විය.

එබැවින් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් තුළින් අවසාන කාර්තුව තුළ උපායශීලිව දත්ත රැස් කිරීමේ ක්‍රමවේද සැලසුම් කිරීම තුළින් ආයතනය විසින් පර්යේෂණ හා පුහුණු වැඩසටහන් හරහා ළඟා කර ගැනීමට අපේක්ෂා කළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට හැකි විය.

ඉදිරි වර්ෂය සඳහා සූදානම

පර්යේෂණ අංශ ප්‍රතිව්‍යූහගතකරණය

වර්ෂ 2021 තුළ දී අත් කරගත් කැපී පෙනෙන ප්‍රගතිය අභිමුව 2022 වර්ෂය වෙත ආයතනය පිය නගන්නේ බොහෝ බලාපොරොත්තු ඉටු කරගැනීමේ අපේක්ෂාව සහිතව යි. දෙදහස් විසි එක වර්ෂයේ අග භාගය තුළ ආයතනය සම්බන්ධයෙන් සිදු කළ ගැඹුරු අධ්‍යයනයෙන් උගත් පාඩම් ඊට අවශ්‍ය සවිමත් පදනම සපයා තිබේවේශයක නවමු ප්‍ර .දිශානතිය පෙන්වා දී තිබේපසුගිය දශකය තුළ, ආහාර, දේශගුණය, සෞඛ්‍ය සහ මූල්‍ය යන ගෝලීය අර්බුද හමුවේ වේගයෙන් වෙනස් වන දේශීය ගොවිජන යථාර්ථයන් සමඟ ආයතනික අරමුණු පෙළගැස්වීමට සහ ඒවාට අනුගත වීමට ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි ආයතනය නැවත ස්ථානගත කිරීමට එම ප්‍රයත්නය මනා පිටිවහලක් සපයන ලදී.

එනම්, සංවෘත ආර්ථික වටපිටාවක් තුළ සිය ආරම්භය සනිටුහන් කර, විවෘත ආර්ථිකයක් ඔස්සේ අදට අවැසි චක්‍රීය ආර්ථිකයක් වෙත යා යුතු ගමනට ඔබින ව්‍යුහාත්මක හා කෘත්‍යාත්මක වෙනස්කම් වැළඳ ගන්නට ආයතනය සූදානමින් සිටී. විශේෂයෙන් සමාජ පාරසරික ආර්ථික වශයෙන් රට තුළ වර්ධනය වෙමින් පවතින අර්බුදකාරී තත්ත්වය සමනය කිරීම උදෙසා ජාතික පර්යේෂණ ආයතනයක් වශයෙන් වැඩි දායකත්වයක් සැපයිය හැකි ආකාරයට ආයතනය ව්‍යුහගත වන්නේ එබැවිනි .ඒ අනුව, ආහාර පද්ධති, පාරිසරික සහ ග්‍රාමීය සංවර්ධන පර්යේෂණ ක්ෂේත්‍ර යටතේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ වැඩි පිරිසක් අනුයුක්ත කරමින් ආයතනයේ පර්යේෂණ සංරචකය ශක්තිමත් කරනු ඇත. ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රයේ සහ පර්යේෂණ නිමැවුම්වල ප්‍රතිපත්තිමය අදාළත්වය, කාලෝචිත බව, විශ්ලේෂණාත්මක නිරවද්‍යතාව සහ බහුවිධ විෂයයන් ස්පර්ශ කිරීම වැඩි වශයෙන් සහතික කිරීම සඳහා මූලික අවධානය යොමු කරනු ඇත.

එපමණක් නොව, ආයතනයේ පර්යේෂණ සංරචකය තොරතුරු හා දත්තවලින් පෝෂණය කරමින් හා දත්ත විශ්ලේෂණය මඟින් දත්ත කළමනාකරණ අංශය ඊට සහය වේ .වසර 50කට ආසන්න ඉතිහාසයක් පුරා, රාජ්‍ය, පෞද්ගලික සහ සිවිල් පාර්ශවකරුවන් සහ පර්යේෂකයන් මෙන්ම සාමාන්‍ය මහජනතාවට ඔවුන් අවධානය යොමු කරන

ක්ෂේත්‍රවල උසස් තත්ත්වයේ දත්ත සහ තොරතුරු සැපයීම සඳහා දත්ත කළමනාකරණ අංශය සූදානම් ව සිටී. ආයතනික පාර්ශවකරුවන් වෙත දැනුම බෙදා හැරීමේ දී තොරතුරු හා සන්නිවේදන අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යාපන හා පුහුණු අංශය සිය විෂය පථය පුළුල් කර විශාල ප්‍රජාවකට දැනුම බෙදාදෙමින් සිය සේවය සැපයීමට සූදානම් ය. අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න මහතා ප්‍රමුඛ අංශ ප්‍රධානීන් සහ අධි පර්යේෂකයන් විසින් ඒ සඳහා නිවැරදි මගපෙන්වීම ලබා දෙනු ඇත.

එනයින්, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පර්යේෂණ, පුහුණු, අධ්‍යාපන, දත්ත කළමනාකරණ සහ තොරතුරු හා සන්නිවේදනය වැනි පුළුල් පරාසයක ක්‍රියාකාරකම්වල නිරත වෙමින් වඩාත් පළබර ගොවිතැනක්, සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහ හරිත පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව 2022 වසරට අවතීර්ණ වීමට නියමිතව ඇත.

පර්යේෂණ අංශ ප්‍රධානීන්



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න මහතා, අධි පර්යේෂණ නිලධාරීන් සහ පර්යේෂණ අංශ ප්‍රධානීන්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

රුපියල්

වත්කම්	සටහන්	2021	2020
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	2	13,984,557	9,743,479
ලැබිය යුතු-ණයගැතියෝ	3	34,310,368	28,791,749
ලැබිය යුතු - තැන්පත්	4	613,070	613,070
අවසන් තොග	5	6,540,513	5,355,832
ඉදිරි ගෙවීම්	6	-	23,780
අනෙකුත් ජංගම වත්කම්	7	544,768	144,809
		55,993,275	**44,672,718**
අනෙකුත් මූල්‍ය වත්කම්	8	4,294,283	4,125,453
යටිතල පහසුකම්, පිරියත හා උපකරණ	9	15,062,278	19,063,948
ඉඩම් හා ගොඩනැගිලි	10	35,479,441	36,782,585
		54,836,002	**59,971,987**
මුළු වත්කම්		**110,829,277**	**104,644,705**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	11	**19,681,654**	**17,207,081**
		19,681,654	**17,207,081**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	12	61,196,120	67,426,150
		61,196,120	**67,426,150**
මුළු වගකීම්		**80,877,774**	**84,633,231**
ශුද්ධ වත්කම්		**29,951,503**	**20,011,474**
ශුද්ධ වත්කම් හා හිමිකම්			
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	13	34,582,108	39,140,540
අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධනය			
සංචිත	14	3,376,907	3,376,907
ප්‍රත්‍යාගණික සංචිත		26,450	26,450
දිරි දීමනා හා පුහුණු අරමුදල	15	8,611	8,611
සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය)	16	(8,042,573)	(22,541,035)
මුළු වත්කම්/ හිමිකම්		**29,951,503**	**20,011,474**

පිටු අංක 5 සිට 8 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 9 සිට 16 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන කොටස්ය. රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව සහතික කරමි.

.....

තුෂාරි වෙදගේ

ගණකාධිකාරිණී

දිනය

.....

මාලින්ද සෙනෙවිරත්න

අධ්‍යක්ෂ

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

.....

ඩී.එම්.එල්.බී බණ්ඩාරනායක

සභාපති

.....

පාලක මණ්ඩල සාමාජික

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

රු.

ආදායම	සටහන්	2021	2020
මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්		181,409,088	154,739,750
පර්යේෂණ හා පුහුණු කිරීම් සඳහා බාහිර ආයතනවලින් ලද අරමුදල්		4,955,348	5,161,942
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා හිමි වූ ප්‍රාග්ධන ප්‍රදාන		7,692,746	500,000
අනෙකුත් ආදායම්	17	17,972,548	19,863,438
බොල් ණය අධි වෙන් කිරීම්			529,892
මුළු ආදායම		**212,029,730**	**180,795,022**
වියදම්			
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ	18	(153,328,140)	(160,080,868)
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම්		(7,692,746)	(1,519,380)
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා බාහිර පාර්ශවයන්ට සිදු කළ ගෙවී		(4,955,348)	(5,161,942)
ක්ෂයවීම්	9, 10	(5,565,686)	(5,830,615)
වෙනත් වියදම්	19	(28,312,644)	(24,192,865)
බොල් ණය (ඌන) වෙන් කිරීම්		(2,750)	(148,288)
බැංකු ගාස්තු		(38,815)	(62,260)
මුළු වියදම්		**(199,896,129)**	**(196,996,218)**
අදාළ කාලය සඳහා අතිරික්තය/ හිඟය		**12,133,601**	**(16,201,196)**

.....

ගණකාධිකාරිනි

.....

අධ්‍යක්ෂ

2020		සටහන්	2021	
	මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
(16,201,196)	වර්ෂය සඳහා ශුද්ධ හිඟය/ අතිරික්තය			12,133,601
	ගැලපීම්			
5,830,615	ක්ෂය වීම්		5,565,686	
(5,830,615)	ක්‍රමක්ෂය		(5,565,686)	
10,912,233	පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		5,108,663	
(1,175,853)	ආයෝජන ආදායම		(1,382,793)	
(1,080,596)	පෙර වර්ෂයේ ගැලපීම්		2,364,861	
18,420	ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් ලද ලාභය/අලාභය		-	
(12,050)	අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමෙන් ලද ලාභය/අලාභය		(27,062)	
	බොල් ණය සඳහා වෙන් කිරීම්			6,063,669
(7,539,042)				**18,197,270**
	කාරක ප්‍රාග්ධන වෙනස්කම්			
3,728,996	ණයගැතියෝ		(5,518,619)	
(126,577)	අවසන් තොග		(1,184,681)	
11,287	ඉදිරි ගෙවීම්		23,780	
(121,309)	අනෙකුත් ජංගම වත්කම්		(399,959)	
(1,736,135)	ගෙවිය යුතු දෑ		2,474,572	(4,604,907)
(5,782,779)	**මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය**			**13,592,363**
(1,048,835)	**පාරිතෝෂික ගෙවීම්**			(11,338,693)
(6,831,614)	**මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල**			**2,253,670**
	ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
-	ණයගැතියෝ			
(224,530)	අනෙකුත් මූල්‍ය වත්කම්		(168,830)	
(7,200)	දේපළ, පිරියත හා උපකරණ		(263,398)	
-	ඉඩම් හා ගොඩනැගිලි		-	
-	පැල්වෙහෙර නිල නිවාසය		-	
1,175,853	ආයෝජන ආදායම්		1,382,793	
-	සිදු කෙරෙමින් පවතින වැඩ			
2,737	නැති වූ පුස්තකාල පොත් සඳහා පිරිවැය අය කර ගැනීම්		2,527	
946,860	**ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය**			**953,092**
	මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය			
500,000	රජයේ ප්‍රදාන- ප්‍රාග්ධන ලැබීම්		8,700,000	
(500,000)	පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා හිමි වූ ප්‍රාග්ධන ප්‍රදාන		(7,692,746)	
-	දිරිදීමනා අරමුදල-ආයතනයේ දායකත්වය 40%		-	
12,050	අබලි ද්‍රව්‍ය අලෙවිය		27,062	
-	දිරිදීමනා අරමුදල-ආයතනයේ දායකත්වය 10%		-	
-	බොල් ණය වෙන් කිරීම්			
12,050	**මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්**			**1,034,316**
(5,872,705)	මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම			4,241,078
15,616,183	වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන අයිතමයන්	I		9,743,479
9,743,479	**වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන අයිතමයන්**	II		**13,984,557**
	සටහන්:			
	මුදල් හා මුදල් සමාන අයිතමයන්		1	11
			01.01.2021	31.12.2021
9,723,479	බැංකු ශේෂය		9,723,479	13,916,913
20,000	අතැති මුදල්		20,000	67,644
9,743,479	**එකතුව**		**9,743,479**	**13,984,557**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම්/වගකීම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

රුපියල්

	රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	සංචිත	ප්‍රත්‍යාගණිත සංචිත	දිරි දීමනා සහ පුහුණු අරමුදල	සමුච්චිත අතිරික්තය/(හිඟය)	එකතුව
2020 ජනවාරි 01 දිනට ශේෂය	39,140,540	3,376,907	26,450	8,611	(22,541,035)	20,011,474
මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් -ප්‍රාග්ධන	8,700,000					8,700,000
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(5,565,686)					(5,565,686)
පර්යේෂණ සහ පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු මුදල්	(7,692,746)					(7,692,746)
පෙර වසරේ ශේෂය මාරු කිරීම						-
පෙර වර්ෂයට ගැලපීම්					2,364,861	2,364,861
ආදායම් සහ වියදම්					12,133,601	12,133,601
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**34,582,108**	**3,376,907**	**26,450**	**8,611**	**(8,042,573)**	**29,951,503**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුතු නිකුතු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානයන්ට අදාළව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නැත. උපචිත පදනම මත ගණකාධිකරණ මූලධර්ම නිරන්තරයෙන් භාවිතා කර තිබේ.

1.2 සන්සන්දනාත්මක තොරතුරු

පසුගිය වසරේ උපයෝගී කර ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව මෙම වසරේ ද එම ප්‍රතිපත්තීන් යොදාගෙන ඇත. අවශ්‍ය සෑම අවස්ථාවකදීම පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පසුගිය වර්ෂයේ අගයන් නැවත සකසා ඉදිරිපත් කර ඇත.

1.3 ශේෂ පත් දිනයට පසුව හටගන්නා සිද්ධි

ශේෂ පත්‍ර දිනෙන් පසු හට ගන්නා ප්‍රමාණවත් සිද්ධීන් සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාවල අදාළ හෙළිදරව හා ගැලපීම් සිදු කර ඇත.

1.4 වත්කම් තක්සේරු

(i) දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට වැය වූ වියදම් එහි පිරිවැය ලෙස සැලකේ. ආයතනයේ පැවැත්මට හෝ ආයතනයේ ධාරිතාවය වැඩි කිරීමට යම් වත්කමක් මිල දී ගැනීමක් හෝ පවතින වත්කමක් වැඩි දියුණු කිරීමට යම් වියදමක් දරන්නේ නම් එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකේ. අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය පුනරාවර්තන වියදමක් ලෙස සැලකේ. දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පිරිවැයෙන් හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කර ඉදිරිපත් කරනු ලබන අතර එය පහත පරිදි වේ.

a) පහත සඳහන් වාර්ෂික ක්ෂය අනුපාත යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර තිබේ.

ගොඩනැගිලි	වාර්ෂික 2 ½ %
උපකරණ/ගෘහභාණ්ඩ	වාර්ෂික 10%
පරිගණක	වාර්ෂික 20%
සුභසාධක උපකරණ	වාර්ෂික 10%
පොත්	වාර්ෂික 10%
වාහන	වාර්ෂික 20%

මිල දී ගත් වර්ෂයේ දී සමස්ත වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

b) ක්‍රමක්ෂය වටිනාකම හඳුනාගැනීම හා ගිණුම් තැබීම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක LKAS-20 විකල්ප ක්‍රමය අනුව සිදු කර ඇත.

c) පැල්වෙහෙර නිල නිවාසය

පැල්වෙහෙර බංගලාව 2019.11.01 වන විට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නැවත භාර දී ඇති අතර එහි හුවමාරු වටිනාකම රුපියල් 1,962545.66 ක් විය.

1.5 ණයගැතියෝ

i) ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ

වර්තමානයේ විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් හය දෙනෙකුගේ ශේෂයන් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (SLIPSAS 08) අනුව අවදානම හා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගනිමින් අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිශතය මෙම වර්ෂයේ දී තීරණය කර ඇත.

ii) අනෙකුත් ණයගැතියෝ

උපලබ්ධි වේ යැයි අපේක්ෂිත අගය ණයගැති වටිනාකම ලෙස සඳහන් කර ඇත. බොල් සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත. එය පහත පරිදි වේ.

1. අවුරුදු 5ට වැඩි ණයගැති ශේෂය මත - 100%
2. අවුරුදු 1 වැඩි අවුරුදු 05 අඩු ණයැති ශේෂය මත - 5%

iii) ගිණුම්ගත නොකළ නේවාසිකාගාර ආදායම

වාර්තාගත නොකළ නේවාසිකාගාර ආදායම රු.8,895,470/- වන අතර මෙම වටිනාකම 2015 මැයි මස සිට 2018 ජූලි මස දක්වා නේවාසිකාගාර ක්‍රියාකාරකම්වලින් ජනනය වී ඇත. මෙම වටිනාකම හඳුනාගැනීම අධ්‍යක්ෂවරයා විසින් පත් කළ විශේෂ කමිටුවක් මඟින් සිදු කර ඇත. මෙම මුදල වාර්තාගත කර නැති අතර එම තීරණය පාලක මණ්ඩලය විසින් ගෙන ඇත.

iv) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු

මෙම වටිනාකම පැල්වෙහෙර බංගලාව **දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත හුවමාරු** කිරීමේ වටිනාකමකි. මෙම වටිනාකම **දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට** ගෙවිය යුතු වටිනාකමට පියවා නොමැත.

1.6 තොගය

පාරිභෝජන තොගය පිරිවැය මත අගය කොට ඇත. අනෙකුත් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත අගය කර ඇත. තොගයෙහි පිරිවැය ගණනයේ දී පළමු ලැබීම් පළමු නිකුතු FIFO ක්‍රමය යොදා ගනී.

1.7 ආයෝජන

ස්ථාවර තැන්පතු එම බැංකුවලම නැවත ආයෝජනය කර ඇත.

1.8 වගකීම් හා වෙන් කිරීම්

1.8.1 පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත.

2021 වර්ෂයේ පාරිතෝෂික ගෙවීම මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන සකස් කර ඇත.

1.8.2 අසම්භාව්‍ය බැරකම්

තීන්දු ලැබීමට නියමිත නඩු සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන් කර ඇත.

1.8.3 අසම්භාව්‍ය වත්කම්

ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් අයකර ගැනීම සඳහා තීන්දු ලැබීමට නියමිත නඩු මත අසම්භාව්‍ය වත්කම් අගය සැකසී ඇත. එම තොරතුරු පහත පරිදි වේ.

පී.ඩී.ජේ ආනන්ද මහතා

පදිංචි ලිපිනය සොයාගැනීමට නොහැකි වීම මත මෙම නඩුන බහාතබා ඇත. එසේ වුවත්, රු.1,250,000/-ක මුදලක් ඇපකරුවන්ගෙන් මේ වන විට අයකරගෙන ඇත. රු. *2,759,754.28* ක ශේෂය පී.ඩී.ජේ ආනන්ද මහතාගෙන් අයකර ගත යුතුව ඇත.

එම්.එස් ගෞරි ශංකර් මහතා

එන්තරවාසි යැවීම සඳහා ඔහුගේ ලිපිනය සොයා ගත නොහැකි වී ඇත. කෙසේ නමුත් ඇපකරුවන් මේ වනවිට රු. *1,250,000.00* ක් ගෙවා ඇත. රු. *3,634,110.07*ක ශේෂය එම්.එස් ගෞරි ශංකර් මහතාගෙන් අයකර ගත යුතුව ඇත.

ආචාර්ය ගාමිණි වික්‍රමසිංහ මහතා

ඔහු දෙවරක් අභියාචනා ඉදිරිපත් කර ඇත. නමුත් ආයතනයට වාසිදායක ලෙස නඩු තීන්දු ඉදිරිපත් කර තිබේ. රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත. පිස්කල් ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. ඔහු *2021* දී රුපියල් *140,000.00* ක් තැන්පත් කර ඇති නමුත් මෙම තැන්පතුව හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් අනවසර තැන්පතුවක් ලෙස සඳහන් කර ඇත.

ආර්.අතුකෝරල මිය

ආර්. අතුකෝරල මහත්මියගේ ඇප බැඳුම්කරයේ වටිනාකම රු2,181,521/-ක් වේ. ඇපකරුවන් විසින් රු. 1,250,000/- මේ වන විට ගෙවා ඇත. ඇයගෙන් අයකර ගැනීමට පවතින ශේෂය රු.931,521/- ක් වන අතර එය අයකර ගැනීමට නොහැකි වී ඇත. ඇයට එන්තරවාසි යැවීම සඳහා ලිපිනය සොයාගැනීමට නොහැකි වී ඇත.

පී.ඩී.ආර් කුමාරසිරි මහතා

පී.ඩී.ආර්.කුමාරසිරි මහතාගේ බැඳුම්කරයේ වටිනාකම රු. *499,302.00*ක් වේ. ඇපකරුවන්ගෙන් රු. *166,436.00*ක් අය කර ගෙන තිබේ. අධිකරණය විසින් අනෙක් ඇපකරුවන් දෙදෙනාගෙන් *332,866.98* ක මුදලක් අය කර ගන්නා ලෙස තීන්දු කර තිබේ. කෙසේ වෙතත්, එක් ඇපකරුවෙකුගේ ලිපිනය සොයා ගත නොහැක.

ඒ.සී.කේ සේපාල මිය

ඒ.සී.කේ සේපාල මහත්මියගේ ඇප බැඳුම්කර වටිනාකම රු. *1,249,641.11*ක් වේ. උසාවියේ තීන්දුව අනුව රු. *1,200,000* ක් ඇයගෙන් අයවිය යුතුය. ඇය රු. මේ දක්වා *900,000.00*/- ගෙවා ඇත.

1.8.4 අනිවාර්ය දායකත්ව සැලසුම

සේවකයින්ගේ මාසික වැටුපෙන් පිළිවෙළින් 15% සහ 3% බැගින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියක්තිකයින්ගේ භාර අරමුදලට ආයතනය විසින් දායකත්වය දරනු ලබයි. මෙම දායකත්වයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති වක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

1.9 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධනය පහත ගැළපීම් සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

a. බොල් හා අඩමාන ණය සහ වෙන් කිරීම් සිදු කිරීම සහ ආයතනයේ එදිනෙදා මෙහෙයුම් වෙනුවෙන් වන අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර තිබේ. ආයතනයේ දේපොළ, පිරියත සහ උපකරණ ඵලදායී ලෙස නඩත්තු කෙරෙයි.

b. ආදායම් යන්නට ඇතුළත් වන්නේ රජයේ භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්, නේවාසිකාගාර ආදායම්, ශ්‍රවණාගාර ආදායම් සහ අනෙකුත් ආදායම්ය.

2.0 ප්‍රවාහන හා මුද්‍රණ වියදම්

පර්යේෂණ හා පුහුණු අංශ ද ඇතුළුව සියලුම අංශ සඳහා ප්‍රවාහන හා මුද්‍රණ වියදම් ගිණුම්ගත කිරීමට සිදු වේ. එබැවින් එම වියදම් අනුමත අනුපාතයකට ගණනය කොටඑම වියදම එකී අදාළ වියදම් අතර ප්‍රතිශතයකට ගළපා ඇත.

2.1 පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාග්ධන ලැබීම.

පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ ලබා දී ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 (LKAS - 38) අනුව පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය හැකිය. නමුත් අප ආයතනයේ පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය නොහැකිය. මන්ද යත් අප ආයතනයේ පර්යේෂණවල අවසාන නිමැවුම ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ නොකරන බැවිනි. එම නිසා මෙම පර්යේෂණ හා පුහුණු මුළු පිරිවැය මූල්‍ය තත්ත්ව වාර්තාව හර කරමින් එම වියදම පුනරාවර්තන වියදමක් ලෙස සලකනු ලබයි. මෙම ක්‍රියාකාරකම් සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ද මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි ආදායමක් ලෙස සටහන් කර මෙම වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය වර්ෂය තුළ අපේ පර්යේෂණ හා පුහුණු කටයුතු කෙරෙහි බලපෑම් කර තිබුණි.

රුපියල්

2 මුදල් හා මුදල් සමාන අයිතමයන්	2,021	2,020
අතැති මුදල්	67,644	20,000
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323292	6,192,464	8,200,359
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323293	2,150,947	1,045,857
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323315	1,482,074	197,345
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323317	4,091,429	279,918
	13,984,557	**9,743,479**

3 ලැබිය යුතු මුදල්

කාර්යමණ්ඩල ණයගැතියෝ		
නිවාස ණය	225,368	281,913
ඒකාබද්ධ ණය	21,670,224	23,020,739
උත්සව අත්තිකාරම්	3,750	5,425
ලැබිය යුතු ශ්‍රවණාගාර ආදායම්	236,750	13,375
ලැබිය යුතු නේවාසිකාගාර ආදායම්	4,993,645	5,114
ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ	12,859,881	12,874,881
වැටුප් අත්තිකාරම්	-	-
විශේෂ අත්තිකාරම් (පොත්)	-	21,600
	39,989,618	**36,223,047**
වෙනත් ණයගැතියෝ		
ලැබිය යුතු ආයෝජන ආදායම්	26,953	32,041
ඩී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මහත්මියගෙන් අයවිය යුතු	-	-
ඉවත් වූ සේවකයන්ගෙන් අය කර ගත යුතු	549,384	633,882
වෛද්‍ය රක්ෂණයෙන් අයකර ගත යුතු	500	200
ණයගැති - මොබිටෙල් (පුද්) ආයතනය	334,818	334,818
G-97- දේශගුණික සුහුරු බෝග සහ යාන්ත්‍රීකරණ පරිමාණ		-
ඩිජි හවුස් වෙතින් අයවිය යුතු		-
මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්) සමාගම වෙතින් අයකරගත යුතු	70	70
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු	44,800	44,800
R-481 යාපනය කලපුවෙන් සපයන පරිසර පද්ධති සේවාවන්හි වටිනාකම පිළිබඳ	-	111,922
රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු	32,398	39,866
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	1,962,546	962,546
R-540 එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීම' ප්‍රවේශය (Save and Grow Approach)ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම් ගොඩ නැගීම	-	-
තිරසර හා දේශගුනික විපර්යාස ප්‍රතිරෝධක ක්‍රමෝපායන් වගා පද්ධතීන්ට අන්තර්ගත කිරීම පිළිබඳ කලාපීය උපාය මාර්ග හදුන්වාදීමේ ව්‍යාපෘතිය (සම්පත් සුරක්ෂිතව වගා කිරීම)	900,475	-
සැපයුම්කරුවන් ලියාපදිංචියෙන් ලැබිය යුතු	63,000	
	3,914,943	**2,160,144**
	43,904,561	**38,383,192**
අඩු කළා		
බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(667,830)	(667,830)
ශිෂ්‍යත්වලාභීන් සඳහා වෙන් කිරීම	(8,926,363)	(8,923,613)
	34,310,368	**28,791,749**

4 ලැබිය යුතු

තැන්පතු		
ස්ථාවර තැන්පතු - භෝජනාගාර භාරකරු	70,000	70,000
විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්)	3,125	3,125
විවිධ- තැපැල්පති	24,945	24,945
විවිධ- කොළඹ ගෑස් සහ ජල සමාගම	4,750	4,750
විවිධ- ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	500	500
විවිධ-සී/ස සෙල්ටෙල් ලංකා සමාගම	3,500	3,500
විවිධ- ලංකා විදුලිබල මණ්ඩලය	406,250	406,250
විවිධ- ඉන්ධන තැන්පතු	100,000	100,000
	613,070	**613,070**

රුපියල්

5 තොගය	2,021	2,020
ප්‍රකාශන සහ සඟරා	2,881,249	2,801,649
පරිභෝජන භාණ්ඩ	2,454,882	1,444,486
පොත් අලෙවිසැල	1,204,382	1,109,697
	6,540,513	**5,355,832**

6 පූර්ව ගෙවීම්

සේවා ගිවිසුම -ෆොටෝකොපි	-	-
ගොඩනැගිලි රක්ෂණය	-	23,780
	-	**23,780**

7 අනෙකුත් ජංගම වත්කම්

මිල දී ගැනීම් අත්තිකාරම්	536,918	144,809
අත්තිකාරම්	7,850	-
	544,768	**144,809**

8 අනෙකුත් මූල්‍ය වත්කම්

ඇමතුම් තැන්පතු	1,500	1,500
ස්ථාවර තැන්පතු- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	1,500,000	1,500,000
ස්ථාවර තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ණය යෝජනා ක්‍රම	2,792,783	2,623,953
	4,294,283	**4,125,453**

9 ගොඩනැගිලි, පිරියක හා උපකරණ

වත්කම් ක්ෂයවීම් පිළිබඳ ප්‍රකාශය - 2021 දෙසැම්බර් 31

රුපියල්

අයිතම	01.01.2021 දිනට පිරිවැය රු.	2021 වර්ෂය තුළ මිල දී ගැනීම් අපහරණය	31.12.2021 දිනට සමස්ත පිරිවැය	2021.01.01 දිනට සමුච්චිත ක්ෂය	2021 වර්ෂයට සමුච්චිත ක්ෂය	31.12.2021 න් අවසන් දිනට සමුච්චිත ක්ෂය	31.12.2021 දිනට ශුද්ධ වටිනාකම
උපකරණ/ ලී බඩු	61,194,426	196,038	61,390,465	48,493,297	2,628,450	51,121,748	10,268,717
පරිගණක සවිකිරීම්	33,989,353	60,840	34,050,193	30,380,781	832,308	31,213,089	2,837,104
මෝටර් රථවාහන	71,888,647	-	71,888,647	71,315,527	268,816	71,584,344	304,303
පොත්	15,994,800	3,993	15,998,793	13,813,674	532,966	14,346,641	1,652,152
සුඛ සාධන උපකරණ	3,735	-	3,735	3,734	-	3,734	1
එකතුව	**183,070,961**	**260,871**	**183,070,961**	**164,007,013**	**4,262,541**	**168,269,555**	**15,062,278**

10 ඉඩම් හා ගොඩනැගිලි

වත්කම් ක්ෂයවීම් පිළිබඳ ප්‍රකාශය - 2021 දෙසැම්බර් 31

අයිතම	01.01.2021 දිනට පිරිවැය රු.	2021 වර්ෂය තුළ මිල දී ගැනීම් අපහරණය	31.12.2021 දිනට සමස්ත පිරිවැය	2021.01.01 දිනට සමුච්චිත ක්ෂය	2021 වර්ෂයට සමුච්චිත ක්ෂය	31.12.2021 න් අවසන් දිනට සමුච්චිත ක්ෂය	31.12.2021 දිනට ශුද්ධ වටිනාකම
ඉඩම්	1,857,387	-	1,857,387	-	-		1,857,387
ගොඩනැගිලි	56,330,265	-	56,330,265	21,405,066	1,303,145	22,708,211	33,622,054
	58,187,652	**-**	**58,187,652**	**21,405,066**	**1,303,145**	**22,708,211**	**35,479,441**

LKR

	ණයහිමියෝ	2,021	2,020
11	උපචිත වියදම්	8,329,123	9,281,062
	ගෙවිය යුතු පර්යේෂණ හා පුහුණු වියදම්	1,464,268	470,300
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	124,462	139,462
	ආපසු ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු- උපනිස්ස පරණමාන	50,000	50,000
	වැටුප් අත්තිකාරම්	-	-
	නොගෙවූ වියදම්	26,333	188,930
	ඉවත් වූ සේවකයන් සඳහා ගෙවිය යුතු මුදල්	841,520	189,151
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	14,600	13,550
	රඳවාගත් මුදල	136,526	136,526
	ණයහිමියෝ	825,452	601,748
	සුබසාධක සංගමය	2	11,890
	ගෙවිය යුතු පාරිතෝෂික මුදල්	126,913	126,913
	අමාත්‍යාංශයට ගෙවිය යුතු	94,358	94,358
	Management Development Book	8,000	8,000
	විශේෂ අත්තිකාරම්		
	දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙවිය යුතු	1,000,000	-
	නාරායනසාමි මහතාට ගෙවිය යුතු	10,800	10,800
	කලින් ලද නේවාසිකාගාර හා ශ්‍රවණාගාර ආදායම්	-	26,769
	Funded Project Payable	-	13,712
	Unauthorized Deposit	140,000	-
	ව්‍යාපෘති ණයහිමියෝ		
	කඩිනම් ආහාර සුරක්ෂිතතාවය සහ අවශ්‍යතා ඇගයුම	7,774	7,774
	R-512 ගෝලීය විචලතා හා නිරසාරබව පිළිබඳ කෘෂිකාර්මික පර්යේෂණ තාක්ෂණික නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය	22,831	22,831
	R-530 ශ්‍රී ලංකාවේ තේරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි බෝග සඳහා අගය දාමය ශක්තිමත් කිරීම සඳහා වූ පාදක අධ්‍යයනය	2,518,787	2,518,787
	R-535 මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත්වන ආන්තික ගොවිජනාව මුහුණ දෙන දේශගුණික විපර්යාසමය බලපෑම්වලට විසඳුම් සෙවීම	440,981	440,981
	සේවා ගිවිසුම 03-2017	245,902	245,902
	R-559 ශ්‍රී ලංකාවේ විවිධ බෝග සඳහා බිංදු ජල සම්පාදනය භාවිතා කිරීමේ බලශක්ති /ජල පාදක තක්සේරුව	648,588	695,063
	R-561 අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවල බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම	-	89,595
	සේවා ගිවිසුම 01-2019	783,850	527,500
	සේවා ගිවිසුම 01-2020	488,404	488,404
	R-540 එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීමේ ප්‍රවේශය ("Save and Grow") ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම ගොඩනැගීම	700,000	807,072
	CR582ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අවදානම් ගොවි කණ්ඩායම්වල දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය සඳහා ගොවිතැන් ක්‍රම පිළිබඳ අධ්‍යයනය	416,370	-
	T-442කෘෂි නිෂ්පාදන හා සම්බන්ධ අලෙවි තොරතුරු - බදුල්ල	27,881	-
	T-444 කෘෂි නිෂ්පාදන හා සම්බන්ධ අලෙවි තොරතුරු - මොණරාගල	58,109	-
	T-450 කෘෂි ව්‍යාපාර කළමනාකරණය සඳහා අලෙවි තොරතුරු භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන- නුවරඑළිය	58,219	-
	T-451 කෘෂි ව්‍යාපාර කළමනාකරණය සඳහා අලෙවි තොරතුරු භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන- මාතලේ	71,600	-
		19,681,654	**17,207,081**

	සේවක ප්‍රතිලාභ		
12	ජනවාරි 01 දිනට ශේෂය	67,426,150	57,562,753
	වර්ෂය තුළ ගෙවීම්	11,338,693	1,048,835
	වර්ෂය සඳහා වෙන් කිරීම්	5,108,663	10,912,233
	දෙසැම්බර් 31දිනට ශේෂය	**61,196,120**	**67,426,150**
	රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන		
13	ජනවාරි 01 දිනට ශේෂය	39,140,540	44,971,155
	වර්ෂය තුළ ප්‍රාග්ධන දායකත්වය	8,700,000	500,000
	පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	(7,692,746)	(500,000)
	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(5,565,686)	(5,830,615)
	දෙසැම්බර් 31දිනට ශේෂය	**34,582,108**	**39,140,540**
	සංචිත		
14	ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල	-	-
	ප්‍රාග්ධන සංචිත	1,675,000	1,675,000
	දීමනා අරමුදල - ආයතනික කොටස	1,701,907	1,701,907
		3,376,907	**3,376,907**
	දීමනා සහ පුහුණු අරමුදල		
15	දීමනා අරමුදල ව්‍යාපෘති - 10%	8,611	8,611
		8,611	**8,611**

LKR

	සමුච්චිත උපහාරය	2,021	2,020
16	ජනවාරි 01දිනට ශේෂය	(22,541,035)	(5,259,243)
	පෙර වර්ෂ ගැලපීම් - මාරුකළා	-	(135,675)
	පෙර වර්ෂ ගැලපීම් - වර්ෂය සඳහා	2,364,861	(944,921)
	දෙසැම්බර් 31දිනට ආදායම ඉක්ම වූ වියදම	12,133,601	(16,201,196)
	දෙසැම්බර් 31දිනට ශේෂය	**(8,042,573)**	**(22,541,035)**

අනෙකුත් ආදායම්

17	නේවාසිකාගාර ගාස්තු	7,025,500	4,779,071
	සම්මන්ත්‍රණශාලා ගාස්තු	2,847,375	6,015,100
	ආදායම්-මොබිටෙල් පාරිභෝගික සේවාවන්	-	84,815
	ප්‍රකාශන විකිණීමෙන් ලද ආදායම්	9,455	21,095
	ආයෝජන පොළී	197,001	232,901
	කාර්ය මණ්ඩල ණය පොළී	1,185,791	942,952
	ව්‍යාපෘතිවලින් ලද පුනරාවර්තන දායකත්වය	10,198	129,975
	සංචාරක බංගලා ගාස්තු සහ කාමර කුලී	160,770	99,078
	අවසාන දත්ත පදනමට අනුකූලව ආදායම	45,000	-
	පරිගණක ආදායම	-	308
	මිනිස් බල ආදායම	-	838,872
	අනෙකුත් ආදායම්	54,057	66,156
	විලම්බිත ආදායම	5,565,686	5,830,615
	සැපයුම්කරුවන් ලියාපදිංචිය	115,000	-
	වෙළඳ දැන්වීම් ආදායම්	-	19,450
	පරිපාලන වියදම්	295,677	-
	ප්‍රශ්නාවලිය සංස්කරණය දත්ත විශ්ලේෂණය කිරීමේ ආදායම්	-	240,000
	වාර්තා ලිවීම් (අතුරු, දත්ත සහ අවසාන වාර්තාව) ආදායම්	-	450,000
	සහල් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග අංශ පිළිබඳ පසුබිම් ද්‍රව්‍ය සම්පාදනය කර සවිස්තර පසුබිම් ලේඛනයක් කෙටුම්පත් කිරීමෙන් ලද ආදායම්	-	50,000
	ආර්ථික විද්‍යාත්මක විශ්ලේෂණය සහ අර්ථ නිරූපණ සඳහා ආදායම්	-	48,000
	අබලි ද්‍රව්‍ය විකිණීම්	27,062	12,050
	ටෙන්ඩර් ගාස්තු	29,000	3,000
	ගොවිමිණ ප්‍රකාශනය	404,975	-
	වාර්තා සංස්කරණය කිරීමේ ආදායම්	-	-
		17,972,548	**19,863,438**

වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ

18	වැටුප්- ස්ථිර කාර්ය මණ්ඩලය	90,557,851	92,684,649
	වැටුප්- අනියම් විමර්ෂක	10,172,250	8,328,830
	ජීවන වියදම් දීමනාව, විශේෂ දීමනාව හා වෙනත් දීමනා	24,476,651	24,739,048
	සේවක අර්ථ සාධක අරමුදල	17,408,158	17,513,688
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	3,481,631	3,502,737
	අතිකාල දීමනා	2,122,936	2,399,683
	පාරිතෝෂික	5,108,663	10,912,233
		153,328,140	**160,080,868**

රුපියල්

		2,021	2,020
	අනෙකුත් වියදම්		
19	ගමන් වියදම් හා යැපීම් දීමනා	1,838,279	972,663
	විදේශීය ගමන් වියදම්	-	-
	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	677,334	807,232
	ඉන්ධන සහ ලිහිසි තෙල්	995,163	424,812
	නිල ඇඳුම්	252,979	163,108
	වාහන අලුත් වැඩියා	1,009,564	725,811
	ගොඩනැගිලි නඩත්තු කටයුතු	640,799	280,963
	යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා	1,806,626	1,095,475
	දුරකථන ගාස්තු	2,354,974	3,795,191
	විදුලිය	2,687,894	3,145,444
	ජල බිල්පත්	1,056,647	495,343
	බදු සහ වරිපනම්	579,456	579,456
	තැපැල් ගාස්තු	116,830	250,100
	ප්‍රවාහන	316,865	347,940
	වාහන සඳහා කාර්මික උපදෙස්	15,000	60,000
	ඉදිකිරීම් සඳහා කාර්මික උපදෙස්	15,000	30,000
	පුවත්පත්	98,570	125,080
	බලපත්‍ර සහ රක්ෂණය	872,607	802,104
	ආරක්ෂක ගාස්තු	5,320,620	5,053,160
	පිරිසිදු කිරීමේ ගාස්තු	919,765	726,644
	රෙදි සේදීම	138,655	225,645
	විගණන ගාස්තු	725,250	747,606
	වෛද්‍ය රක්ෂණ	934,000	978,500
	ආපනශාලා ගාස්තු	12,173	75,410
	විවිධ වියදම්- අනෙකුත්	130,685	138,602
	නීති ගාස්තු	-	102,000
	සුඛසාධක	43,029	98,159
	දැන්වීම්	344,331	18,360
	සම්මුඛ පරීක්ෂණ ගාස්තු	16,245	-
	පාලක මණ්ඩලය	469,040	83,015
	මුද්‍රණ හා ප්‍රකාශන	1,528,449	823,769
	විනෝදාත්මක	2,520	
	තොරතුරු බෙදා හැරීම	331,800	395,575
	අලෙවි වියදම් - ප්‍රකාශන	9,015	21,449
	රඳවා ගැනීමේ බදු	-	-
	විගණන හා කළමනාකරණ කමිටු	146,222	60,972
	කාර්ය මණ්ඩල සංවර්ධනය	462,744	444,566
	කාර්යක්ෂමතා කඩඉම් විභාග ගාස්තු	318,808	-
	සේවක වත්දි	-	-
	පරිවර්තන ගාස්තු	117,605	50,290
	උපකරණ සහ අනෙකුත් දෑ මත තාක්ෂණික උපදෙස්	30,000	30,000
	මුද්‍රිත පොත් මත අලාභය	-	-
	තොග ඌනතා	-	-
	අබලි භාණ්ඩ විකිණීම	-	18,420
	දත්ත මිල දී ගැනීම	51,750	-
	අබලි භාණ්ඩ විකිණීම	925,351	-
		28,312,644	**24,192,865**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒආර්අයි/කී/එච්ඒආර්/01/21/04 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජූනි 23 දින

සභාපති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හෙක්ටර් කොබ්බෑකඩුව් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ මූල්‍ය ප්‍රකාශණ වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැඩීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචාවෙන් වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක ආයතනයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(අ)	මු.රෙ. 237 (ආ)	ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ ලැබීමට පෙර සැපයුම්කරුවන් සඳහා රු. 536,917 ක් අත්තිකාරම් වශයෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2019 හා 2020 වර්ෂවලට අදාළ මාර්ගික කාර්යසාධන වාර්තා 01/2020 දරන රාජ්‍ය මුදල් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. චක්‍රලේඛයේ පළමු කොටසේ 15.3.2 (ඊ) ඡේදය

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සමපත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2012 - 2015 කාලපරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පැවති අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. 22,500 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා බැලූනයක් මිලදී ගෙන තිබුණද ඒකකයේ අනෙකුත් ක්‍රියාකාරීත්වයන්ගේ දෝෂ පැවතීම තුළ එම බැලූනය ස්ථාපිත කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ මුළු වියදම රු. 1,053,520 ක් වී තිබුණි. එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රිය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. මේ සම්බන්ධව මු.රෙ. 104 පරීක්ෂණයන් පැවැත්වීමට කමිටුවක් පත්කර තිබුණු අතර එම කමිටු වාර්තාව ලබාදී නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 කගෙන් රු. 12,859,881 ක මුදලක් අයවිය යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයේදී එම ණයගැතියන් 05 කගෙන් කිසිදු මුදලක් අයකර නොතිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට රු. 31,044,679 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ හැර අනෙකුත් ණයගැති ශේෂයෙන් රු. 533,296 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ණය ශේෂය තුළ රු. 498,326 ක මුදලක් සේවකයින්ගෙන් අයවිය යුතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරශ්‍රේණ්‍යාගාර කුලියට දීම වෙනුවෙන් 2015 මැයි සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු. 8,895,470 ක මුදල් ලැබීමගත් අයගෙන් හෝ මේ සඳහා අවසර ලබාදුන් නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

Fin/Aud/Qry/2021 2022-08-01

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1.1 මතය

1.2 මතය සඳහා පදනම

2.

2.2.2 (අ)

මු.රෙ.237

මෙම රු.536,917.00 අත්තිකාරම් මුදල් සපයා ඇත්තේ මිලදී ගැනීම් අත්තිකාරම් ලෙසය. මෙම මිලදී ගැනීම් අත්තිකාරම් වලින් 50%කට අධික මුදලක් රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව සඳහා නිකුත් කල චෙක්පත් වේ. මෙම රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ඇත්තේ පර්යේෂණ වාර්තා පිටකවර මුද්‍රණය කිරීම සඳහා වේ. 2021 වර්ෂය අවසානයේ පර්යේෂණ වාර්තා විශාල ප්‍රමාණයක් එලිදැක්වීමට වාර්තා අවසන් කල බැවින් මෙලෙස අත්තිකාරම් මුදල් ලබා දීමට සිදු විය. අත්තිකාරම් මුදල් ලබාදීමකින් තොරව අදාල සේවාව හෝ භාණ්ඩය නොසපයන සැපයුම්කරුවන් සඳහා පමණක් මෙලෙස මිලදී ගැනීම් අත්තිකාරම් ලබාදීම සිදුකරනු ලබයි.

(ආ) 2019 හා 2020 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

වර්ෂය	ප්‍රගතිය
2019	i. 2022 ජනවාරි 13 දින වාර්ෂික වාර්තාවේ භාෂාත්‍රයෙන් පිටපත් 270 පාර්ලිමේන්තුවේ සභානායක ලේකම් වෙත භාර දෙන ලදී. ii.2022 පෙබරවාරි 22 දින ආංශික සභා රැස්වීම් සඳහා අධ්‍යක්ෂතුමා සහභාගී විය.

2020	i.2020 වාර්ෂික වාර්තාවේ - කෙටුම්පත් (PED 27) නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කිරීම. 2021.03.08 ii.විගණන වාර්තාව (සිංහල) 2021.06.30 දින ආයතනයට ලැබිණි. iii.කෙටුම්පත් වාර්තාවට ලද නිරීක්ෂණ වලට අනුව පරිවර්තන සිදු කිරීම. (2021 ජුනි - නොවැම්බර්) iv.2020 වාර්ෂික වාර්තාව සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබීම . 2021.01.04 v.2020 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යොමු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට යොමු කිරීම. - 2022.03.08

2.2.4 (අ) මෙම ජීව වායු ඒකකය සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණයක් පැවැත්වීම සිදු කරමින් පවතී. මෙම පරීක්ෂණ වාර්තාව ලබා දීමට ප්‍රමාද වූයේ එහි සාමාජිකයින් විශ්‍රාම යාම, අමාත්‍යාංශයේ නිලධාරීන් ස්ථාන මාරු ලැබීම වැනි හේතු මත නව නිලධාරීන් මේ සඳහා පත් කිරීමට සිදු විය. මෙම කමිටුව අවසන් වාර්තාව මේ වනවිට අධ්‍යක්ෂකතුමාට භාරදී ඇති අතර මෙම වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරමි.

2.3

(අ) 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 දෙනෙකුගේ රු.12,859,881.00 ක මුදලක් අයවිය යුතුව පැවති තත්වයකදී 2021 වර්ෂයේ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත පැහැදිලි කිරීම ඉදිරිපත් කරමි.
උක්ත ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 දෙනාගෙන් 05 දෙනෙකුගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා ණය අයකර ගැනීමේ ඉදිරි පියවර ගැනීමට නොහැකි වී ඇත.

01. ආර්. අතුකෝරල
02. පී.ඩී.ආනන්ද
03. ගෞරි ශංකර්

} නඩුවේ ඉදිරි කටයුතු කරගෙන යාමට නොහැකි වී ඇත.

04. ජී.ඩී.ආර්.කුමාරිසිරි - ඇපකරුවන් වෙත නඩු තීන්දුව ලබා දීමට වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වී ඇත.

05. ඒ.සී.කේ.සේපාල - 2013 වර්ෂයේ සමථයට පත්වීමෙන් පසු රු.900,000.00 මුදල 2020 වර්ෂය වන විට ගෙවා ඇති අතර ඉතිරි මුදල වූ රු.300,000.00 ලබා ගැනීමට නැවත සිහිකැඳවීමක් 2021 විද්‍යුත් ලිපිනය හරහා සිදු කලද ප්‍රතිචාර නොමැත.

06. ආචාර්ය ගාමිණි වික්‍රමසිංහ -
ආචාර්ය ගාමිණි වික්‍රමසිංහ මහතාගේ 2011.11.23 ලබා දුන් නඩු තීන්දුව අනුව නඩු ගාස්තු සහ නෛතික පොලිය ඇතුලත් කර සකස කරන ලද ගාස්තු බිල්පත රු.14,620,132.76) 2020.07.10 දින තීන්දු ප්‍රකාශය 2021.03.26 දිනෙන් අධිකරණයට ගොනු කර ඇති අතර එය විධිමත් බව 2021.11.10 දිනැති කාර්ය සටහන මඟින් දන්වා ඇති බව නීතිපති විසින් දන්වා ඇත. ඒ අනුව පිස්කල් මඟින් තීන්දු ප්‍රකාශ

නොතිසි විත්තිකරුවන් වෙත යැවීම සඳහා අවශ්‍ය ලේඛන 2022.01.05 දින අධිකරණයේ ගොණු කර ඇති බව වැඩිදුරටත් දන්වා තිබිණි. ඒ අනුව පිස්කල් වාර්තා 2022.04.19 අධිකරණයේ කැඳවිය. නමුදු නඩු ගොනුව අධිකරණ ශාලාවට ලබා දී නොතිබීම නිසා නීති නිලධාරි විසින් අප දැනුවත් කරන ලද්දේ නඩුවේ පිස්කල් කැඳවීම සඳහා නැවත දිනයක් ලබා දෙන බවයි.
ආචාර්ය ගාමිණි වික්‍රමසිංහ මහතා ආයතනය වෙත මේ වන විට රු.580,000.00 වරින් වර ආයතනයේ ගිණුමට බැර කර ඇත. නඩුව සමථයට පත් නොවීම මත ආයතනය මුදල් ලබා ගැනීම ප්‍රතික්ෂේප කර තිබූ තත්ත්වයකදී 2021 වර්ෂය තුල පමණක් ආචාර්ය ගාමිණි වික්‍රමසිංහ මහතා මෙලෙස ලබා දුන් රු.140,000.00 මුදලක් ණයගැතියන්ගෙන් 2021 ලැබුණු මුදලක් වශයෙන් ගිණුම්ගත වී ඇත.

(ආ) මෙම සේවයේන් ඉවත්වූ නිලධාරින්ගේන් අයවියයුතු මුදල අයකර ගැනීමට සිහි කැඳවීම් අදාල සේවකයින් හට යවා ඇත. නමුත් ඊට ප්‍රතිචාර දක්වා නොමැති අතර මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගෙන ඇත. 2022/06/06 දින නීතිපති උපදෙස් සඳහා ආයතනයේ නිලධාරින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් කැඳවා උපදෙස් ලබාදි ඇත. මෙම නීතිපති උපදෙස් මත ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.මොබිටෙල් ප්‍රයිවට් ලිමිටඩ් විසින් ගෙවිය යුතු මුදල කඩිනම්න් අයකර ගැනීමට කටයුතු කරමි.

(ඇ) අදාල අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇතත් මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. එම මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූල පියවර ගැනීමට තරම් ලියවිලි , සටහන් හා අනෙකුත් කරුණු ප්‍රමාණවත් නොමැත.

මාලින්ද සෙනවිරත්න
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

පිටපත් : ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැ.ස.